අපිස්සු නං මාරිස අමනුස්සා, සත්තධාපිස්ස මුද්ධං ඵාලෙය්‍යුං.

සන්ති හි මාරිස අමනුස්සා චණ්ඩා රුද්ද රහසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ බො තෙ මාරිස අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ බො තෙ මාරිස මහාචොරා රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.

එවමෙව බො මාරිස සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්දා රහසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ බො තෙ මාරිස අමනුස්සා. මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති,

යො හි කොචි මාරිස අමනුස්සො: යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛ පොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛ පචාරො වා,

ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ පොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා,

කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා,

නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා,

පදුට්ඨචිත්තො: භික්ඛුං වා භික්ඛුණිං වා, උපාසකං වා උපාසිකං වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය,

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං:

අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතීති.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං

ඉන්දෙ සොමො වරුණො ච - භාරද්වාජො පජාපතී
චන්දනො කාමසෙට්ඨො ච - කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච.
පණාදෙ ඔපමඤ්ඤො ච - දෙවසූතො ච මාතලී
චිත්තසෙනො ච ගන්ධබ්බො - නලො රාජා ජනෙසභො.
සාතාගිරො හෙමවතො - පුණ්ණකො කරතියො ගුළො
සිවකො මුචලින්දෙ ච - වෙස්සාමිත්තො යුගන්ධරො
ගොපාලො සුප්පගෙධො ච - හිරිනෙත්ති ච මන්දියො
පඤ්චාලචණ්ඩො ආළවකො-පජ්ජුන්නො සුමනො
සුමුඛො දධිමුඛො
මණි මාණී චරො දීඝො - අථො සෙරිස්සකො සහ

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං

විරවිතබ්බං: අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී ති.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායාති.

හන්ද ච දානි මයං මාරිස ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථාති.

අථ ඛො චත්තාරො මහාරාජා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

තෙපි ඛො යක්ඛා උට්ඨායාසනා, අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා, තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූති.

තතියභාණවාරං.

# 29-ii. ආටානාටිය සුත්තං

## (දුතියක භාණවාරං)

නමො තසස භගවතො අරහතො සමමා සමබුද්ධසස.

අථ ඛො භගවා තසසා රත්තියා අච්චයෙන භිකඛු ආමනෙතසි. ඉමං භිකඛවෙ රත්තිං චත්තාරො මහාරාජා, මහතියා ච යකඛ සෙනාය, මහතියා ච ගනධබ්බසෙනාය, මහතියා ච කුමභණ්ඩසෙනාය, මහතියා ච නාගසෙනාය, චතුද්දිසං රකඛං ඨපෙතවා, චතුද්දිසං ගුමබං ඨපෙතවා, චතුද්දිසං ඔවරණං ඨපෙතවා, අභිකකනතාය රත්තියා අභිකකනතවණ්ණා, කෙවලකපපං ගිජඣකූටං ඔභාසෙතවා යෙනාහං තෙනුපසඞකමිංසු උපසඞකමිතවා මං අභිවාදෙතවා එකමනතං නිසීදිංසු.

තෙපි ඛො භිකඛවෙ යකඛා, අපෙපකචෙච මං අභිවාදෙතවා එකමනතං නිසීදිංසු, අපෙපකචෙච මයා සද්ධිං සමෙමාදිංසු, සමෙමාදනීයං කථං සාරාණීයං වීතිසාරෙතවා එකමනතං නිසීදිංසු. අපෙපකචෙචයෙනාහං තෙනඤජලිං පණාමෙතවා එකමනතං නිසීදිංසු. අපෙපකචෙච නාමගොත්තං සාවෙතවා එකමනතං නිසීදිංසු, අපෙපකචෙච තුණ්හීභූතා එකමනතං නිසීදිංසු. එකමනතං නිසිනෙනා ඛො භිකඛවෙ වෙසසවණො මහාරාජා මං එතදවොච:

සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා,

යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පසන්නා යෙව භගවතො, තං කිස්ස හෙතු? භගවා හි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාද වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති.

යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාදා අප්පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, තෙසං තං හොති අප්පියං අමනාපං.

සන්ති හි භන්තෙ භගවතො සාවකා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි, පටිසල්ලානසාරුප්පානි. තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො. යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා තෙසං පසාදාය:

උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති.

අධිවාසෙසිං ඛො අහං භික්ඛවෙ තුණ්හීභාවෙන. අථ ඛො භික්ඛවේ වෙස්සවණො මහාරාජා මං අධිවාසනං විදිත්වා තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි:

විපස්සිස්ස නමත්ථු - චක්ඛුමන්තස්ස සිරීමතො
සිඛිස්සපි නමත්ථු - සබ්බභූතානුකම්පිනො.
වෙස්සභුස්ස නමත්ථු - න්හාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස - මාරසෙනා පමද්දිනො.
කොණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධි.
අඞ්ගීරසස්ස නමත්ථු - සක්‍යපුත්තස්ස සිරීමතො
යො ඉමං ධම්මමදෙසෙසි - සබ්බදුක්ඛාපනූදනං.
යෙ චාපි නිබ්බුතා ලොකෙ - යථාභූතං විපස්සිසුං.
තෙ ජනා අපිසුණා - මහන්තා වීතසාරද.
හිතං දෙවමනුස්සානං - යං නමස්සන්ති ගොතමං
විජ්ජාචරණසම්පන්නං - මහන්තං වීතසාරදං.
යතො උග්ගච්ඡති සූරියො - ආදිච්චො මණ්ඩලී මහා
යස්ස චුග්ගච්ඡමානස්ස - සංවරීපි නිරුජ්ඣති.
යස්ස චුග්ගතෙ සූරියෙ - දිවසොති පවුච්චති.
රහදෙපි තත්ථ ගම්භීරො - සමුද්දෙ සරිතොදකො.
එවං නං තත්ථ ජානන්ති - සමුද්දෙ සරිතොදකො.
ඉතො සා පුරිමා දිසා - ඉති නං ආචික්ඛතී ජනො
යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සි සො.

ගන්ධබ්බානං ආධිපති - ධතරට්ඨො ඉති නාමසො
රමති නච්චගීතෙහි - ගන්ධබ්බෙහි පුරක්ඛතො
පුත්තාපි තස්ස බහවො - එකනාමාති මෙ සුතං
අසීතිං දස එකො ච - ඉන්දනාමා මහබ්බලා
තෙ චාපි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති - මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම.
කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති සුතං
නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ: ජිනං
වන්දථ ගොතමං, ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං.
යෙන පෙතා පවුච්චන්ති - පිසුණා පිට්ඨිමංසිකා
පාණාතිපාතිනො ලුද්දා - චොරා නෙකතිකා ජනා
ඉතො සා දක්ඛිණා දිසා - ඉති නං ආචික්ඛති
ජනො, යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සිසො
කුම්භණ්ඩානං ආධිපති - විරූළ්හො ඉති නාමසො
රමති නච්චගීතෙහි - කුම්භණ්ඩෙහි පුරක්ඛතො
පුත්තාපි තස්ස බහවො - එකනාමාති මෙ සුතං
අසීතිං දස එකො ච - ඉන්දනාමා මහබ්බලා
තෙ චාපි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති - මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම.
කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති සුතං
නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං

වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං.
යත්ථ චොග්ගච්ඡති සුරියො ආදිච්චො මණ්ඩලී මහා
යස්ස චොග්ගච්ඡමානස්ස දිවසොපි නිරුජ්ඣති.
යස්ස චොග්ගතෙ සුරියෙ - සංවරීති පවුච්චති
රහදෙපි තත්ථ ගම්භීරො - සමුද්දො සරිතොදකො.
එවං තං තත්ථ ජානන්ති - සමුද්දො සරිතොදකො
ඉතො සා පච්ඡිමා දිසා - ඉති නං ආචික්ඛතී ජනො.
යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සි සො.
නාගානං ආධිපති විරූපක්ඛො ඉති නාමසො
රමතී නච්චගීතෙහි - නාගෙහි පුරක්ඛතො.
පුත්තාපි තස්ස බහවො - එකනාමාති මෙ සුතං
අසීතිං දස එකොච - ඉන්දනාමා මහබ්බලා.
තෙ චාපි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති - මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම.
කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති සුතං
නෙතං අභිණ්හසො. තස්මා එවං වදෙමසෙ ජිනං
වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං
යෙන උත්තරකුරුරම්මා - මහානෙරු සුදස්සනො
මනුස්සා තත්ථ ජායන්ති - අමමා අපරිග්ගහා
න තෙ බීජං පවපන්ති - නපි නීයන්ති නඞ්ගලා
අකට්ඨපාකිමං සාලිං - පරිභුඤ්ජන්ති මානුසා

අකණං අථුසං සුද්ධං - සුගන්ධං තණ්ඩුලප්ඵලං
තුණ්ඩිකීරෙ පචිත්වාන - තතො භුඤ්ජන්ති භොජනං.
ගාවිං එකඛුරං කත්වා - අනුයන්ති දිසොදිසං
පසුං එකඛුරං කත්වා - අනුයන්ති දිසොදිසං.
ඉත්ථිවාහනං කත්වා - අනුයන්ති දිසොදිසං
පුරිසවාහනං කත්වා - අනුයන්ති දිසොදිසං.
කුමාරිවාහනං කත්වා - අනුයන්ති දිසොදිසං
කුමාරවාහනං කත්වා - අනුයන්ති දිසොදිසං.
තෙ යානෙ අභිරුහිත්වා සබ්බාදිසා අනුපරියන්ති
පචාරා තස්ස රාජිනො.
හත්ථියානං අස්සයානං - දිබ්බං යානං උපට්ඨිතං
පාසාද සිවිකා චෙව - මහාරාජස්ස යසස්සිනො

තස්ස ච නගරා අහු - අන්තලික්ඛෙ සුමාපිතා.
ආටානාටා කුසිනාටා - පරකුසිනාටා නාටපුරියා
පරකුසිතනාටා
උත්තරෙන කපිවන්තො - ජනොසම්පරෙන ච
නවනවුතියො අම්බර අම්බරවතියො - ආලකමන්ද නාම
රාජධානි

කුවෙරස්ස ඛො පන මාරිස මහාරාජස්ස විසාණා නාම රාජධානි, තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණොති පවුච්චති.

පච්චෙසන්තො පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා, ඔජසි තෙජසි තතොජසි සූරො රාජා අරිට්ඨො නෙමි, රහදෙපි තත්ථ ධරණී නාම, යතො මෙඝා

පවස්සන්ති වස්සා යතො පතායන්ති. සභාපි තත්‍ථ භගලවතී නාම යත්‍ථ යක්ඛා පයිරුපාසන්ති.

තත්‍ථ නිච්චඵලා රුක්ඛා - නානාදිජගණායුතා
මයූර කොඤ්චාභිරුද්‍ද - කොකිලාහි හි වග්ගුහි
ජීවංජීවක සද්දෙත්‍ථ - අථො ඔට්ඨවචිත්තකා
කුක්කුත්‍ථකා කුළීරකා - වනෙ පොක්ඛරසාතකා
සුකසාලිකසද්දෙත්‍ථ - දණ්ඩමාණවකානි ච,
සොභති සබ්බකාලං සා - කුවෙරනළිනී සදා.
ඉතො සා උත්තරා දිසා - ඉති නං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සිසො
යක්ඛානං ආධිපති - කුවේරො ඉති නාමසො
රමති නච්චගීතෙහි - යක්ඛෙහි පුරක්ඛතො
පුත්තාපි තස්ස බහවො - එකනාමාති මෙ සුතං
අසීතිං දස එකො ච - ඉන්‍දනාමා මහබ්බලා
තෙ චාපි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති - මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි. අමනුස්සාපි තං වන්‍දන්ති සුතං නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ: ජිනං වන්‍දථ ගොතමං ජිනං වන්‍දම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්‍දම ගොතමන්ති.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායාති.

උපාසකස්ස වා උපාසිකාය වා, අයං ආටානාටියා රක්ඛා සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා, තඤ්චෙ අමනුස්සො;

යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා.

ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ පොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බ පචාරො වා,

කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩ මහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා,

නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා, පදුට්ඨචිත්තො;

ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය,

න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරං වා ගරුකාරං වා.

න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය, ආලකමන්දය රාජධානියා වත්ථුං වා වාසං වා.

න මෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය යක්ඛානං සමිතිං ගන්තුං.

අපිස්සු නං මාරිස අමනුස්සා, අනවයහම්පි නං කරෙය්‍යුං අවිවයහං.

අපිස්සු නං මාරිස අමනුස්සා, අත්තාහිපි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං.

අපිස්සු නං මාරිස අමනුස්සා, රිත්තම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං.

අපිස්සු නං මාරිස අමනුස්සා, සත්තධාපිස්ස මුද්ධං ඵාලෙය්‍යුං.

සන්ති හි මාරිස අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස මහාචොරා රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.

එවමෙව ඛො මාරිස සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති,

යො හි කොචි මාරිස අමනුස්සො: යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛ පොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛ පචාරො වා,

ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ පොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා,

කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා,

නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා,

පදුට්ඨචිත්තො: භික්ඛුං වා භික්ඛුණිං වා, උපාසකං වා උපාසිකං වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං:

අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතීති.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං සෙනාපතීනං මහාසෙනාපතීනං

ඉන්දො සොමො වරුණො ච - භාරද්වාජො පජාපතී
චන්දනො කාමසෙට්ඨො ච - කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච,

පණාදෙ ඔපමඤ්ඤො ච - දෙවසූතො ච මාතලී
චිත්තසෙනො ච ගන්ධබ්බො - නලො රාජා ජනෙසභො.
සාතාගිරො හෙමවතො - පුණ්ණකො කරතියො ගුලො
සිවකො මුචලින්දො ච - වෙස්සාමිත්තො යුගන්ධරො
ගොපාලො සුප්පගෙධො ච - හිරිනෙත්ති ච මන්දියො
පඤ්චාලචණ්ඩො ආලවකො-පජ්ජුන්නො සුමනො
සුමුඛො දධිමුඛො
මණි මාණි චරො දීඝො - අථො සෙරීසකො සහ

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං. සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං: අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී ති.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා. භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායාති.

හන්ද ච දානි මයං මාරිස ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථාති.

අථ ඛො භික්ඛවෙ චත්තාරො මහාරාජා උට්ඨායාසනා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

තෙපි ඛො භික්ඛවෙ යක්ඛා උට්ඨායාසනා, අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු

අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ යෙනා'හං, තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා, තත්ථේව'න්තරධායිංසු.

අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථේව'න්තරධායිංසූති.

උග්ගණ්හාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, පරියාපුණාථ, භික්ඛවෙ ආටානාටියං රක්ඛං, ධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං. අත්ථ සංහිතාය භික්ඛවෙ ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා ති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## චතුත්ථ භාණවාරං නිට්ඨිතං

# සරල සිංහල තේරුම් සහිත

# පිරුවානා පොත් වහන්සේ

ඒ භාග්‍යවත් අර්හත් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා

## 1. සරණාගමනය

බුදුන් සරණ යමි,
දහම් සරණ යමි,
සඟුන් සරණ යමි.

දෙවනුව ද බුදුන් සරණ යමි,
දෙවනුව ද දහම් සරණ යමි,
දෙවනුව ද සඟුන් සරණ යමි.

තෙවනුව ද බුදුන් සරණ යමි,
තෙවනුව ද දහම් සරණ යමි,
තෙවනුව ද සඟුන් සරණ යමි.

## 2. දස සිල්

පණ ඇති සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂා පදය, නුදුන් දෙය සොර සිතින් ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය, පහත් හැසිරීමෙන් (බඹසර නොවිසීමෙන්) වැළකීමේ ශික්ෂාපදය, බොරුකීමෙන් වැළකීමේ ශික්ෂා පදය, රහමෙර පානයෙන් හා මදයට ප්‍රමාදයට හේතුවන දෙයින් වැළකීමේ ශික්ෂා පදය. නොකල්හි බොජුන් ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය, නැටුම් ගැයුම් වැයුම් විසූළු දැකුම් බැලීමෙන් වැළකීමේ ශික්ෂා පදය, මල් ගඳ විලවුන් දැරීමෙන් පැළඳීමෙන් සැරසීමෙන් වැළකීමේ ශික්ෂා පදය, උස් අසුන් මහ අසුන් වලින් වැළකීමේ ශික්ෂා පදය, රන්රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළකීමේ ශික්ෂා පදය,

## 3. සාමණේර ප්‍රශ්නය

එක නම් කිම? සියලු සත්වයෝ ආහාරයෙන් යැපෙන්නෝය. දෙක නම් කිම? නාමය හා රූපය යි. තුන නම් කිම? තුන් වේදනාවෝ යි. සතර නම් කිම? සතර ආර්ය්‍ය සත්‍යයෝ ය. පස නම් කිම? පස් උපාදානස්කන්ධයන. සය නම් කිම? සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ ය. සත නම් කිම? සත් වැදෑරුම් බොජ්ඣංගයෝ ය. අට නම් කිම? අට වැදෑරුම් ආර්ය්‍ය මාර්ගය යි. නවය නම් කිම? නව වැදෑරුම් සත්වාවාසයෝ යි. දසය නම් කිම? දස අංගයකින් යුත් රහතන් වහන්සේ යි.

## 4. දෙතිස් කුණපයෝ

මේ (ශරීර) කයෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් පිඩු, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩුව, හදවත, අක්මාව, දලබුව, බඩදිව, පපුව, බඩවැල, අතුණුබහන්, උදරය, අහරමල, පිත, සෙම, සැරව, ලෙය, ඩහදිය, මේදය, කඳුළු, වුරුණුතෙල්, කෙළ, සොටු, සඳමිදුළු, මුත්‍ර, හිස්මුදුනෙහි මොළය, (යන මේ දෙතිස් කුණපයෝ වෙති.).

## 5. පස් විකුම් (ප්‍රත්‍යවෙක්ෂා)

සිහිනුවණින් පිරික්සා බලා සිවුරු පොරවමි. යම්තාක් සීත නසනු පිණිස, උෂ්ණය නසනු පිණිස, මැසි මදුරු වාත, අව්ව, විසකුරු සතුන් යන මොවුන්ගේ පහස වළකනු පිණිස, ලජ්ජා ස්ථානය ආවරණය කර ගනු පිණිස සිවුරු පොරවමි.

සිහි නුවණින් පිරික්සා බලා පිඬු වළඳමි-(ඒ) ක්‍රීඩා පිණිස නොවේ. පුරුෂ මදය වැඩීමට නොවේ. එය අලංකාරය පිණිස හෝ සැරසිල්ල පිණිස ද නොවේ. යාවත්කාල් මේ ශරීර කයේ පැවැත්ම පිණිස ය, යැපීම පිණිස ය, සාදුකින් වැළකීම පිණිස ය, බඹසර හැසිරීමට අනුග්‍රහයක් පිණිසය. එසේ (ආහාර වැලඳීමෙන්) පරණ දුක් වේදනා නසමි. අලුත් දුක් වේදනාවන් නූපදවන්නෙමි. නිවරද බව ද සුවෙන් විසීම ද සැලසේ ය.

සිහි නුවණින් පිරික්සා බලා සෙනසුන් සේවනය කරමි. යම්තාක් සීත පීඩා නසන පිණිස, උෂ්ණ පීඩා නසන පිණිස, ඩැහැ ලේ බොන, විද ලේ බොන මැසිමදුරු පීඩා, සුළඟ අව්ව, සර්ප යන මොවුන්ගේ ස්පර්ශය නසනු පිණිස, සෘතු උපද්‍රව නසනු පිණිස, සිත එකඟ කිරීමෙහි නියැලෙනු පිණිස (සෙනසුන්) සේවනය කරමි.

සිහි නුවණින් පිරික්සා බලා ගිලන්පස, බෙහෙත් පිරිකර වළඳමි. යම්තාක් උපන්නා වූ සිරුර පෙළන දුක් වේදනාවන් නසනු පිණිස නීරෝගී බව උතුම් සැපත කොට සලකා ගිලන් පස බෙහෙත් පිරිකර වළඳමි. යනුයි.

## 6. දස ධර්ම සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬු සිටාණන්ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි' යි භික්ෂූහු පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "මහණෙනි, පැවිදි වූවනු විසින් නිතර මෙනෙහි කළයුතු කරුණු දහයක් ඇත. ඒ කවරේද යත්:

"**විවර්ණ** බවට පැමිණියෙ වෙමි"යි පැවිද්ද විසින් නිතර සිහි කළ යුතුය. **මාගේ දිවිපැවැත්ම** අනුන් සිහිට කොට ඇතැ'යි පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. **මා විසින් අන්‍යයන්ට වඩා වෙනස් ආකල්පයක්** කළයුතුය යි" පැවිද්ද විසින් නිතර සිහි කළ යුතුය.

කිම, **මාගේ සිත සීලයෙන් මට ම උපවාද (දොස් කීම) නොකෙරේද** යි පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. කිම **නුවණැති සබ්‍රම්සරහු මා විමසා ශීලයෙන් (මට) පරිභව නොකෙරෙත්** දැයි පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. මාගේ සියලු **ප්‍රිය වූ මනාප වූ දෙයින් වෙනස් වීම, වෙන්වීම** වන්නේ යයි පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. "කර්මය තම සන්තක කොට ඇත්තෙමි, කර්මය දායාද කොට ඇත්තෙමි, කර්මය යෝනි කොට ඇත්තෙමි, කර්මය නෑ කොට ඇත්තෙමි, කර්මය පිළිසරණ කොට ඇත්තෙමි, මම **යම් යහපත් හෝ අයහපත් හෝ කර්මයක් කරන්නෙම්** ද එයට දායාද කොට ඇත්තෙමි යි පැවිද්ද විසින් නිතර සිහි කළ යුතුය. මාගේ **රෑ දවල් කෙසේ ඉක්මේ** දැයි පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. කිම? මම **ජන ශූන්‍ය ස්ථානයෙහි ඇලෙම්දැයි** පැවිද්ද විසින් නිතර සිහි කළයුතුය. මා විසින් ලබන ලද **උතුම් මිනිස් දහම් ගුණයක් ඇත්** ද ආර්ය මාර්ග ඥාන විශේෂයක් සාක්ෂාත් කර ගන්නා ලද්දේ ද, මගේ අවසාන කාලයෙහි සබ්‍රම්සරුන් විසින් ඒ ගැන විමසන ලද්දෙම් ඒ ගැන පැකි නොකරන්නෙම් වේ ද යි පැවිද්ද විසින් නිතර සිහි කළ යුතුය. මහණෙනි, මේවා පැවිදි වූවහු විසින් නිතර මෙනෙහි කළයුතු දස ධර්මයෝ වෙති යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. තුටු පහටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ (එම) දේශනාව සතුටින් පිළිගත්හ.

# 7. මහාමංගල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬුසිටාණන්ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රාත්‍රි පෙරයම ඉකුත්ව ගිය කල්හි ඉතා වර්ණවත් වූයේ මුළු ජේතවනය හාත්පසින් බබුළුවමින් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටි ඒ දෙවියා ගාථාවකින් භාග්‍යවතුන් වහන්සේට (මෙසේ) කීය.

1. බොහෝ යහපත කැමැති වන්නා වූ බොහෝ දෙවියෝ ද මිනිස්සු ද මංගල කරුණු ගැන සිතූහ. උතුම් මඟුල් කරුණු වදාළ මැනවි

   (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක)

2. නුවණ මඳ බාලයන් ඇසුරු නොකිරීම, නුවණැති පණ්ඩිතයන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, යන මේවා උතුම් මඟුල් ය.

3. සුදුසු පෙදෙසක විසීම, පෙර ජාතියෙහි කරන ලද පින් ඇති බව, තමා මනා කොට සුසිරිතෙහි පිහිටුවීම යන මේවා උතුම් මඟුල් ය.

4. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, ශිල්ප දැනීම, විනය ඇති බව හා හික්මීම, සුභාෂිත වචන ඇති බව යන මේවා උතුම් මඟුල් ය.

5. මව්පියන්ට උවටැන් කිරීම, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම, නිරවුල් කර්මාන්තවල යෙදීම යන මේවා උතුම් මඟුල් ය.

6. දන් දීම, දහම්හි හැසිරීම, නෑයනට සංග්‍රහ කිරීම, නිවැරදි ක්‍රියාවන්හි යෙදීම යන මේවා උතුම් මඟුල් ය.

7. පවෙහි නොඇලීම හා පවින් වැළකීම, රහමෙර පානයෙන් වැළකීම, කුසල් දහමෙහි නිපරමාදී වීම යන මේවා උතුම් මඟුල් ය.

8. (උතුමන්ට) ගෞරව කිරීම, යටහත් පහත් පැවැතුම් ඇතිවීම, සිතේ සතුට, කළගුණ දන්නා බව, සුදුසු කල්හි දහම් ඇසීම, යන මේවා උතුම් මඟුල් ය.

9. ඉවසීම (සුවච) කීකරු බව, ශ්‍රමණ (පැවිදි) උතුමන් දැකීම, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවෙහි යෙදීම යන මේවා උතුම් මඟුල් ය.

10. තපස, බඹසර විසීම. ආර්ය සත්‍යයන් දැකීම, නිවන් අවබෝධ කර ගැනීම යන මේවා උතුම් මඟුල් ය.

11. ලෞකික ධර්මයන්ගෙන් පීඩාවට පත්වූ විට කම්පා නොවන, ශෝක නොකරන රජස් රහිත, නිර්මල ශාන්ති දායක සිතක් ඇතිවීම යන මේවා උතුම් මඟුල් ය.

12. ඉහත කියන ලද අයුරින් ක්‍රියා කොට සියලු තැන්හි නොපැරදී හැම තැන්හි සැපපතට පැමිණියේ ද එය මඟුල් විමසන්නවුනට උතුම් වූ මඟුල් ය.

# 8. රතන සූත්‍රය

1. මෙහි රැස් වූ බිම් සිටින සහ අහසෙහි සිටින යම් අමනුෂ්‍ය කෙනෙකු වෙත් නම් ඒ සියලු අමනුෂ්‍යයෝ සතුටු සිතැත්තෝ වෙත්වා! නැවත ද (මේ) කියන [illegible] ඇතැවින් අසත්වා!

2. එහෙයින් සියලු අමනුෂ්‍යයෝ මේ වදන් අසත්වා! මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත් කරව්! යමෙක් රෑ දහවල් දෙකෙහි බිලි පුද පූජා කෙරෙත් ද එබැවින් ඔවුන් අප්‍රමාදීව රකිව්!

3. මේ ලොව පරලොව හෝ දෙව්ලොව හෝ යම්කිසි උතුම් ප්‍රණීත වූ රත්නයක් ඇත්තේ ද ඒ අතර තථාගතයන් වහන්සේ හා සමාන උතුම් වෙනත් රත්නයක් නැත්තේය. බුදුන් වහන්සේ කෙරෙහි ද මේ රත්න ස්වභාවය ශ්‍රේෂ්ඨය. මේ සත්‍ය බලයෙන් සියල් සතුනට සුව වේවා

4. සමාධියෙන් සන්සුන් සිතැති ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ රාගය නැසුවා වූ විරාගී වූ අමෘත නම් වූ උතුම් වූ යම් නිවනකට පැමිණි සේක් ද එම නිවන හා සමාන වූ වෙනත් උතුම් ධර්මයක් නැත. මෙය ද ධර්මයෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා

5. බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ පිරිසිදු වූ යම් ආර්ය මාර්ගයක් වර්ණනා කළ සේක් ද යම් ධර්ම මාර්ගයක් ආනන්තරිය සමාධිය යි කියත් ද ඒ සමාධි ධර්මය හා

සමාන වෙනත් උතුම් රත්නයක් නැත. මෙය ද ධර්මයෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

6. යම් අෂ්ටාර්ය පුද්ගල කෙනෙක් බුද්ධාදි සත්පුරුෂ උතුමන් විසින් ප්‍රශංසා කරන ලද්දාහු ද ඔවුහු සතර යුගලයක් වෙති. සුගතයන් වහන්සේගේ ශ්‍රාවක වූ ඔවුහු ද දක්ෂිණාවට සුදුසු වෙති. ඒ උතුමන්ට දෙන ලද දේය මහත් ඵල ගෙන දෙන්නේය. මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

7. යම් කෙනෙක් ස්ථිර සිතින් ගෞතම ශාසනයෙහි මැනවින් යෙදුනාහු කෙලෙසුන්ගෙන් වෙන් වූවාහු ද ඔවුහු අමා නිවනට බැස නොමිලයේ එය ලදින් සමවත් සුව විඳින්නාහු එළඹිය යුතු තැනට එළඹුනාහුය. මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

8. නුවර දොරටුව සවි කරනු ලබන ඉන්ද්‍රකීලය යම් සේ සිව් දිගින් හමන සුළඟින් නොසෙල්වී පවතින්නේ ද, චතුරාර්ය සත්‍යය නුවණින් දකින තැනැත්තා ද එවැනි ය. මෙය ද සංඝයා කෙරෙහි පවතින උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

9. යමෙක් ගැඹුරු නුවණින් යුතු සම්බුදුන් විසින් දේශනා කරන ලද ආර්ය සත්‍යයන් ප්‍රගුණ කෙරෙත් ද ඔවුහු අතිශයින් ප්‍රමාද වූවාහු නමුදු අටවන භවයක් නොගනිති. (සත් වරකට වඩා නූපදිති) මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

10. සෝවාන් මග නුවණ ලැබීමත් සමගම යමෙකුගේ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන කෙලෙස් තුන් නැතිවේ ද යමෙක් සතර අපායෙන් මිදුනේ වේ ද ඔවුහු සිව්දැරුම් මහා පාපයන් කරන්ට ද අයෝග්‍ය වෙති. මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුවවේවා.

11. "ඉදින් හෙතෙමේ කයින් වචනයෙන් හෝ සිතින් යම් අකුසලයක් කෙරේයි නම් හෝ එය සැඟවීමට" අයෝග්‍යයෙක් වන්නේය. දක්නා ලද නිර්වාණපද ඇත්තහුගේ ලක්ෂණය නම් කරන ලද අකුසලයන් සැඟවීමෙහි අභව්‍යතාවය යි (නොහැකිවීමයි). මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුව වේවා.

12. යම් සේ වන ලැහැබ්, ග්‍රීෂ්ම ඍතුවෙහි පළමු වන මාසය තුළ දී පිපුණු මලින් බර වේ ද එවැනි පරම හිතසුව පිණිස වූ නිර්වාණගාමී වූ ධර්මයක් බුදුන් වහන්සේ දෙසූ සේක. මෙය ද බුදුන් කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සියලු සතුනට සුවවේවා.

13. උතුම් වූ, නිවන් දන්නා වූ නිවන් ලබා දෙන්නා වූ නිවන් මග ගෙන හැර දක්වන්නා වූ අනුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් දහමක් දෙසූ සේක. මෙය ද බුදුරදුන් කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සෙත් වේවා.

14. (යම් රහතන්වහන්සේ කෙනෙකුගේ) පැරණි කර්ම අවසන් වී ද නව කර්ම නැත්තේ ද මතු භවයන් කෙරෙහි නොඇලුණු සිත් ඇත්තෝ ද ක්ෂය කළ බීජ ඇති, නැවත උපතක් කෙරෙහි නොවැඩෙන ආශා ඇති ඒ රහත් උතුමෝ මේ පහන නිවෙන්නාක් මෙන් නිවී යති. මෙය ද සංඝයා කෙරෙහි පවත්නා උතුම් රත්න ස්වභාවයකි. මේ සත්‍ය වචනයෙන් සෙත් වේවා.

15. මෙහි රැස්වූ පොළොවෙහි සිටින හෝ අහසෙහි සිටින හෝ යම් භූත කෙනෙක් ඇද්ද, ඒ අපි සියලු දෙනාම එකතුව දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ බුද්ධ රත්නය නමදිමු. සෙත් වේවා.

16. මෙහි රැස් වූ පොළොවෙහි සිටින හෝ අහසෙහි සිටින හෝ යම් භූත කෙනෙක් ඇද්ද, ඒ අපි සියලු දෙනාම එකතුව දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ ලොවුතුරා ධර්ම රත්නය නමදිමු. සෙත් වේවා.

17. මෙහි රැස් වූ පොළොවෙහි සිටින හෝ අහසෙහි සිටින හෝ යම් භූත කෙනෙක් ඇද්ද, ඒ අපි සියලු දෙනාම එකතුව දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ සංඝ රත්නය නමදිමු. සෙත් වේවා.

# 9. කරණීය මෙත්ත සූත්රය

1. ශාන්ත පදය වූ නිවනට පැමිණ වසන්නාහු විසින් යමක් කටයුතු ද නම් අභිවෘද්ධියෙහි දක්ෂයා විසින් එය කළ යුතුය. හෙතෙමේ සමතෙක් වන්නේය. සෘජු වන්නේය, මනා කොට සෘජු වන්නේය, කීකරු වන්නේය, මෘදු වන්නේය, නිහතමානී වන්නේය.

2. ලද දෙයින් සතුටු වන්නේය. සුවසේ පෝෂණය කළහැකි වන්නේය. වැඩි වැඩ නැත්තෙක් වන්නේය, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේය, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේය. නුවණැත්තෙක් වන්නේය. කයින් සිදුවන ප්රගල්භය නැති වන්නේය. කුලයන්හි නො ඇලෙන්නෙක් වන්නේය.

3. යම් ක්රියාවක් හේතු කොට ගෙන වෙනත් නුවණැත්තෝ නින්දා කෙරෙත් ද එවැනි සුළු වූ වරදක් හෝ නොකරන්නේය, සියලු සත්වයෝ සුව ඇත්තෝ වෙත්වා. නිර්භය වෙත්වා. සුවපත් සිතැත්තෝ වෙත්වා.

4. කෙලෙස් සහිත වූ ද රහිත වූ ද යම් ප්රාණීහු වෙත් ද, දීර්ඝ වූ හෝ මහත් වූ හෝ, මැදුම් පමණ වූ හෝ මිටි වූ හෝ, සියුම් සිරුරු ඇත්තා වූ හෝ මහත් සිරුරු ඇත්තා වූ හෝ ප්රාණීහු ද

5. ඇසට පෙනෙන්නා වූ හෝ නොපෙනෙන්නා වූ හෝ දුර වසන්නා වූ හෝ ළඟ වසන්නා වූ හෝ උපන්නා වූ හෝ උපදිමින් සිටින්නාවූ හෝ ඒ ප්රාණීහු ද සියලු සත්වයෝ ද සුවපත් සිතැත්තෝ වෙත්වා.

6. කිසිතැනක කෙනෙක් අනිකෙකු නොරවටන්නේය. කිසිවෙකුට අවමන් නොකරන්නේය. කෝපයෙන් හෝ රෝෂයෙන් හෝ එකිනෙකාට දුකක් කරනු නොකැමැති වන්නේය.

7. මවක් යම් සේ සිය දිවිහිමියෙන් තම එකම පුතු රකී ද එමෙන් සියලු සතුන් කෙරෙහි අප්රමාණ වූ මෙත් සිත වඩන්නේය.

8. උඩ ද යට ද සරසට ද අවහිර නැතිව, වෛර නැතිව, සතුරන් නැතිව, සියලු සතුන් කෙරෙහි පමණ නොකළ හැකි සේ මෙත් සිත වඩන්නේය.

9. සිටිමින්, හෝ යමින්, හෝ හිඳිමින්, හෝ නිදමින් හෝ අවදියෙන් සිටිමින් හෝ මේ මෛත්‍රී සිහිය ඉටන්නේය. එම මෛත්‍රී සිත මේ සම්බුද්ධ ශාසනයෙහි බ්‍රහ්මවිහාරය- (උතුම් වාසය කිරීම) යි කියා ඇත.

10. මිසදිටු බවට නොපැමිණ සිල්වත් වූ තමාගේ දර්ශනයෙන් යුක්ත වූ වස්තුකාමයෙහි ගිජුබව දුරු කොට ඒකාන්තයෙන් යළි මවු කුස පිළිසිඳ ගැනීමකට නැවත නොඑන්නේයි.

# 10. බන්ධ පරිත්ත

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේ පිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩ වසන සේක. ඒ සමයෙහි සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබ කලුරිය කළේ වෙයි. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පස්ව හුන්නාහුය. එකත් පස්ව හුන්නා වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, මේ සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබ කලුරිය කළේය."

"මහණෙනි, ඒ භික්ෂුව ඒකාන්තයෙන් සතර අහිරාජකුලයන් කෙරෙහි මෙත් සිත නො පැතිර වීය. ඉදින් ඒ භික්ෂුව සතර අහිරාජකුලයන් කෙරෙහි මෙත් සිත පැතිර වූයේ නම් ඒකාන්තයෙන් ඒ භික්ෂුව සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබ කලුරිය නොකරන්නේය. සතර අහිරාජකුලයෝ කවරහුද යත්: විරූපක්ඛ අහිරාජකුලය, ඒරාපථ අහිරාජකුලය, ඡබ්‍යාපුත්ත අහිරාජකුලය, කණ්හා ගෝතමක අහිරාජකුලය (යන මේවායි). ඒකාන්තයෙන් ඒ භික්ෂුව මෙම සතර අහිරාජකුලයන් (කෙරෙහි) මෙත් සිත නොපැතිර වීය. ඉදින් ඒ භික්ෂුව මේ සතර අහිරාජකුලයන් කෙරෙහි මෙත් සිත පැතිර වූයේ නම් ඒකාන්තයෙන් ඒ භික්ෂුව සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබ කලුරිය නොකරන්නේය.

(එබැවින්) මේ සතර අහිරාජකුලයන් කෙරෙහි මෙත් සිත පැතිර වීමට (මම තොපට) අවසර දෙමි. (කුමක් පිණිස ද යත්) තමාගේ රැකවරණය පිණිසය, තමාගේ ආරක්ෂාව පිණිසය, තමාහට මෙත් පිරිත් සඳහාය,

අනුශාසක වූ බුදුරජාණන් වහන්සේ නැවත ද මෙසේ වදාළ සේක.

1. මාගේ මෛත්‍රිය විරූපක්ඛයන් සමග ය. මාගේ මෛත්‍රිය ඒරාපථයන් සමග ය. මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්තයන් සමගය. මාගේ මෛත්‍රිය කණ්හා ගෝතමකයන් සමග ය.

2. මගේ මෛත්‍රිය පා නැති (බඩගා යන) සතුන් සමග ය. මාගේ මෛත්‍රිය දෙපාවුන් (මිනිසුන්, කුරුල්ලන්) සමග ය. මාගේ මෛත්‍රිය සිවුපාවුන් සමග ය. මාගේ මෛත්‍රිය බහුපාවුන් (පත්තෑ, ගෝනුසු ආදීන්) සමග ය.

3. අපා (පා නැති) සතෙක් මා නො පෙළාවා. දෙපා සතෙක් මා නොපෙළාවා, සිවුපා සතෙක් මා නො පෙළාවා, බහුපා සතෙක් මා නො පෙළාවා.

4. සියලු සත්වයෝ ද සියලු ප්‍රාණීහු ද සියලු භූතයෝ ද යන සියල්ලෝම යහපතම දකිත්වා. ඒ කිසිවෙකු වෙත දුකක් නො පැමිණේවා.

# 11. මෙත්තානිසංස සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුහුගේ දෙව්රම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූ සේක.

'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. 'මහණෙනි, ආදරයෙන් සෙවුනා ලද, භාවිතයෙන් වඩනා ලද, බහුලව වඩනා ලද, යානාවක් මෙන් පුරුදු පුරුදු කරන ලද, වස්තුවක් මෙන් රැක ගන්නා ලද, අනුව සිටියා වූ පුරුදු කරන ලද්දා වූ මැනවින් පටන් ගන්නා ලද්දා වූ මෛත්‍රී චේතෝ විමුක්තියගේ (මෙත් සිතෙහි) ආනිසංසයෝ එකොළොස් දෙනෙක් කැමැති විය යුත්තාහ.

කවර එකොළොස් දෙනෙක් ද යත්: සුවසේ නිදයි, සුවසේ අවදි වෙයි, නපුරු සිහින නොදකියි, මිනිසුන්ට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. දෙවියෝ රකිති. එම මෙත් සිතින් යුතු තැනැත්තාගේ සිරුරෙහි ගිනි හෝ සැත් (ආයුධ) හෝ නොවදී. වහා සිත සන්සුන් වෙයි. මුහුණ පැහැපත් වෙයි. නොමුළා සිහිකල්පනාවෙන් යුතුව කළුරිය කෙරෙයි. මෙත් සමවතින් රහත්වන්නට නොහැකි වී නම් (මරණින්) මත්තෙහි බඹලොව උපදී.

"මහණෙනි, ආදරයෙන් සෙවුනා ලද භාවිතයෙන් වඩනා ලද, බහුලව වඩනා ලද යානාවක් මෙන් පුරුදුපුරුදු කරන ලද වස්තුවක් මෙන් රැකගන්නා ලද, අනුව සිටියා වූ පුරුදු කරන ලද්දා වූ මැනවින් පටන් ගන්නා ලද්දා වූ මෛත්‍රී චේතෝ විමුක්තියගේ (මෙත් සිතෙහි) මෙකී ආනිසංසයෝ එකොළොස් දෙනෙක් කැමැති විය යුත්තාහ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. සන්තෝෂ වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ගැන බොහෙවින් සතුටු වූහ.

# 12. මිත්තානිසංස සූත්‍රය

1. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ තම නිවසින් බැහැරව වසනුයේ නමුදු බොහෝ ආහාර පාන ලබන්නෙක් වෙයි. බොහෝ දෙනා ඔහුගේ ඇසුරෙන් ජීවත් වෙන්නෝ වෙති.

2. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ යම් යම් දනව්වකට හෝ නියම් ගමකට හෝ රජ දහනකට ගියේ වෙයි ද ඒ හැම තැන්හිම පුදනු ලබන්නෙක් වෙයි.

3. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද සොරු ඔහු මඩනා ලං නොවෙති. රජ තෙමේ ඔහුට අවමන් නොකරයි. ඔහු හැම සතුරන් දුරු කරයි.

4. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ කෝපා නොවූයේ සිය ගෙට එයි. සභාවෙහි සතුටුවූයේ වෙයි. නෑයන් අතරෙහි උතුමෙක් වෙයි.

5. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ අනුන්ට සත්කාර කොට තමා ද සත්කාර ලබන්නෙක් වෙයි. අනුන් කෙරෙහි ගෞරව කරන්නෙකුව තමා ගරු බුහුමන් ලබන්නෙක් වෙයි. වැඳුම්, කිත් පැසසුම් දරන්නෙක් වෙයි.

6. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ මිතුරන් පුදන්නෙකුව තමාත් පිදුම් ලබන්නෙක් වෙයි. තමා උතුමන්ට වඳින්නෙකුව තමාත් පෙරළා වැඳුම් ලබන්නෙක් වෙයි. යසසට හා කීර්තිපැසසුමට පැමිණෙන්නේ වෙයි.

7. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද හෙතෙමේ යම් සේ ගින්න දැල්වෙමින් දිලිසේ ද එමෙන් දෙවියෙකු මෙන් බබළන්නේ වෙයි. සිරි සැපත විසින් අත්නොහරින ලද්දෙක් වෙයි.

8. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද ඔහුගේ ගව සම්පත වැඩේ. කෙතෙහි වපුළ දේ මැනවින් පැළවේ. ඔහු දරුවන් ඇත්තෙකු වීමේ (ප්‍රීතිය) සැපත ලබයි.

9. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද ඒ තැනැත්තා (ගිරි) ඇදුරකින් හෝ පර්වතයකින් හෝ ගසකින් හෝ වැටුනේ හෝ ගිලිහුණේ (රැඳී සිටීමට) ආධාරයක් ලබයි.

10. යමෙක් මිතුරන්ට ද්‍රෝහ නොකරයි ද තෙ හොඳින් වැඩුණු මුල් හා නුග අරළු (මුල්) නිසා සුලඟින් පොළොව ඔබ හෙළිය නොහැකි නුග රුකක් වැනිය. එවැනි තැනැත්තා, මැඩලීමට සතුරෝ අපොහොසත් වෙති.

# 13. මෝරපරිත්ත.

1. ඇස් ඇති, ඒකරාජ වූ රන්වන් වූ මහ පොළොව බබුළුවන්නාවූ මේ සූර්යයා උදාවෙයි. රන්වන් වූ පොළොව බබුළුවන ඒ ඔබට නමස්කාර කරන්නෙමි. අද ඔබ විසින් ආරක්ෂා කරන ලද අපි මේ දවස ගත කරමු.

2. "සියලු ධර්මයන් (දත යුතු දේ) දැන සම්බෝධියට පැමිණියා වූ කෙලෙසුන් නැසූ යම් (බ්‍රාහ්මණ නම් ලද) උතුමෝ වෙති ද ඔවුන්ට මාගේ නමස්කාරය වේවා. ඔවුහු මා ආරක්ෂා කෙරෙත්වා. මාගේ නමස්කාරය (අතීත) බුදුවරුන්ට වේවා. උන්වහන්සේලාගේ බුද්ධත්වයට මාගේ නමස්කාරය වේවා. කෙලෙසුන්ගෙන් මිදුණු ඒ උතුමන්ට මාගේ නමස්කාරය වේවා. උන්වහන්සේලාගේ විමුක්තියට නමස්කාරය වේවා". මේ පිරිත ආරක්ෂාව කොට ගෙන ඒ මොනරා ආහාර සෙවීමෙහි හැසිරෙයි.

3. ඇස් ඇති ඒකරාජ වූ රන්වන් වූ පොළොව බබුළුවන්නාවූ මේ සූර්යයා බැස යයි. එහෙයින් රන්වන් වූ පොළොව බබුළුවන්නාවූ ඒ ඔබට නමස්කාර කරන්නෙමි. අද ඔබ විසින් ආරක්ෂා කරන ලද (අපි) රාත්‍රිය ගත කරමු. සියළු ධර්මයන් දැන සම්බෝධියට පැමිණියා වූ කෙලෙසුන් නැසූ යම් (බ්‍රාහ්මණ නම් ලද) උතුමෝ වෙති ද ඔවුන්ට මාගේ නමස්කාරය වේවා. ඔවුහු මා ආරක්ෂා කෙරෙත්වා. මාගේ නමස්කාරය (අතීත) බුදුවරුන්ට වේවා. කෙලෙසුන්ගෙන් මිදුණු ඒ උතුමන්ට මාගේ නමස්කාරය වේවා. උන්වහන්සේලාගේ විමුක්තියට නමස්කාරය වේවා.

මේ පිරිත ආරක්ෂාව කොට ගෙන ඒ මොනරා වාසය කළේය.

# 14. චන්ද පරිත්ත

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩ වසන සේක. එකල්හි වනාහි චන්ද්‍ර දේවපුත්‍ර තෙමේ රාහු අසුරේන්ද්‍රයා විසින් අල්ලා ගන්නා ලද්දේ වෙයි. ඉක්බිති සඳදෙව්පුත් තෙමේ එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ සිහි කරමින් මේ ගාථාව කීය.

1. බුද්ධ වීරයාණෙනි, ඔබ වහන්සේ සියළු කෙලෙසුන් කෙරෙන් විප්‍රයෝගයෙන් මිදුණු සේක. ඔබ වහන්සේට නමස්කාර වේවා. මම සම්බාධයකට (කරදරයකට) පැමිණියේ වෙමි. ඒ මට පිළිසරණ වුව මැනව.

එවිට භාග්‍යවතුන් වහන්සේ චන්ද්‍ර දිව්‍ය පුත්‍රයා අරබයා රාහු අසුරේන්ද්‍රයාට ගයකින් මෙසේ වදාළ සේක.

2. රාහු අසුරය, චන්ද්‍රිම තෙමේ අරහත් වූ තථාගතයන් සරණ ගියේය. බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝය. (එහෙයින්) චන්ද්‍රයා ග්‍රහණයෙන් මුදා හරුව. ඉක්බිති රාහු අසුරේන්ද්‍ර තෙමේ චන්ද්‍රිම දිව්‍ය පුත්‍රයා මුදා හැර, වෙලෙව්ව (වහ වහා) වේපචිත්ති අසුරේන්ද්‍රයා යම් තැනෙක්හි ද එතැනට එළඹියේය. එළඹ සංවේගයට පත්ව ලොමුදැහැගත් සිරුරු ඇත්තේ එකත් පසෙක සිටියේය. එකත් පස්ව සිටි රාහු අසුරිඳුට, වේපචිත්ති අසුරිඳු, මෙසේ කීය.

3. 'රාහු අසුරේන්ද්‍රය, වෙලෙව්ලුවකු මෙන් කුමක් නිසා සඳු අත් හැරියෙහි ද? සැලුණු සිතින් මෙහි පැමිණ කුමක් නිසා බිය වූවකු මෙන් සිටිහි ද?

4. (සඳු මුදා හරුවයි) බුදුන් විසින් ගයකින් කියන ලද්දේ වෙමි. ඉදින් මා එය ඉටු නොකරණ ලද්දේ නම් මාගේ හිස සත් කඩකට පැලෙයි. දිවිය ලැබුණත් සුවයක් නම් නොලැබෙයි.

# 15. සූරිය පරිත්ත.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඬු සිටුහුගේ දෙව්රම්හි වැඩ වසන සේක. එකල්හි වනාහි සූර්ය දේවපුත්‍ර තෙමේ රාහු අසුරේන්ද්‍රයා විසින් අල්ලා ගන්නා ලද්දේ වෙයි. ඉක්බිති සූර්යදෙව්පුත් තෙමේ එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ සිහිකරමින් මේ ගාථාව කීය.

1. 'බුද්ධ වීරයාණෙනි, ඔබ වහන්සේ සියළු කෙලෙසුන් කෙරෙන් විප්‍රයෝගයෙන් මිදුණු සේක. ඔබ වහන්සේට නමස්කාර වේවා. මම සම්බාධයකට (කරදරයකට) පැමිණියේ වෙමි. ඒ මට පිළිසරණ වුව මැනව'. එවිට භාග්‍යවතුන් වහන්සේ සූර්ය දිව්‍යපුත්‍රයා අරභයා රාහු අසුරේන්ද්‍රයාට ගයකින් මෙසේ වදාළ සේක.
2. 'රාහු අසුරය, සූර්ය දේවපුත්‍ර තෙමේ අරහත් වූ තථාගතයන් සරණ ගියේය. බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝය. එහෙයින් සූර්ය දේවපුත්‍රයා ග්‍රහණයෙන් මුදාහරුව.

3. "යම් සූර්යයෙක් ගගන අඳුරෙහි පහන් කරනුයේ බබලනුයේ. මණ්ඩල සටහන් ඇත්තේ මහා තෙජස් ඇත්තේ වේ ද, එම්බා රාහු, අහසෙහි හැසිරෙන මාගේ දරු වන හිරු නොගිලව. එම්බා රාහු, හිරු මුදා හරුව" යනුයි.

ඉක්බිති රාහු අසුරේන්ද්‍රයා සූර්ය දේවපුත්‍රයා මුදා හැර වෙලෙඹිව වේපචිත්ති අසුරයා යාත් තැනට එළඹියේය. එළඹ සංවේගයට පත්ව ලොමු දැහැගත් සිරුරකින් එකත් පස්ව සිටියේය. එකත් පස්ව සිටි රාහු අසුරිඳුට වේපචිත්ති අසුරිඳු මෙසේ කීය.

4. "රාහු අසුරේන්ද්‍රය, කුමක් නිසා වෙවුලමින් බියවූවෙකු මෙන් සූර්යයා හැරපලුයි ද? කැලැඹුණු සිතින් මෙහි පැමිණ කුමක් නිසා බිය වූවෙකු මෙන් සිටියි ද?

5. (හිරු මුද හරුව යි) බුදුන් විසින් ගයකින් කියන ලද්දේ වෙමි. ඉදින් මා එය මුදා නොකරණ ලද්දේ නම් මගේ හිස සත්කඩකට පැලෙයි. දිවිය රැකුණත් සුවයක් නම් නොලැබෙයි," යනුයි.

# 16. ධජග්ග පරිත්ත

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක.

"ස්වාමීනි" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේය වදාළ සේක.

මහණෙනි, පෙර වූ දෙයක් කියමි. දෙවියන් හා අසුරයන් අතර සංග්‍රාමයක් (යුද්ධයක්) එළඹුනේ විය. මහණෙනි, ඉක්බිති සක්දෙව් රජතෙමේ තව්තිසා වැසි දෙවියන් අමතා මෙසේ කීය.

'නිදුකාණෙනි, යුදයට ගිය දෙවියන්ට බියක්, හෝ තැති ගැන්මක් හෝ ලොමුදැහැ ගැන්මක් හෝ ඉදින් උපන්නේ නම් එවිට මගේ ම ධ්වජාග්‍රය (කොඩිය දෙස) බලව්. මගේ කොඩිය දෙස බලන්නා වූ තොපගේ බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමු දැහැ ගැන්මක් හෝ වූයේ ද එය දුරුවන්නේය. ඉදින් මගේ කොඩිය දෙස නොබලන්නාහු නම් අනතුරුව ප්‍රජාපති දෙව්රජුහුගේ කොඩිය දෙස බලව්. ප්‍රජාපති දෙව් රජුහුගේ කොඩිය දෙස බලන්නාවූ තොපගේ බියක් හෝ තැති ගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වූයේ ද එය දුරුවන්නේය. ඉදින් ප්‍රජාපති දෙව්රජුහුගේ කොඩිය දෙස නොබලන්නාහු නම් අනතුරුව වරුණ දෙව්රජුහුගේ කොඩිය දෙස බලව්. වරුණ දෙව්රජුහුගේ කොඩිය දෙස බලන්නා වූ තොපගේ බියවීම තැතිගැනීම හෝ ලොමු දැහැ ගැනීම දුරුවන්නේය. ඉදින් වරුණ දෙව්රජුහුගේ කොඩිය දෙස නොබලන්නාහු නම්. ඊසාන දෙව්රජුහුගේ කොඩිය දෙස බලව්. ඊසාන දෙව්රජුහුගේ කොඩිය දෙස බලන්නා වූ තොපගේ බිය වීම, තැතිගැනීම හෝ ලොමු දැහැගැනීම දුරුවන්නේය'.

'මහණෙනි, සක්දෙව් රජුහුගේ කොඩිය දෙස බලන්නාහුගේ හෝ ප්‍රජාපති දෙව්රජුහුගේ කොඩිය දෙස බලන්නාහුගේ හෝ වරුණ දෙව් රජුහුගේ කොඩිය දෙස බලන්නාහුගේ හෝ ඊසාන දෙව් රජුහුගේ කොඩිය දෙස බලන්නාහුගේ හෝ බියවීම, තැතිගැනීම හෝ ලොමු දැහැ ගැනීම දුරුවන්නේත් වන්නේය, නොවන්නේත් වන්නේය. එයට හේතු කවරේද යත්:

මහණෙනි, සක්දෙව් රජතෙමේ පහනොවූ රාග ඇත්තෙකි. පහනොවූ ද්වේෂ ඇත්තෙකි. පහනොවූ මෝහ ඇත්තෙකි. බිය සුළුය. තැති ගන්නෙකි. ඉතා බිය සුළුලෙකි, බියෙන් පැන යන්නෙකි.

මහණෙනි, මම මෙසේ ද පවසමි. ඉදින් වනගතව සිටින හෝ රුක්මුලෙහි සිටින හෝ විවේකස්ථානයක සිටින හෝ තොපට යම් බියක් හෝ තැති ගැන්මක් හෝ ලොමු දැහැ ගැනීමක් හෝ ඉදින් උපදී නම් (හටගනී නම්) එවිට මා ගැන ම සිහි කරව්. ඒ මෙසේය.

“ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේ ද රහත් වන සේක. සියලු ධර්මයන් මනා කොට දත් සේක. විද්‍යාචරණ සම්පන්න සේක. සුගත වන සේක. ලෝකවිදූ නම් වන සේක. අනුත්තර වන සේක. පුරිසදම්මසාරථී වන සේක. දෙවිමිනිසුන්ට අනුශාසක වන සේක. සිව්සස් දත් හෙයින් බුද්ධ නම් වන සේක. භගවා නම් වන සේක.” යනුවෙනි.

මහණෙනි (මෙසේ) මා ගැන සිහි කරන විට තොපගේ ඒ බිය, තැති ගැනීම, ලොමු දැහැගැනීම, පහව යන්නේය.

ඉදින් මා ගැන සිහි නොකරන්නාහු නම් ධර්මය ගැන සිහි කරව්. ඒ මෙසේය.

‘භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට දෙසන ලද්දකි. තමා විසින් ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් දත යුත්තකි. එය කල් නොයවා යහපත් ප්‍රතිඵල බලා දෙන්නකි. ‘එන්න බලන්න’ යන ඇරයුම කරන්නකි. තම තමන් තුළ පිහිටුවා ගත යුත්තකි. නුවණැත්තන් විසින් තම තමන් ම තේරුම් ගත යුත්තකි’ යනුයි. මහණෙනි, ධර්මය සිහි කරන්නා වූ තොපගේ එම බිය, තැති ගැනීම, ලොමු දැහැගැනීම, පහව යන්නේය.

ඉදින් ධර්මය සිහි නොකරන්නාහු නම් ගුණනිධි සංඝයා ගැන සිහිකරව්. ඒ මෙසේය.. ‘භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාතෙමේ මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාතෙමේ ඍජු පිළිවෙතින් යුක්තය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ නිවන් මගට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ ගරුකිරීමට සුදුසු පිළිවෙත්හි නිරත වූයේය. එනම්, පුරුෂ යුගල වශයෙන් සතර කොටසක් ද පුරුෂ පුද්ගල වශයෙන් අට දෙනෙක් ද (සෝවාන් ආදී) මාර්ග ඵල ලාභී උතුමෝ වෙති. භාග්‍යවතුන් වහන්සේගේ එම ශ්‍රාවක සංඝ තෙමේ ළඟට ගෙනවිත් පුදන පූජාවට සුදුසුය. ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුය දක්ෂිණාවට යෝග්‍යය. දොහොත් මුදුන් දී වැඳීමට සුදුසුය. ලෝකයාගේ උතුම් වූ පින්කෙතයි.’ යනුවෙනි.

මහණෙනි, සංඝයා ගැන සිහි කරන තොපගේ එම බිය, තැති ගැනීම, ලොමු දැහැ ගැනීම පහව යන්නේය. එයට හේතු කවරේද යත්-

මහණෙනි, අර්හත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගත තෙමේ, නසන ලද රාග ඇත්තේ ය. නසන ලද ද්වේෂ ඇත්තේය. නසන ලද මෝහ ඇත්තේ ය. බිය නොවන සුලුය. තැතිනොගන්නා සුලුය. බියගුලු නොවේ. බියෙන් පලා නොයන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ (ඒ) ශාස්තෘන් වහන්සේ මෙය වදාරා අනතුරුව මෙසේ ද වදාළ සේක.

1. මහණෙනි, අරණෙහි දී හෝ රුක්මුලෙහි දී හෝ විවේකාගාරයෙහි දී හෝ (තොපට බියක් ඇතිවී නම්) සම්බුදුන් සිහිකරව්. (එවිට) තොපට බියක් නොවන්නේය.
2. ඉදින් (මුළු) ලොවට උතුම් වූ මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ බුදුන් සිහි නොකරන්නාහු නම් යහමග දක්වන්නා වූ මනා කොට දෙසන ලද ධර්මය සිහි කරව්
3. ඉදින් යහපත් මග දක්වන මනා කොට දෙසන ලද ධර්මය සිහි නොකරව් නම් ඉක්බිති අනුත්තර පින්කෙත වූ සංඝයා සිහිකරව්.
4. මහණෙනි, මෙසේ බුදුන්, දහම්, සඟුන් සිහි කරන්නාවූනට බියක් හෝ තැති ගැනීමක් හෝ ලොමු දැහැගැනීමක් හෝ කිසිලෙසකින් ඇති නොවන්නේය.

## ධජග්ග පිරිත නිමි.

## පළමු වන බණවර නිමි.

# 17. මහාකස්සප ථේර බොජ්ඣංග

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර, ලෙහෙනුන් සඳහා වෙන් කරන ලද අභය භූමියක් වන හෙයින් කලන්දක නිවාප නම් වූ උණ පඳුරු වනයක් වූ හෙයින් වේළුවන නාම වූ විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් මහකසුප් (හිමි) ලෙඩින් පීඩාවට පත්ව, දුක්වේදනාවට පත්ව, දැඩි සේ ගිලන්ව පිප්ඵලි ගුහාවෙහි වාසය කරයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵල සමවතින් නැගිට මහ කසුප් තෙරුන් වැඩහුන් තැනට එළඹි සේක. එළඹී පනවන ලද අසුනෙහි වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහකසුප් තෙරුන්ට මෙසේ වදාළ සේක.

'කොහොමද? කස්සප, (අසනීපය) ඉවසා සිටිය හැකි ද? විඳ දරා ගෙන හැකි ද? දුක් වේදනාව කොහොම ද? අඩුවී ගෙන යනවා ද? වැඩි වන්නේ නැහැ නේ ද? අඩු වී ගෙන ගොස් අවසන් වන බව පෙනෙනවා ද? වැඩිවන බවක් පෙනෙන්නේ නැහැ නේ ද?

(එවිට මහ කසුප් හිමි මෙසේ කීය.) නැත, ස්වාමීනි, මේ අසනීපය උහුලා ගෙන ඉන්න බෑ. දරා ගෙන ඉන්න බෑ. වේදනාව විශාල වැඩී වෙනවා මිසක් අඩු වෙන ගතියක් නම් පෙනෙන්න නෑ. වැඩිවෙලාම අවසන් වෙන්න තදනවා මිසක් අඩුවෙලා අවසන් වෙන හැටියක් පේන්න නෑ.'

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක)

'කාශ්‍යප, බොජ්ඣංග ධර්ම සතක් තියෙනවා. ඒවා මා හොඳට පෙන්වා දී තියෙනවා. මා ඒවා භාවිතා කර පුරුදු පුහුණු කර තිබෙනවා. සත්‍යාවබෝධයට මනා අවබෝධයට නිවනට, ඒවා හේතු වෙනවා. උපකාර වෙනවා. ඒ බොජ්ඣංග ධර්ම සත මෙසේයි.

කාශ්‍යප, "**සති සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දකි. පුරුදු පුහුණු කරන ලද්දකි. සත්‍යය වටහා ගැනීමට, මනාව තේරුම් ගැනීමට, නිවනට (එය) උපකාර වන්නක්, හේතුවන්නක්.

කාශ්‍යප, "**ධම්ම විචය සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක්. පුරුදු පුහුණු කරන ලද්දක්. සත්‍යය වටහා ගැනීමට, මනාව තේරුම් ගැනීමට, නිවනට (එය) උපකාර වන්නක්, හේතු වන්නක්.

කාශ්‍යප, "**විරිය සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක්. පුරුදු පුහුණු කරන ලද්දක්: සත්‍යය වටහා ගැනීමට, මනාව තේරුම් ගැනීමට, නිවනට (එය) උපකාර වන්නක්, හේතුවන්නක්.

කාශ්‍යප, "**පීති සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක්: පුරුදු පුහුණුකරන ලද්දක්: සත්‍යය ............ නිවනට එය උපකාර වන්නක්.

කාශ්‍යප, "**පස්සද්ධි සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක් ........................ නිවනට (එය) උපකාර වන්නක්.

කාශ්‍යප, "**සමාධි සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක් ........................ නිවනට (එය) උපකාර වන්නක්.

කාශ්‍යප, "**උපෙක්ඛා සම්බොජ්ඣංගය**" මා විසින් පැහැදිලිව දක්වන ලද්දක් ........................ නිවනට (එය) උපකාර වන්නක්.

කාශ්‍යප, ඉහත කී බොජ්ඣංග සත මා විසින් පැහැදිලිව දක්වන ලද ඒවායි, පුරුදු

පුහුණු කරන ලද ඒවායි. සත්‍යය වටහා ගැනීමට, මනාව තේරුම් ගැනීමට නිවනට ඒවා උපකාර වෙනවා; හේතු වෙනවා" (යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

(එවිට කාශ්‍යප තෙර මෙසේ කීය.) "භාග්‍යවතුන් වහන්ස, බොජ්ඣංග ධර්මයෝ මැනවි සුගතයන් වහන්ස, බොජ්ඣංග ධර්මයෝ ඉතා මැනවි".

භාග්‍යවතුන් වහන්සේ විසින් කරණ ලද ඒ දෙසුමට පහන් සිතින් සවන් දුන් ඇවැත් මහකසුප් තෙර එය සතුටින් පිළිගත්තේය.

ඇවැත් මහකසුප් තෙර (ඒ දෙසුම් අසා) එම අසනීපය සුවපත්ව නැඟී සිටියේය. එයින්ම මහ කසුප් තෙරුන්ගේ ඒ ආබාධය සුව වූයේය. යනුයි.

# 18. මහාමොග්ගල්ලාන ථේර බොජ්ඣංග

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි ඇවැත් මහ මුගලන් තෙර ලෙඩින් පීඩාවට පත්ව, දුක් වේදනාවට පත්ව, දැඩි සේ ගිලන්ව ගිජ්ඣකූට පව්වෙහි වාසය කරයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පල සමවතින් නැගිට මුගලන් තෙරුන් වැඩ හුන් තැනට වැඩි සේක.
වැඩ පනවන ලද අසුනෙහි වැඩ හිඳ මහමුගලන් තෙරුන්ට මෙසේ වදාළ සේක.

"කොහොමද? මොග්ගල්ලාන. අසනීපය ඉවසා සිටිය හැකි ද? විඳ දරා ගත හැකි ද? දුක් වේදනාව කොහොම ද? අඩු වෙලා යනවා ද? වැඩි වන්නේ නැද්ද? අඩු වී ගෙන ගොස් අවසන් වන බව පෙනෙනවා ද? වැඩිවන බවක් නොපෙනේද?

> "නැත, ස්වාමීනි, මේ අසනීපය ඉවසලා ගෙන ඉන්න බෑ. දරා ගෙන ඉන්න බෑ. වේදනාව විශාල වැඩි වෙනවා මිසක් අඩුවෙන හැඩක් නම් පෙනෙන්න නෑ. වැඩි වෙලාම අවසන් වෙන්න හදනවා මිසක් අඩුවෙලා අවසාන් වෙන හැඩක් පේන්න නෑ (යි මුගලන් හිමි කීය)

"මොග්ගල්ලාන, බොජ්ඣංග ධර්ම හතක් තිබෙනවා; ඒවා මා හොඳට පෙන්වා දී තිබෙනවා, මා ඒවා භාවිත කර පුරුදු පුහුණු කර තිබෙනවා ඒවා සත්‍යාවබෝධයට මනා අවබෝධයට. නිවනට හේතු වෙනවා, උපකාර වෙනවා. ඒ බොජ්ඣංග ධර්ම සත මෙසේ යි.

**සති සම්බොජ්ඣංගය, ධම්ම විචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපෙක්ඛා සම්බොජ්ඣංගය.**

මොග්ගල්ලාන, ඉහත කී බොජ්ඣංග සත මා විසින් පැහැදිලිව දක්වන ලද ඒවායි. පුරුදු පුහුණු කරන ලද ඒවායි; සත්‍යය වටහා ගැනීමට, මනාව තේරුම් ගැනීමට, නිවනට ඒවා උපකාර වෙනවා. හේතු වනවා (යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

(එවිට මහ මුගලන් තෙර මෙසේ කීය) භාග්‍යවතුන් වහන්ස, බොජ්ඣංග ධර්මයෝ මැනවි; සුගතයන් වහන්ස, බොජ්ඣංග ධර්මයෝ මැනවි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ විට මුගලන් තෙර එය සතුටින් පිළිගති. මුගලන් තෙර එම දෙසුම් අසා සුවපත්ව නැඟී සිටියේය. එයින් මුගලන් තෙරුන්ගේ ඒ ආබාධය සුව වූයේය.

# 19. මහාචුන්ද ථේර බොජ්ඣංග

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ලේනුන්ට අභය භූමිය වූ වේළුවන විහාරයෙහි වැඩ වසන සේක. ඒ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ලෙඩ ව වේදනාවට පත්ව දැඩි සේ ගිලන් වූ සේක.

ඉක්බිති ආයුෂ්මත් චුන්ද (ස්ථවිර) හෙමින් සවස් වේලෙහි සමවතින් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ, නමස්කාර කොට එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් චුන්ද (තෙරුන්) ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "චුන්දය, බොජ්ඣංග ධර්මයන් දේශනා කරව" "එවිට චුන්ද තෙර මෙසේ කීය." ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දක්වන ලද, සිහියට අවබෝධයට, මහාවබෝධයට, නිර්වාණට හේතුවන බොජ්ඣංග ධර්මයෝ සත් දෙනෙක් වෙති. ඒ මෙසේයි.

ස්වාමීනි "**සති සංබොජ්ඣංගය**" භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දක්වන ලද්දකි. භාවිත කරන ලද්දකි. පුරුදු පුහුණු කරන ලද්දකි. සිහියට අවබෝධයට, මහාවබෝධයට, නිර්වාණට හේතුවන්නකි.

ස්වාමීනි, **ධම්මවිචය සංබොජ්ඣංගය**..., **විරිය සංබොජ්ඣංගය**..., **පීති සංබොජ්ඣංගය**..., **පස්සද්ධි සංබොජ්ඣංගය**...., **සමාධි සංබොජ්ඣංගය**...., **උපෙක්ඛා සංබොජ්ඣංගය**...., භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දක්වන ලද්දකි. භාවිත කරන ලද්දකි. පුරුදු පුහුණු කරන ලද්දකි. සිහියට අවබෝධයට, මහාවබෝධයට, නිර්වාණට හේතුවන්නකි.

ස්වාමීනි, මේ සප්ත බොජ්ඣංගයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දක්වන ලදහ. භාවිත කරන ලදහ. පුරුදු පුහුණු කරන ලදහ. (ඒවා) සිහියත් දැනුමට, මහාවබෝධයට, නිර්වාණට හේතු වන්නාහ.

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක) චුන්දය, බොජ්ඣංග ධර්මයෝ මැනවි. චුන්දය, බොජ්ඣංග ධර්මයෝ මැනවි.

ආයුෂ්මත් චුන්දයන් බොජ්ඣංගයන් දෙසූ විට ශාස්තෲන් වහන්සේ එය අනුමත කළ සේක. භාග්‍යවතුන් වහන්සේ එම දෙසුම අසා සුවපත්ව නැගී සිටි සේක. එසිතින් භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය දුරු වූයේය.

# 20. ගිරිමානන්ද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුතුමාගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. ඒ සමයෙහි ආයුෂ්මත් ගිරිමානන්ද තෙර ලෙඩින් පීඩාවට පත්ව දුක් වේදනාවට පත්ව දැඩිසේ ගිලන්ව සිටියි.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙර භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට එළඹී භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කොට එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙර භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසීය.

"ස්වාමීනි, ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්, දුකට පත්ව දැඩි සේ ගිලන්ව සිටියි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පෙරදැරිව ඇවැත් ගිරිමානන්ද වෙත වඩිනේක හොත් නම් මැනවි".

(එයට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක)

"ආනන්දය, (කොපමි) ගිරිමානන්ද භික්ෂුව වෙත ගොස් දස සඤ්ඤාවන් කියන්නෙහි නම් මැනවි. ඒ දස සඤ්ඤාවන් අසා ගිරිමානන්ද භික්ෂුවගේ ඒ ආබාධය වහා සුව වන්නේය. ඒ දස සඤ්ඤාවෝ කවරහු ද යතහොත්:

**අනිච්ච සඤ්ඤා** ය, **අනත්ත සඤ්ඤා** ය, **අසුභ සඤ්ඤා** ය, **ආදීනව සඤ්ඤා** ය, **පහාන සඤ්ඤා** ය, **විරාග සඤ්ඤා** ය, **නිරෝධ සඤ්ඤා** ය, **සබ්බ ලෝක අනභිරත සඤ්ඤා** ය, **සබ්බ සංඛාර අනිච්ච සඤ්ඤා** ය, **ආනාපාන සතිය** යන මේවායි.

ආනන්දය, **අනිච්ච සඤ්ඤා** නම් කවරී ද?

ආනන්දය, මේ සසුනෙහි භික්ෂු නමක්, ආරණ්‍යගතව හෝ රුක්මුල් යතව හෝ විවේක ස්ථානයක හිඳ හෝ නුවණින් මෙසේ සලකයි. රූප ස්කන්ධය අනිත්‍ය ය, වේදනා ස්කන්ධය අනිත්‍ය ය, සඤ්ඤා ස්කන්ධය අනිත්‍ය ය, සංඛාර ස්කන්ධය අනිත්‍ය ය, විඤ්ඤාණ ස්කන්ධය අනිත්‍ය ය' යනුවෙනි. මෙසේ මේ පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්හි අනිත්‍ය ස්වභාවය නැවත නැවත බලමින් (ඒ භික්ෂුව) කල් ගෙවයි. ආනන්දය, මෙය **අනිච්ච සඤ්ඤා** ය යි කියනු ලැබේ.

ආනන්දය, **අනත්ත සඤ්ඤා** නම් කවරී ද?

ආනන්දය, "මේ සසුනෙහි භික්ෂු නමක් ආරණ්‍යගතව හෝ රුක්මුල් ගතව හෝ විවේක ස්ථානයකට ගොස් හෝ නුවණින් මෙසේ සලකයි. **ඇස අනාත්ම ය, රූපය අනාත්ම ය, කණ අනාත්ම ය, ශබ්දයෝ අනාත්ම ය, නාසය අනාත්ම ය, ගඳ සුවඳ අනාත්ම ය, දිව අනාත්මය, රස අනාත්මය, මනස අනාත්ම ය, ධර්මයෝ අනාත්ම ය**" යනුවෙනි. මෙසේ මේ ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද සවැදෑරුම් ආයතනයන් කෙරෙහි "මේවා අනාත්ම ලක්ෂණයෙන් යුතු යයි සිතමින් සළකන කරයි. ආනන්දය, මෙය අනත්ත සඤ්ඤා ය යි කියනු ලැබේ.

ආනන්දය, **අසුභ සඤ්ඤා** නම් කවරී ද?

ආනන්දය, මේ සසුනෙහි භික්ෂු නමක් පතුලෙන් උඩ ද කෙස් මතුයෙන් යට ද සම කෙළවර කොට ඇති මේ (මුළු) ශරීරය නන් වැදෑරුම් අපිරිසිදු දෙයින් පිරී ඇත්තේ ය යි නුවණින් සිතා බලයි. ඒ මෙසේය.

මේ (මනුෂ්‍ය) ශරීරය කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩුව, හෘදය මාංශය, අක්මාව, දලබුව, බඩදිව, පෙනහළු, බඩවැල්, අතුණුබහන්, නොපැසූ ආහාර, මල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, තෙල් මන්ද, කඳුළු, වුරුණු තෙල්, කෙළ, සොටු, සඳමිදුළු, මුත්‍රා යන මේ අපිරිසිදු දෙයින් පිරී ඇත. මෙසේ මේ ශරීරයෙහි පවත්නා අශුභයන් අනුව සිතා බලමින් සළකන කරයි.

ආනන්දය, **ආදීනව සඤ්ඤා** කවරී ද?

ආනන්දය, මේ සසුනෙහි භික්ෂු නමක්, ආරණ්‍යගතව හෝ රුක්මුල්ගතව හෝ විවේක ස්ථානයක හිඳ හෝ නුවණින් මෙසේ සලකයි. මේ ශරීරය බොහෝ දුක් ඇත්තේ වෙයි.

බොහෝ ආදීනව ඇත්තේ වෙයි. මේ ශරීරයෙහි නොයෙක් ආබාධයෝ මෙසේ උපදිති. ඒ කවරහු ද යත්:- ඇස් රෝගය, කන් රෝගය, නාසිකා රෝගය, දිව රෝගය, දත් රෝගය, කාසය, ස්වාසය, පීනස, දැවිල්ල, උණ, කුසේ රෝගය, ක්ලාන්තය, අතීසාරය, ඉදිමීම, විසූචිකාව, කුෂ්ඨය, ගඩුය, කිලාසය, සෝසය, අපස්මාරය, දද්දු, කණ්ඩු (කැසිල්ල)ය කච්ඡු (කුෂ්ට)ය, නියපොතු රෝගය, විතච්ඡිකා කුෂ්ඨය, රක්තපිත්තය, මධුමේහය, අංශ රෝගය, පිළිකාව, භගන්දර රෝගය, පිත්රෝග, සෙම් රෝග, වාත රෝග, වා පිත් සෙම් තුන්දෙසින් ඇතිවන සන්නිපාත රෝගය, කාලගුණ වෙනස්වීම් වලින් ඇතිවන රෝග, විෂම ආහාර පාන විහරණ යන් ගෙන් ඇතිවන රෝග, උපක්‍රම වලින් ඇතිවන රෝග, කර්ම විපාකයෙන් ඇතිවන රෝග, සීත රෝග, උෂ්ණ රෝග, සාගින්නෙන් වන රෝග, පිපාසය, අශුචිමල පහකිරීම, මූත්‍රා පහකිරීම්, මෙසේ මේ සිරුරෙහි ආදීනව (අවැඩ) දකුව සිතා බලමින් වාසය කරයි. ආනන්දය:- මෙය **ආදීනව සඤ්ඤා** නම් වේ යයි කියනු ලැබේ.

ආනන්දය, **පහාන සඤ්ඤා** කවරී ද? ආනන්දය මේ සස්නෙහි භික්ෂුවක් (තම සිතෙහි උපන්) **කාමවිතර්කය** නො ඉවසයි. අත්හරියි (එය) දුරු කරයි. නැති කරයි. එය සුන් කරයි. උපන් **ව්‍යාපාද විතර්කය**, නො ඉවසයි අත්හරියි දුරුකරයි නැති කරයි. සුන්කරයි. **උපන් විහිංසා විතර්කය** නොඉවසයි අත්හරියි දුරුකරයි. නැතිකරයි. සුන්කරයි. උපනුපන් අකුසල ධර්මයන් නො ඉවසයි, අත්හරියි, දුරුකෙරෙයි, නැති කෙරෙයි, අභාවයට පමුණුවයි. ආනන්දය මෙය **පහාන සඤ්ඤා** යයි කියනු ලැබේ.

ආනන්දය, **විරාග සඤ්ඤා** නම් කවරී ද? ආනන්දය, මේ සස්නෙහි භික්ෂුනමක් ආරණ්‍යගතව හෝ රුක්මුලගතව හෝ විවේක ස්ථානයක හිඳ හෝ භාවනාවෙන් මෙසේ සලකයි.

"යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු කෙලෙසුන් දුරලීම, තෘෂ්ණාව ක්ෂය කිරීම, (තෘෂ්ණා) නිරෝධය (වැලැක්වීම) නිර්වාණය යන මෙය ශාන්ත ය. ප්‍රණීත ය යි ප්‍රත්‍යවේක්ෂා කෙරේද? ආනන්දය, මෙය **නිරෝධ සඤ්ඤ** යයි කියනු ලැබේ.

ආනන්දය, **සබ්බලෝක අනභිරත සඤ්ඤා** කවරී ද?

ආනන්දය, මේ සස්නෙහි භික්ෂු නමක්, මේ ලෝකයෙහි යම් තෘෂ්ණා දෘෂ්ටි නම් වූ උපායයෝ වෙත් ද යම් උපාදානයෝ වෙත් ද සිත පිළිබඳව සිටි (ගැටුණු) අභිනිවේශයෝ වෙත් ද අනුසය නම් වූ කෙලෙස්හු වෙත් ද ඔවුන් දුරු කරමින්, වැළඳ නොගනිමින් ඒවායින් වැළකෙයි ද යන මෙය **සබ්බලෝක අනභිරත සඤ්ඤා** (මුළු ලොවෙහි නොඇලීමේ හැඟීම) යයි කියනු ලැබේ.

ආනන්දය **සබ්බ සංඛාර අනිච්ච සඤ්ඤා** නම් කවරී ද?

ආනන්දය, මේ සස්නෙහි භික්ෂු නමක් සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් පීඩිත වේ ද ලජ්ජා වේ ද පිළිකුල් කෙරේ ද ආනන්දය, මෙය සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි **අනිච්ච සඤ්ඤා** යයි කියනු ලැබේ.

ආනන්දය, **ආනාපාන සතිය** නම් කවරී ද? ආනන්දය, මේ සස්නෙහි භික්ෂු නමක් ආරණ්‍යගතව හෝ රුක්මූලගතව හෝ විවේක ස්ථානයකට ගොස් හෝ පලක් බැඳ උඩුකය සිහිව කෙලින් තබා ගෙන අරමුණෙහි සිහිය එළඹා ගෙන හිඳියි. ඒ භික්ෂුතෙම සිහියෙන් යුතුව හුස්ම ගනියි. සිහියෙන් යුතුව හුස්ම හෙළයි., දිගට හුස්ම ගන්නා විට දිගට හුස්ම ගනිමියි දනී. දිගට හුස්ම හෙලනුයේ, දිගට හුස්ම හෙළමි යි. දනී. කෙටියට හුස්ම ගන්නේ කෙටිව හුස්ම ගනිමි යි දනී. කෙටිව හුස්ම හෙළනුයේ කෙටිව හුස්ම හෙළමි යි දනී.

සියලු ආශ්වාස කය දන්නේ හුස්ම ගනිමි යි හික්මෙයි. සියලු ප්‍රශ්වාස කය දන්නේ හුස්ම හෙලමියි හික්මෙයි. කාය සංස්කාරය සංසිඳුවන්නෙමි හුස්ම ගනිමි යි හික්මෙයි. කාය සංස්කාරය සංසිඳුවන්නෙමි හුස්ම හෙලමි යි හික්මෙයි. සියලු ආශ්වාස කය දන්නෙමි හුස්ම ගනිමි යි හික්මෙයි. සියලු ප්‍රශ්වාස කය දන්නෙමි හුස්ම හෙලමි යි හික්මෙයි. ඔහත් වූ කාය සංස්කාරය සන්සිඳුවන්නෙමි හුස්ම ගනිමි යි හික්මෙයි. ඔහත් වූ කාය සංස්කාරය සන්සිඳුවන්නෙමි හුස්ම හෙලමි යි හික්මෙයි. ප්‍රීතිය විඳිමින් හුස්ම ගනිමි යි හික්මෙයි. ප්‍රීතිය විඳිමින් හුස්ම හෙලමි යි හික්මෙයි. සුව විඳිමින් හුස්ම ගනිමි යි හික්මෙයි. සුව විඳිමින් හුස්ම හෙලමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය විඳිමින් හුස්ම ගනිමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය විඳිමින් හුස්ම හෙලමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය සන්සිඳුවමින් හුස්ම ගනිමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය සන්සිඳුවමින් හුස්ම හෙලමි යි හික්මෙයි. දැහැන් සිත් පහළ කරමින් හුස්ම ගනිමියි හික්මෙයි. සමාධි විදර්ශනා දකිනා සිත් ප්‍රමෝද කොරමින් හුස්ම ගනිමි යි හික්මෙයි. සමාධි විදර්ශනා දකිනා සිත් ප්‍රමෝද කොරමින් හුස්ම හෙලමි යි හික්මෙයි. දැහැන් අරමුණෙහි සිත පිහිටුවමින් හුස්ම ගනිමි යි හික්මෙයි. දැහැන් අරමුණෙහි සිත පිහිටුවමින් හුස්ම හෙලමි යි හික්මෙයි. නීවරණයන් කෙරෙන් සිත මුදමින් හුස්ම ගනිමි යි හික්මෙයි. නීවරණයන් කෙරෙන් සිත මුදමින් හුස්ම හෙලමි යි හික්මෙයි. (රූපාදියෙහි) අනිත්‍ය ලක්‍ෂණයන් මැනවින් දකිමින් හුස්ම ගනිමි යි හික්මෙයි (රූපාදියෙහි) අනිත්‍ය ලක්‍ෂණ මැනවින් දකිමින් හුස්ම හෙලමි යි හික්මෙයි. විරාගය මැනවින් දකිමින් හුස්ම ගනිමි යි හික්මෙයි. විරාගය මැනවින් දකිමින් හුස්ම හෙලමි යි හික්මෙයි. නිරෝධය මැනවින් දකිමින් හුස්ම ගනිමි යි හික්මෙයි. නිරෝධය මැනවින් දකිමින් හුස්ම හෙලමියි හික්මෙයි. නැවත නැවත කෙලෙස් හැරීම දක්නෙමි හුස්ම ගනිමි යි හික්මෙයි. නැවත නැවත කෙලෙස් හැරීම දක්නෙමි හුස්ම හෙලමි යි හික්මෙයි. ආනන්දය, මේය ආනාපාන සතියයි කියනු ලැබේ.

ඉදින් ආනන්ද, තෝ ගිරිමානන්ද භික්‍ෂුව වෙත එළඹ මේ දස සඤ්ඤාවන් ප්‍රකාශ කරන්නෙහි නම් මේ ප්‍රයෝජනය සැලසෙන්නේය, එනම්, මේ දස සඤ්ඤාවන් අසා ගිරිමානන්ද භික්‍ෂුවගේ එම ආබාධය වහා සන්සිඳෙන්නේය.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙර, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි දී මේ දස සඤ්ඤාවන් උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් වෙත එළඹ මේ දස සඤ්ඤාවන් ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ට කීය. ඉක්බිති ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ගේ එම ආබාධය මේ දස සඤ්ඤාවන් අසා වහා සන්සිඳුණේය. ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ගේ ඒ ආබාධය සහ මුලින්ම දුරුවිය.

# 21. ඉසිගිලි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි පර්වතයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන් ඇමතූ සේක. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, තොපට අර වේභාර පර්වතය පෙනේ ද?" යි භාග්‍යවතුන් වහන්සේ විචාළ සේක. "එසේය, ස්වාමීනි, පෙනේ" යයි භික්ෂූහු කීහ. "මහණෙනි, එම වේභාර පර්වතයට ද (පෙර) වෙනත් නමක් විය. වෙනත් හැඳින්වීමක් විය".

මහණෙනි: තොපට අර පාණ්ඩව පර්වතය පෙනේ ද?
එසේය ස්වාමීනි.

මහණෙනි: එම පාණ්ඩව පර්වතයට ද පෙර වෙනත් නමක් විය.
වෙනත් හැඳින්වීමක් විය.

මහණෙනි, තොපට අර වේපුල්ල පර්වතය පෙනේද?
එසේය. ස්වාමීනි.

මහණෙනි, එම වේපුල්ල පර්වතයට ද (පෙර) වෙනත් නමක් විය.
වෙනත් හැඳින්වීමක් විය.

මහණෙනි, තොපට අර ගිජ්ඣකූට පර්වතය පෙනේ ද?
එසේය, ස්වාමීනි,

මහණෙනි, එම ගිජ්ඣකූට පර්වතයට ද (පෙර) වෙනත් නමක් විය.වෙනත් හැඳින්වීමක් විය.

මහණෙනි. තොපට මේ ඉසිගිලි පර්වතය පෙනේ ද?
එසේය ස්වාමීනි

මහණෙනි, මේ ඉසිගිලි පර්වතයට (පෙර සිට) මේ නාමය ම විය. මේ හැඳින්වීම ම විය.

මහණෙනි, පෙර කාලයෙහි මේ ඉසිගිලි පර්වතයෙහි පසේ බුදුවරු පන්සිය නමක් බොහෝ කලක සිට වාසය කළහ. උන් වහන්සේලා මේ පර්වතයට පිවිසෙනු දක්නා ලැබෙත්. පිවිසි පසු (කොහි ගියාහු දැයි) නොපෙනෙත්. මිනිස්සු ඒ කාරණය නිසා 'මේ පර්වතය මේ සෘෂිවරුන් ගිලියි' යනුවෙන් කියන්ට පටන් ගත්හ. එනිසා මේ පර්වතයට 'ඉසිගිලි-ඉසිගිලි' යන නම ඇතිවිය. මහණෙනි, (එම) පසේ බුදුවරුන්ගේ නාමයන් කියන්නෙමි. මහණෙනි පසේ බුදුවරුන්ගේ නම් පැහැදිලි කරන්නෙමි. එයට ඇහුම්කන් දෙව්. හොඳින් මනසයේ රඳවා ගනිව්. මම එය කියන්නෙමි.

"යහපති ස්වාමීනි" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මහණෙනි, **අරිට්ඨ** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **උපරිට්ඨ** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **තගරසිඛී** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **යසස්සී** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **සුදස්සන** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **පියදස්සී** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **ගන්ධාර** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩ විසීය.
මහණෙනි, **පිණ්ඩෝල** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.
මහණෙනි, **උපාසභ** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.
මහණෙනි, **නීථ** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.
මහණෙනි, **තථ** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.
මහණෙනි, **සුතවා** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.
මහණෙනි, **භාවිතත්ත** නම් පසේ බුදුවරයා මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කලක් වැඩවිසීය.

දුක් පැවැත්ම සිඳු ආශා නැත්තා වූ යම් උතුම් පුද්ගල කෙනෙක් වෙන් වෙන් වශයෙන්ම පමණක් සම්බෝධිය අවබෝධ කළාහු ද (නිවන් පැමිණියාහු ද), කෙලෙස් උල් නොමැත්තා වූ ඒ නරෝත්තමයන්ගේ නම් ප්‍රකාශ කරන මට ඇසුම් කන් දෙව්.

**අරිට්ඨ** ය, **උපරිට්ඨ** ය, **තගරසිඛී** ය, **යසස්සී** ය **සුදස්සන** ය, **පියදස්සී** ය **ගන්ධාර** නම් **බුද්ධ** ය, **පිණ්ඩෝල** ය **උපාසභය**, **නීථ** ය, **තථය**, **සුතවා** ය, **භාවිතත්ත** ය.

**සුම්භ** ය, **සුභ** ය, **මේථුල** ය, **අට්ඨම** ය, (තවද) **මේඝ** ය, **අනීඝ** ය, **සුදාඨ** ය යන **භවතණ්හාව** සුන් කළා වූ (ඉතා ඝන) මහත් ආනුභාව ඇති පසේ බුදුවරු ද **හිංගු** ය, **හිංග** ය.

**ජාලි** බුදුවරු දෙනම ද (චූළ ජාලි, මහාජාලි) **අට්ඨක** බුදුහු ද නැවත **කෝසල** බුදුහු ද **සුබාහු** බුදුහු ද **උපනේමිය**, **නේමිය**, **සන්තචිත්ත**, **සච්ච**, **තථ**, **විරජ**, **පණ්ඩිත** (යන බුදුවරු ද)

**කාල**, **උපකාල**, **විජිත**, **ජිත**, **අංග**, **පංග**, **ගුත්තිජ්ජිත**, යන බුදුවරු ද දුක් මුල් වූ උපධි නම් කෙලෙස් අත් හැරියා වූ **පස්සී** යන බුදුහු ද මාරබලය දිනූ **අපරාජිත** නම් බුදුහු ද

**සත්ථා**, **පවත්තා**, **සරභංග**, **ලෝමහංස**, **උච්චංගමාය**, **අසිත**, **අනාසව**, **මනෝමය**, යන බුදුවරු ද මානය කඩා බිඳ දැමූ **බන්ධුමා**, **තදධිමුත්ත**, **විමල**, **කේතුමා** (යන බුදුවරු ද)

**කේතුම්භරාග**, **මාතංග**, **අරිය**, (තවද) **අච්චුත**, **අච්චුත ගාමබ්‍යාමක**, **සුමංගල**, **දබ්බිල**, **සුප්පතිට්ඨිත**, **අසය්හ**, **ඛේමාභිරත**, **සෝරත** (යන බුදුවරු ද)

**දුරන්නය**, **සංඝ**, (නැවත) **උජ්ජය**, (අපරාජිත වූ) අප්‍රමාණ වීර්ය ඇති **සය්හ**, **ආනන්ද**, **නන්ද**, **උපනන්ද**, යන දොළොස් බුදුහු ද (අවසාන දේහය දරන්නා වූ) **භාරද්වාජ**, (යන බුදුවරු ද)

**බෝධි**, **මහානාම** (නැවත) **උත්තර**, **කේසී**, **සිඛී**, **සුන්දර**, **භාරද්වාජ**, (සසර බැඳුම් සිඳු) **තිස්ස**,

**උපතිස්ස**, **උපසිදරි**, කණිහාර හැඳු **සිදරි** (යන බුදුවරු ද)

පහසාලු ගොලෙස් ඇති **මංගල** නම් බුදුවරයෙක් ද විය.

ජාලිනී නැමැති දුක් මුල නැසූ **උසභ** නම් බුදුවරයා විය. ශාන්තපදය වූ නිවනට පැමිණි **උපනීර** නම් බුදුවරයා විය. **උපෝසථ**, **සුන්දර සච්චනාම**, (යන බුදුවරු ද)

**ජේත**, **ජයන්ත**, **පදුම**, **උප්පල**, **පදුමුත්තර**, **රක්ඛිත**, **පබ්බත**, **මානත්ථද්ධ**, **සෝභිත**, (මොනවට කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති **කණ්හ** නම් බුදුවරයා ද

යන මෙකී උසේ බුදුවරු ද මහානුභාව ඇති වෙනත් පසේ බුදුවරු ද විනාශ කළ භව තණ්හාව ඇති, මහර්ෂි වූ, සියලු රාගාදී කෙලෙසුන් ඉක්ම වූ අනමගී ගුණවත් වූ පිරිනිවුනා වූ (ඒ) පසේ බුදුවරුන්ට වඳිමි.

**දෙවැනි බණ වර නිමි.**

# 22. ධම්මචක්කප්පවත්තන සූත්‍රය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන නම් මුවන්ගේ අභය භූමියෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් අමතා වදාල සේක.

'මහණෙනි, පැවිද්දෙකු විසින් සේවනය නොකළයුතු අන්තයෝ (කරුණු) දෙකක් ඇත. එනම් **කාමසුඛල්ලිකානුයෝගය** (වස්තු කාම ක්ලේශ කාම සැපයෙහි යෙදීම). (ඉන් එකකි). එය ලාමකය, ගම්‍ය වූ ගැමි වූ, පෘථග්ජනය නො දියුණු ජනයාට අයත් වූ, උතුම් නොවන, අවැඩ පිණිස පවතින දෙයකි.

(දෙවැන්න) **අත්ත කිලමථානු යෝගය** (භෝජනය සෙවීමට ශරීරයට දැඩි දුක් දීම) යි. එය දුකට හේතුවන්නකි. උතුම් නොවේ. අවැඩ පිණිස පවතින දෙයකි.

මහණෙනි, එකී අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් **මජ්ඣිමා පටිපද** (මැදුම් පිළිවෙත) අවබෝධ කර ගන්නා ලදී. එය ඥානචක්ෂුස පාදන්නකි. ඥාණය ඇති කරන්නකි කෙලෙස් සංසිඳීම පිණිස, සත්‍යය වටහා ගනු පිණිස, සත්‍යාවබෝධය පිණිස නිවන් පසක් කරනු පිණිස පවතින්නකි.

මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කර ගන්නා ලද ඥානචක්ෂුස පාදන, ඥාණය ඇති කරන, කෙලෙස් සංසිඳවන, සත්‍යය වටහා දෙන, සත්‍යය අවබෝධ කරවන නිවන් පසක් කරවන, එකී මැදුම් පිළිවෙත කවරේ ද? ඒ මේ අට අංග ඇති මග (ආර්ය අෂ්ටාංගික මාර්ගය) යි. ඒ මෙසේය: **සම්මා දිට්ඨි** ය, **සම්මා සංකප්ප** ය, **සම්මා වාචා** ය,

**සම්මා කම්මන්ත ය, සම්මා ආජීව ය, සම්මා වායාම ය, සම්මා සති ය, සම්මා සමාධි ය** යන මේවායි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කර ගන්නා ලද මේ මැදුම් පිළිවෙත නුවණැස පාදන්නායි. නුවණැස ඇති කරන්නායි. කෙලෙස් සංසිඳීම පිණිස සත්‍යය වටහා ගනු පිණිස, සත්‍යාවබෝධය පිණිස නිවන් පසක් කර ගනු පිණිස පවතින්නේය.

මහණෙනි, **දුක්ඛ ආර්ය සත්‍යය** මෙසේයි. **ජාතිය** (උපත) දුකකි. **ජරාව** (මහළුවීම) දුකකි. **ව්‍යාධිය** (ලෙඩ රෝග) දුකකි. **මරණය** දුකකි. **අප්‍රියයන් හා එක්වීම දුකකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම** දුකකි. **කැමැති වන දෙය නොලැබීම** දුකකි. කෙටියෙන් (සඳහන් කරතොත්) පසවැදෑරුම් **උපාදානස්කන්ධයෝ** ම දුක්වෙති.

මහණෙනි, **දුක්ඛ සමුදය** (දුක හට ගැනීමේ හේතුව) ආර්ය සත්‍යය මෙසේ ය. යම් මේ තණ්හාවක් පුනර්භවය (නැවත හටගැනීම) ඇති කරන්නේ ද, ඒ ඒ භවය කෙරෙහි (නන්දිරාගය) ආශාව, ඇලීම පවතී ඇති කෙරේ ද, එම **කාම තණ්හාව** (කාමසැප විඳීමේ ආශාව) යි. **භව තණ්හාව** (භවය සදාකල් පවතී යන සිතීම) එහි ආශාව යි **විභව තණ්හා** (මේ භවයෙන් පසු වෙනත් භවයක් නොවේ යැයි සිතීම නිසා) එහි ආශාව යි යන මේ තෙවැදෑරුම් **තණ්හාව දුක්ඛ සමුදය ආර්ය සත්‍යය** යි.

මහණෙනි, **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය** මෙසේය. ඉහත දක්වන ලද තෙවැදෑරුම් **කාම, භව, විභව තණ්හාවන්** සහමුලින් ම නැසීම, සම්පූර්ණ වැළැක්වීම, මිදීම, ඒ කෙරෙහි නොඇලීම දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නම් වන්නේය.

මහණෙනි, **දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාව** (දුක නැති කිරීමේ මග පිළිබඳ පිළිවෙත) මෙසේ යි, එනම් (ඉහත කී) ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ඒ මෙසේයි. **සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි,** යන මේවායි.

මහණෙනි, මෙය **දුක්ඛ ආර්ය සත්‍යය** යි, පෙර නොඇසූ විරූ ධර්මයන්හි මට නුවණැස පහළ විය, නුවණ ඥානය පහළ විය ප්‍රඥාව පහළ විය, විද්‍යා ඥානය පහළ විය. මෝහය දුරුකරන ඥානාලෝකය පහළවිය. මහණෙනි, ඒ මේ දුක්ඛ ආර්ය සත්‍යය **පිරිසිඳ දත යුත්තේ යයි** මට නුවණැස පහළ විය............. මෝහය දුරුකරන ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ **දුක්ඛ ආර්ය සත්‍යය** (මා විසින්) **පිරිසිඳ දැනගන්නා ලද්දේ** යයි නුවණැස පහළ විය ................ **ඥානාලෝකය** පහළ විය.

මහණෙනි, මේ ඒ **දුක්ඛ සමුදය ආර්ය** සත්‍යයයි. පෙර නො ඇසූ විරූ ධර්මයන් කෙරෙහි මට නුවණැස පහළ විය...... ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ **දුක්ඛ සමුදය ආර්ය** සත්‍යය ප්‍රහීණ කළ යුතුයැයි පෙර ............... මට නුවණැස පහළ විය ...................... ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය ප්‍රහීණ කරන ලදැයි** ............ මට නුවණැස පහළ විය .................. ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ **දුක්ඛ නිරෝධ ආර්ය** සත්‍යයයි ................. මට නුවණැස පහළ විය .................. ඥානාලෝකය පහළ විය.

මහණෙනි: ඒ මේ **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පිරිසිඳ දත යුතු යැයි** ............ මට නුවණැස පහළ විය .................. ඥානාලෝකය පහළ විය.

මහණෙනි: ඒ මේ **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය** පිරිසිඳ දත්තේ යයි ............ මට නුවණැස පහළ විය ..................... ඥානාලෝකය පහළ විය.

මහණෙනි: ඒ මේ **දුක්ඛ නිරෝධ ගාමිනී පටිපද** ආර්ය සත්‍යය යි ........... මට නුවණැස පහළ විය ................. ඥානාලෝකය පහළ විය.

මහණෙනි: ඒ මේ **දුක්ඛ නිරෝධ ගාමිනී පටිපද ආර්ය සත්‍යය පුරුදු පුහුණු කළ යුතු** යැයි ............ මට නුවණැස පහළ විය ........... ඥානාලෝකය පහළ විය.

මහණෙනි: ඒ මේ **දුක්ඛ නිරෝධ ගාමිනී පටිපද ආර්ය සත්‍යය පුරුදු පුහුණු කරන** ලදැයි ............. මට නුවණැස පහළ විය ............ ඥානාලෝකය පහළ විය.

මහණෙනි, මෙසේ සත්‍යය **දැනීම,** එය කළයුතු යයි වටහා ගැනීම, එය කළේය යි දැන ගැනීම (සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන) යන වට **තුණකින්** යුත් **දොළොස් ආකාරයක්** ඇති (ආර්ය සත්‍ය සතර- සත්‍ය, කෘත්‍ය, කෘත, යන ඥාන 3 න් වැඩි කිරීමෙන් ලැබෙන **(4×3- 12)** දොළොස් ආකාරය) චතුරාර්ය සත්‍යයන් ගැන තත්වාකාරයෙන් පිරිසිඳ දැනීම (යථාභූත ඥාන දර්ශනය) යම්තාක් කල් මට පැහැදිලි නොවී ද ඒ තාක් කල් මම දෙවියන්, මාරයන්, බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ද මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි ද අනුත්තර වූ **සම්බුදු බව ප්‍රත්‍යක්ෂ කෙළෙමි** යි. **ප්‍රතිඥා නොකෙළෙමි.**

මහණෙනි, යම් දිනක පටන් මේ වට තුණකින් යුත් දොළොස් ආකාරයක් ඇති උතුම් සත්‍ය සතර ගැන මගේ තත්වාකාර පිරිසිඳ දැනීම ඇතිවී ද එතැන් සිට, මහණෙනි, මම දෙවියන්. මාරයන් බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ද මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි ද "**අනුත්තර වූ සම්බුදු බව ප්‍රත්‍යක්ෂ කෙළෙමි**" යි ප්‍රතිඥා කෙළෙමි. මට පිළිවිද දන්නා නුවණ (ඥාන දර්ශනය) පහළ විය. මගේ අර්හත් ඵල නම් වූ චිත්ත මිදීම (චේතෝ විමුක්තිය) නැවත නොසෙල්වෙන සේ ස්ථිරව පිහිටියේය. මේ අවසන් උපත (ජාති) යි. නැවත භවෝත්පත්තියක් මෙතැන් සිට මා සම්බන්ධයෙන් නැවත නැත්තේය."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. සතුටු සිතැති පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

මේ සූත්‍ර ධර්මය වදාළ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ තෙරුන්ට රාගාදී කෙලෙස් රහිත වූ, පහ වූ කෙලෙස් මල ඇති, දහම් ඇස පහළ විය. (සෝවාන් මග නුවණ පහළ විය) ඒ කෙසේද යත් "**යම් කිසිවක් හටගැනීම (සමුදය) ස්වභාවය කොට ඇත්තේ ද ඒ සියල්ල නැතිවීම (නිරෝධය) ස්වභාවය කොට ඇත්තේය**" යනුවෙනි.

භාග්‍යවතුන් වහන්සේ විසින් දම්සක (ධර්ම චක්‍රය) පවත්වන ලද කල්හි, **භූමාටු** (බිම සිටින) **දෙවියෝ** සාධු කාර දුන්හ. කෙසේද යත්: වෙනත් මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි වෙනත් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි වූ අනුත්තර වූ ධර්ම චක්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පවත්වන ලදී යනුවෙන් කියමින් **භූමාටු දෙවියෝ සාධුකාර දුන්හ**.

භූමාටු දෙවියන්ගේ සාධුකාර නාදය අසා **චාතුර්මහාරාජික දෙවියෝ**: වෙනත් මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ ...... ලෝකයෙහි වෙනත් කිසිවෙකු විසින් හෝ

නොපැවැත්විය හැකි වූ අනුත්තර වූ ධර්ම චක්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පවත්වන ලද්දේ යි කියා **(සිව් වරම් මහ රජ දෙවියෝ) සාධු කාර දුන්හ.**

සිව්වරම් දෙවියන්ගේ සාධුකාර නාදය අසා **තව්තිසා වැසි දෙවියෝ** ............ ලෝකයෙහි වෙනස් .................. සාධුකාර දුන්හ ..................

තව්තිසා වැසි දෙවියන්ගේ සාධු කාර නාදය අසා **යාමදෙව් දෙවියෝ** සාධු කාර දුන්හ.

යාමදෙව් දෙවියන්ගේ සාධුකාර නාදය අසා **තුසිත දෙවියෝ**. තුසිතයන්ගේ සාධුකාර නාදය අසා **නිම්මාණරතී** දෙවියෝ මොවුන්ගේ සාධු නාදය අසා **පරනිම්මිත වසවත්ති** දෙවියෝ, **බ්‍රහ්ම පාරිසජ්ජ** දෙවියෝ, **බ්‍රහ්ම පුරෝහිත** දෙවියෝ **මහා බ්‍රහ්මදෙවියෝ**, **පරිත්තාභා** දෙවියෝ, **අප්පමාණාභා** දෙවියෝ **ආභස්සර** දෙවියෝ **පරිත්තසුභා** දෙවියෝ **අප්පමාණසුභා** දෙවියෝ **සුභකිණ්හක** දෙවියෝ **වෙහප්ඵල** දෙවියෝ, **අවිහ** දෙවියෝ, **අතප්ප** දෙවියෝ, **සුදස්ස** දෙවියෝ, **සුදස්සී** දෙවියෝ **අකනිට්ඨක** දෙවියෝ යන **මොවුහු සාධුකාර දුන්හ**.

මේ අයුරින් එකෙණෙහි, ඒ මොහොතෙහි බඹලොව දක්වා (දෙව් ඹම් ශිඛරයේ ආදී) ශබ්දය වේගයෙන් පැතිර ගියේය. මේ දස දහසක් ලෝක ධාතුව සෙලවී ගියේය. චලනය වී ගියේය. අතිශයින් කම්පිත වූයේය. දෙවියන්ගේ දිව්‍යානුභාවය ඉක්මවා අප්‍රමාණ වූ උදාර වූ ආලෝකයක් ලෝකයෙහි පහළ විය.

ඉක්බිති භාගවතුන් වහන්සේ 'භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් චතුරාර්ය සත්‍යය දැන්නේය. භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කළේය' යි ප්‍රීති වාක්‍යයක් පැවසූ සේක.

මේ කාරණය නිසා ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන්ට අඤ්ඤාකොණ්ඩඤ්ඤ යන නම විය.

## 23. මහාසමය සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර අසළ මහාවනයෙහි පන්සියයක් රහතුන් වහන්සේ සමඟ වාසය කරන සේක. භාගවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් දැකීම පිණිස දස දහසක් ලෝක ධාතුවලින් දෙවියෝ ද බොහෝවින් රැස්ව සිටියහ.

ඉක්බිති ශුද්ධාවාස බ්‍රහ්ම නිකායට අයත් බ්‍රහ්ම දෙවියන් සතර දෙනෙකුට මෙබඳු අදහසක් පහළ විය. භාගාවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් රහත් භික්ෂු පිරිසක් සමග ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර මහ වනයෙහි වසන සේක. භාගාවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් දකිනු පිණිස දස දහසක් ලෝක ධාතුවලින් දෙවියෝ ද බොහෝවින් රැස්ව සිටිති. අපි ද භාගාවතුන් වහන්සේ වැඩ සිටින තැනට එළඹ එක් එක් ගාථාව බැගින් කියන්නොහු නම් ඉතා මැනවි. ඉක්බිති ඒ දෙවියෝ ශක්තිමත් පුරුෂයෙකු වක් කරන ලද අතක් දිග හරින්නා සේ නැතහොත් දිග හරින ලද අතක් වක් කරන්නා සේ (ඉතා ඉක්මනින්) ශුද්ධාවාස දෙව්ලොවින් අතුරුදහන්ව භාගාවතුන් වහන්සේ ඉදිරිපිට පෙනී සිටියාහුය.

ඉක්බිති ඒ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසව සිටියහ. ඔවුනතුරෙන් එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ ළඟ සිට මේ ගාථාව කීය.

"මහවනයෙහි රැස්වීමකි. දිව්‍ය සමූහයා එක් රැස්ව ඇත. නොපරදවන ලද ආර්ය මහා සංඝයා දකිනු පිණිස මේ දහම් සභාවට (අපි ද) ආවෙමු".

ඉක්බිති වෙනත් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

"ඒ දහම් සභාවෙහි භික්ෂූහු තම සිත එකඟ කළාහුය. සෘජු කළාහුය. රියැදුරෙකු රැහැන් අල්ලා ගෙන අශ්වයන් හික්මවන්නාක් මෙන් නුවණැත්තෝ තම ඉන්ද්‍රියන් හික්මවා ගෙන රකිති".

අනතුරුව තවත් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

"කෙලෙස් නැමැති ඇල කපා දමා, යකඩ ඉල (ඝනායම්) සිඳ දමා රාගාදි ඉන්ද්‍රඛීලය (නොවෙත් නගර දොරටුව සවිකරනු පිණිස සිටුවා ඇති කණුව) උගුල්ලා දමා සැලුන් ඇති බුදුන් විසින් හික්මවන ලද, තෘෂ්ණා රහිත, පිරිසිදු, මනාව සත්පුරුෂ වූ ඒ තරුණ රහතන් වහන්සේලා (ලොවෙහි) හැසිරෙති".

ඉක්බිති වෙනත් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

"යම්කිසි බුදුන් සරණ ගියාහු ද ඔවුහු අපායට නොයති. මරණින් පසු දෙවියන් ලෙස උපත ලබති. (දෙව් ලොව පුරවති)".

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක. "මහණෙනි, තථාගතයන් වහන්සේත් භික්ෂු සංඝයාත් දකිනු පිණිස දස දහසක් ලෝකවල දෙවියෝ රැස්ව සිටිති. මා දකිනු පිණිස දැන් මේ දෙවියන් රැස්ව සිටින්නාක් මෙන් අතීතයෙහි යම් අර්හත් සම්බුද්ධ වහන්සේලා විසූවාහු ද උන්වහන්සේ දැකීමට ද මෙපමණම දෙවියෝ රැස්වූහ."

"මහණෙනි, අනාගත කාලයෙහි යම් අර්හත් සම්මා සම්බුද්ධවරු පහළ වන්නාහු ද උන්වහන්සේ දැකීමට ද දැන් මට මෙන් මෙපමණම දෙවියෝ රැස් වන්නාහුය".

"මහණෙනි, දිව්‍ය සමූහයාගේ නම් කියන්නෙමි. මහණෙනි, දිව්‍ය සමූහයාගේ නාම වර්ණනා කරන්නෙමි. එය හොඳින් අසව්. මනාකොට සිහියේ තබා ගනිව්".

"එසේය, යහපති, ස්වාමීනි" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙසූ සේක.

"ඒ ඒ තැන් ඇසුරු කළ භූමාටු දෙවියෝ යම් තැනක රැස්ව සිටිත් ද (ඔවුන් ඉදිරියෙහි) සියල්ලන් කියන්නෙමි.

"භාවනාවට යොමු කරන ලද සිත් ඇත්තා වූ සත්පුරුෂ සිත් ඇත්තා වූ ලොමු දැහැගැන්ම මැඩ පැවැත් වූ පිරිසිදු සිත් ඇත්තා වූ, රාගාදියෙන් නොකැලැල් වූ පිරිසිදු සිත් ඇත්තා වූ බොහෝ රහතන් වහන්සේලා කේසර සිංහ රාජයන් මෙන් පර්වත ගුහා ඇසුරු කොට වාසය කරති".

ඉක්බිති ශාස්තෘන් වහන්සේ කිඹුල්වත් පුර මහවනයෙහි රැස්ව සිටි බුද්ධ සඟුන්හි

ඇලුණා වූ ගණනින් පන්සියයකට වැඩි වූ ශ්‍රාවකයන් අමතා වදාළ සේක. "මහණෙනි, දිව්‍ය සමූහයා රැස්වූවාහුය. ඒ දිව්‍ය සමූහයා හඳුනා ගනිව්. ඒ භික්ෂූහු ද බුදුන්ගේ හස්න අසා වීර්යය කළහ.

ඒ භික්ෂූන්ට දේව ආදී අමනුෂ්‍යයන් දැකීමට ඥානය පහළ විය. ඇතැම් රහතුන් අමනුෂ්‍යයන් සියයක් දුටහ. ඇතැම්හු දහසක් ද ඇතැම්හු හැත්තෑ දහසක් ද දුටහ.

සමහර රහත්හු අමනුෂ්‍යයන් සියක් දහසක් දුටහ. සමහරු ගණන් සීමාවක් නොකළ හැකි අමනුෂ්‍යයන් දුටහ. සියලු දිශාවන් දේව ආදී අමනුෂ්‍යයන්ගෙන් පිරී පැවැති හෙයිනි.

පසැස් ඇත්තා වූ ශාස්තෘන් වහන්සේ ඒ සියල්ල විශිෂ්ට ඥානයෙන් දැන, නිරණය කොට නැවත සස්නෙහි ඇලුනා වූ (ඒ) ශ්‍රාවක භික්ෂූන් ඇමතූ සේක.

'මහණෙනි, දිව්‍ය සමූහයා රැස්වූහ. මම තොපට ඔවුන් ගැන පිළිවෙළින් පවසන්නෙමි. ඔවුන් දැන හැඳින ගනිව්'.

කිඹුල්වත් පුරවර වාසය කරන්නා වූ, සෘද්ධි ඇත්තා වූ බබලන්නා වූ ශරීර වර්ණයෙන් යුක්ත වූ, යසස් ඇත්තා වූ භූමිවාසී යක්ෂයෝ දහසක් දෙනා සන්තෝෂයෙන් භික්ෂූන් රැස් වූ වනයට පැමිණියාහුය.

හිමාලයෙහි වසන්නා වූ නන් වැදෑරුම් ශරීර ප්‍රභාවෙන් යුක්ත වූ සෘද්ධිමත් වූ ආනුභාව සම්පන්න වූ, දිව්‍යමය වර්ණයෙන් යුක්ත වූ, පිරිවර සමූහයා ගෙන් යුක්ත වූ සදහසක් යක්ෂයෝ භික්ෂූන් රැස් වූ වනයට පැමිණියාහු ය.

නන් වැදෑරුම් ශරීර ප්‍රභාවෙන් බබලන්නා වූ, සෘද්ධිමත් වූ කාන්තියෙන් යුක්ත වූ වර්ණයෙන් යුක්ත වූ පිරිවර ඇත්තා වූ සාතාගිරි පර්වතයෙහි වාසය කරන තුන් දහසක් යක්ෂයෝ භික්ෂූන් රැස් වූ වනයට පැමිණියාහු ය.

මෙසේ නන් වැදෑරුම් ශරීර ප්‍රභාවෙන් බබලන්නා වූ සෘද්ධිමත් වූ කාන්තිමත් වූ වර්ණවත් වූ යසස් ඇත්තා වූ යක්ෂයෝ සොළොස් දහසක් දෙනා භික්ෂූන් රැස් වූ වනයට පැමිණියාහු ය.
නන් වැදෑරුම් ශරීර ප්‍රභාවෙන් බබලන්නා වූ සෘද්ධිමත් වූ කාන්තිමත් වූ වර්ණවත් වූ යසස් ඇත්තා වූ වෙස්සාමිත්ත (පර්වත) වාසී වූ පන්සියයක් යක්ෂයෝ සතුටු සිතින් භික්ෂූන් රැස් වූ වනයට පැමිණියාහු ය.

රජගහ නුවර උපන් කුම්භීර නම් යක් සෙනෙවියෙක් ඇත. ඔහුගේ වාසස්ථානය වේපුල්ල පර්වතයයි. සියක් දහසකට වැඩි යක්පිරිසක් ඔහු ඇසුරු කරති. රජගහ උපන් ඒ කුම්භීරයා ද වනයෙහි රැස්වීමට පැමිණියේ ය.

පෙරදිග රජ වූ ධතරට්ඨ තෙමේ ඒ පෙරදිග පාලනයට අනුශාසනා කරයි. යසස් ඇති මහු ගාන්ධර්වයන්ගේ අධිපතියා වෙයි.

මහත්බල ඇත්තා වූ සෘද්ධිමත් වූ කාන්ති ඇත්තා වූ නොයෙක් පැහැ ඇත්තා වූ පිරිවර ඇත්තා වූ ඉන්ද්‍ර නාමින් හැඳින්වෙන්නා වූ බොහෝ පුත්‍රයෝ ඔහුට ඇත්තාහ. ඔව්හු ද ඉතා සතුටින් භික්ෂූන්ගේ සමාගමයට, වනයට පැමිණියහ.

දකුණු දිශාවෙහි රජ වූ විරූළ්හ තෙමේ ඒ දිශාව පාලනයට අනුශාසනා කරයි. කුම්භාණ්ඩයන්ගේ අධිපති වූ යසස් ඇති මහරජ මොහු ය.

මහත්බල ඇති, සෘද්ධිමත්, කාන්ති ඇති, වර්ණවත්, යසස් ඇති ඉන්ද්‍ර නමින් හැඳින්වෙන බොහෝ පුත්‍රයෝ ඔහුට වෙති. ඔවුහු ද ඉතා සතුටින් භික්ෂූන්ගේ සමිතියට, වනයට පැමිණියහ.

බටහිර දිශාවෙහි රජ වූ විරූපාක්ෂ තෙමේ ඒ දිශාව පාලනයට අනුශාසනා කරයි. නාගයන්ගේ අධිපති යසස් ඇති මහරජ මොහුය.

මහත් බල ඇති, සෘද්ධිමත්, කාන්ති ඇති, වර්ණවත්, යසස් ඇති ඉන්ද්‍ර නමින් හැඳින්වෙන බොහෝ පුත්‍රයෝ ඔහුට වෙති. ඔවුහු ද ඉතා සතුටින් භික්ෂූන්ගේ සමිතියට වනයට පැමිණියහ.

උතුරු දිසාවෙහි රජ වූ කුවේර තෙමේ ඒ දිශා පාලනයට අනුශාසනා කරයි. යක්ෂයන්ගේ අධිපති වූ යසස් ඇති මහරජ මොහුය.

මහත් බල ඇති, සෘද්ධිමත්, කාන්ති ඇති, වර්ණවත්, යසස් ඇති, ඉන්ද්‍ර නමින් හැඳින්වෙන බොහෝ පුත්‍රයෝ ඔහුට වෙති. ඔවුහු ද ඉතා සතුටින් භික්ෂු සමිතියට වනයට පැමිණියහ.

පෙරදිග ධෘතරාෂ්ට්‍ර ද දකුණු දිග විරූළ්හක ද බටහිර දිග විරූපාක්ෂ ද උතුරු දිග කුවේර ද යන මේ සතරවරම් මහරජවරු සිව්දිසින් හාත්පසින් (පැමිණ) කපිලවාස්තු වනයෙහි මහත් වූ ආලෝකය පතුරුවමින් සිටියාහු ය.

ඔවුන්ගේ මායා දන්නා වූ වංචාකාර වූ කපටිකා වූ දාසයෝ ද මායාකාර වූ කුටෙණ්ඩු, වෙටෙණ්ඩු, විටුච්ච, සහ විටුඩ තෙමේ ද ආවේය.

චන්දන, කාමසෙට්ඨ, කින්නුඝණ්ඩු, නිඝණ්ඩු, පනාද, ඕපමඤ්ඤ යන උය ද දෙව් රියැදුරු මාතලී ද ගාන්ධර්ව චිත්තසේන ද නළරාජ ද ජනෝසභ ද පඤ්චසිඛ ද තිම්බරු සහ සූරියවච්චසා ද පැමිණියාහුය.

(ඇතැ සි) රජවරු ද, වෙනත් ගන්ධර්වයෝ ද රජුන් සමග ප්‍රීතියෙන් භික්ෂු සමාගමයට පැමිණියහ.

ඉක්බිති නාභස විල වැසි නාගයෝ ද විසාලා වැසි නාගයෝ ද තච්ඡක නම් නාග පිරිස සමග ආවෝය. කම්බල අස්සතර දෙකුලයෙහි නාගයෝ ද ප්‍රයාග තීර්ථයෙහි නාගයෝ ද නෑයන් සමග ආවෝය. යසස් ඇති යමුනා නාගයෝ ද ධතරට්ඨ නාගයෝ ද ආවෝය. ඒරාවණ නම් මහා නාගයා ද භික්ෂු සමාගමයට එළඹියේය.

යම් කෙනෙක් නාගරාජයන් සැහැසිව ගෙන යත් ද දිව්‍යානුභාව ඇති දෙවරක් උපන් හෙයින් ද්විජ නම් වූ පියාපත් ඇති පිරිසිදු ඇස් ඇති, ඒ පක්ෂීහු ද අහසින් වන මැදට පැමිණියාහු ය. චිත්‍ර සහ සුපර්ණ යනු එම ගරුඩ පක්ෂීන්ගේ නාමයෝ යි.

එකල්හි නා රජුන්ට (ගුරුළන්ගෙන්) අභය ලැබිණ. බුදුන් වහන්සේ ගුරුළන්ගෙන් (නාගයන්ට) නිදහස ලබා දුන් සේක. නාගයෝ ද ගුරුළෝ ද මුදු මොළොක් වචන වලින් කැඳවීම් ලැබ බුදුන් සරණ ගියහ.

විදුරැවි ගත් අත් ඇත්තා (සක්දෙව්රජ) විසින් මුහුදු ඇසුරු කොට ජීවත් වූ අසුරයෝ පරදවන ලදහ.

මවුහු (ඒ අසුරයෝ) වාසවගේ හෙවත් සක්දෙව් රජුගේ ම සෘද්ධිමත්, යසස් ඇති සහෝදරයෝ වෙති.

(ඔවුනතුරෙහි) මහත් බියකරු වූ කාලකඤ්ජ අසුරයෝ ද දානවේඝස අසුරයෝ ද වේපචිත්ති, සුචිත්ති, පහාරද යන අසුරයෝ ද නමුචී නම් වසවත් මරු ද සමග ආවෝය. සියල්ලෝ බලි අසුරයාගේ පුතුන් සියයක් ද බලි සේනාව ද සැදීව පැරණි රාහුභද්‍ර නම් අසුරයා කරා පැමිණියහ. 'ඔබට යහපතක් වේවා, භික්ෂූන්ගේ වන සමාගමයට යාමට දැන් සුදුසු වේලාවයි' යයි (කීහ).

ආපෝ දේවතාවෝ ද පඨවි දේවතාවෝ ද තේජෝ දේවතාවෝ ද වායෝ දේවතාවෝ ද වරුණ දේවතාවෝ ද වාරුණ දේවතාවෝ ද සෝම දෙවි ද යස නම් දෙවියන් සමග එද පැමිණියාහ.

යසස් ඇත්තා වූ මෙත්තා කායික, කරුණා කායික දෙවියෝ ද ආවාහුය. සියල්ලෝම නානා වර්ණයෙන් වූ දසවැදෑරුම් වූ සෘද්ධි ඇත්තා වූ කාන්ති ඇත්තා වූ වර්ණවත් වූ යසස් ඇත්තා වූ මේ දස වැදෑරුම් දිව්‍ය සමූහයා සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට පැමිණියහ.

වෙණ්ඩු දෙවියෝ ද, සහලි දෙවියෝ ද අසම දෙවියෝ ද යම දෙවියෝ දෙදෙනා ද චන්ද්‍රයා පෙරටු කරගත් චන්ද්‍රයා ඇසුරු කරන දෙවියෝ ද රැස්වූහ.

හිරු ඇසුරු කරන දෙවියෝ ද හිරු පෙරටු කරගෙන ආවෝ ය. මන්දවලාහක දෙවියෝ නැකැත් තරු පෙරටු කරගෙන ආවෝය.

එකී දෙවියන් ට ශ්‍රේෂ්ඨ වූ වාසව යන නම් ලද පුරින්දද නම් වූ සක් දෙව් රජ ද ආවේය. සියල්ලෝම නානාවර්ණ ඇත්තා වූ සෘද්ධිමත් වූ කාන්ති ඇත්තාවූ ශරීර වර්ණ ඇත්තා වූ මේ දස දෙන දස කණ්ඩායමක් ව සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට ආවෝය.

සලි දිලියෙන ගිනි සිළු වැනි සහභූ දෙවියෝ ද දියබෙරලිය මල් පැහැයෙන් බබලන අරිට්ඨක දෙවියෝ ද රෝජ දෙවියෝ ද පැමිණියෝය.

වරුණ සහධම්ම, අච්චුත, අනේජක, සූලෙය්‍යරුචිර, යන දෙවියෝ ද ආහ. වාසව නේසි නම් දෙවියෝ ද ආහ.

සෘද්ධිමත් වූ බබලන්නා වූ වර්ණ ඇත්තා වූ යසස් ඇත්තා වූ දස කණ්ඩායමකට බෙදුන ඒ දස දෙනා සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට පැමිණියාහුය.

සමාන, මහාසමාන, මානුස, මානුසුත්තම යන දෙවියෝ ආහ. ඛිඩ්ඩාපදූසික, මනෝපදූසික දෙවියෝ ද ආහ.

එලි හරි දෙවියෝ ද ලෝහිත වාසී දෙවියෝ ද ආහ. පාරග, මහාපාරග නාම වූ යසස් ඇති දෙවියෝ ද ආහ. සෘද්ධිමත් වූ බබලන්නා වූ වර්ණවත් වූ යසස් ඇත්තා වූ දස කණ්ඩායමක් වූ ඒ දසදෙනා සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට පැමිණියාහුය.

සුක්ක, කරුම්භ, අරුණ යන දෙවියෝ වේඝනස දෙවියන් සමග ආවෝය. ප්‍රධාන ඕදාත ගය්හ දෙවියෝ ද විචක්ඛණ දෙවියෝ ද ආවෝය.

සදාමත්ත, හාරගජ, යන දෙවිවරු ද යසස් ඇති මිස්සක දෙවියෝ ද පැමිණහු ය. දිශාවන්හි වැසි වස්සන පජ්ජුන්න දෙවියා ද මේඝනාද කරමින් ආවේය.

සියල්ලෝම නානාවර්ණවත් වූ දස වැදෑරුම් වූ, පැහැපත් ඇත්තා වූ කාන්ති ඇත්තා වූ, වර්ණවත් වූ, යසස් ඇත්තා වූ මේ දස වැදෑරුම් දිව්‍ය සමූහයා සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට පැමිණියෝ ය.

ඛේමිය, තුසිත, යාම, යසස් ඇති කට්ඨක, ලම්බීතක, ලාමසෙට්ඨ, ජෝති ආසව, යන දෙවිවරු ආහ.

නිම්මානරතී දෙවිවරු ආහ. පරනිම්මිත (වසවත්ති) දෙවිවරු ආහ. සියල්ලෝම නානාවර්ණවත් වූ දස වැදෑරුම් වූ පැහැපත් ඇත්තා වූ කාන්ති ඇත්තා වූ වර්ණවත් වූ යසස් ඇත්තා වූ මේ දස වැදෑරුම් දිව්‍ය සමූහයා සතුටින් භික්ෂූන්ගේ වන සමාගමයට ආහ.

නොයෙක් ප්‍රභාවයෙන් යුත් මේ දිව්‍ය සමූහයා පැමිණෙන සත් නමින්ගේ නාම වශයෙන් ආවෝය. මීට සමාන නම් ඇති වෙනත් දෙවිවරු ද ඔවුන් සමග ආහ.

වපුරා නිමවන ලද සසර වාසය ඇති, කෙලෙස් උල් රහිත, සතර සැඩ පහරින් එතර වූ ආශ්‍රව රහිත වූ ආර්ය සඞ්ඝයා ද සත් අගතියට නොයන හෙයින් නාග නම් වූ කළු පැල්ලම් ගෙවුන් වූ පුන්සඳ වැනි බුදුන් දකින්නෙමු යයි (ඔවුහු ආහ).

සෘද්ධිමතාගේ පුත් වූ සුබ්‍රහ්ම, පරමත්ත (යන බ්‍රහ්මයෝ) ආහ. සනංකුමාර ද ඒ ප්‍රසිද්ධ තිස්ස බ්‍රහ්මයා ද භික්ෂූන්ගේ වන සමාගමයට ආහ.

මහබ්‍රහ්ම දහසක් ආහ. ඒ එක් එක් වශයෙන් බඹලොව උපන්නෙකි. ආනුභාව සම්පන්නය, මහාකායක් ඇත්තේය, යසස් ඇත්තේය. අනෙක් බඹුන් මැඩ ගෙන සිටියි.

ඒ බඹ පිරිස අතුරෙහි වෙන් වෙන් වශයෙන් තම පිරිස වසග කොට ගෙන සිටින අධිපති වූ බ්‍රහ්මයෝ දස දෙනෙක් ආහ. ඔවුන් මැද බඹුන් විසින් පිරිවරන ලද හාරිත නම් බ්‍රහ්මයා . ද ආවේය.

මහවනයට පැමිණියා වූ ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයන් සහිත ඒ සියලු දෙවියන් වෙතට මාර සේනාව පැමිණියාය. කණ්හ නම් මාරයාගේ මෝඩකම දෙස බලව්. "එව්, අල්වා ගනිව්, (රාග පාශයෙන්) බඳිව්, මේ සියලු දෙනා රාග පාශයෙන් බඳිනා ලද්දහු වෙත්වා. හාත්පසින් වට කරව්. කොහෙ ඇතුරෙන් කිසිවෙක් ඒ දෙව් පිරිසෙන් කිසිවකු මිදෙ නොහැරිව්". මෙසේ මහාසේන (වසවත්මාර) තෙමේ අත්ලෙන් පොළෝ තලයට ගසා බිහිසුණු ශබ්දයක් කොට මාර සේනාව ඒ දෙව් පිරිස මැදට යැවීය.

එනමුත් හෙතෙම ඒ දෙව් පිරිස තම වසගට ගත නොහැකිව වැසි කාලයෙහි විදුලි කෙටීම හා ගොරවන මහා මේඝයක් (වැහි වළාකුළක්) සේ බොහොවින් කිපී පසුබැස ගියේය.

ඉක්බිති පැණසැස් ඇත්තා වූ ශාස්තෘන් වහන්සේ ඒ සියල්ල නිරීක්ෂණය කොට මනාලෙස දැන ගෙන සසුනෙහි ඇලුණා වූ (තම) ශ්‍රාවකයන් ඇමතූ සේක.

"මහණෙනි, මාර සේනාව පැමිණියේය. ඔවුන් හඳුනා ගනිව්", ඒ භික්ෂූහු ද බුදුන්ගේ අනුශාසනය අසා වීර්ය කළහ.

(එවිට) මාරසේනාවෝ වීතරාගී ආර්යයන් වහන්සේ කෙරෙන් පහව පලා ගියහ. ඒ උතුමන්ගේ ලොම් ගසක් සෙලවීමටවත් අසමත් වූහ.

මාර යුදයෙන් දිනූ සිය රතික වූ යසස් ඇත්තා වූ ජනයාගේ අතුරෙහි ප්‍රසිද්ධ වූ ඒ සියලු බුදුවරුන්ගේ බෝධි කාර්ය ගුණයන් සමග තුටුවෙති.

# 24. ආලවක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාගවතුන් වහන්සේ අලව් නුවර ආලවක යක්ෂයාගේ භවනයෙහි වැඩ වසන සේක. ඉක්බිති අලව්යක් තෙමේ භාගවතුන් වහන්සේ වැඩහුන් තැනට එළඹ භාගවතුන් වහන්සේට මෙසේ කීය.

"මහණ, මගේ (විමානයෙන්) පිටව යව".
'යහපති, යහපති", යි කියා භාගවතුන් වහන්සේ පිට වූ සේක.
(නැවතත් අලව්යක් තෙමේ)
"මගේ විමානයට පිවිසෙව, මහණ" යි කීය.
"යහපති යහපති" යි කියා භාගවතුන් වහන්සේ පිවිසි සේක.
දෙවන වරට ද අලව්යක් තෙමේ භාගවතුන් වහන්සේට මෙසේ කීය.
"මහණ පිටවෙව"
'යහපති, යහපති,' යි භාගවතුන් වහන්සේ පිට වූ සේක.
"මහණ පිවිසෙව" යි තෙවන වරට ද අලව්යකා කීය.
'යහපති යහපති', යි භාගවතුන් වහන්සේ පිවිසි සේක.
"මහණ පිටවෙව", යි අලව් යක් තෙමේ සිව්වන වරට ද කීය.
'යහපතිව, මම පිට නොවන්නෙමි. නුඹට පුළුවන් දෙයක් කරව", යි භාගවතුන් වහන්සේ වදාළ සේක.

'මහණ, මම තාගෙන් ප්‍රශ්නයක් අසන්නෙමි. ඉදින් පිළිතුරු නොදෙන්නෙහි නම් තාගේ සිත පෙරළන්නෙමි. හදවත පළන්නෙමි. දෙපාවලින් ගෙන ගඟෙන් එගොඩට විසි කරන්නෙමි".(යි ආලවක කීය).

"යහපතිව, දෙවියන් බඹුන්, මහණ බමුණන් හා දෙව් මිනිසුන් සහිත මේ මුළු ලොවෙහි මගේ සිත පෙරළන්නට හෝ හදවත පළන්නට හෝ මගේ දෙපාවලින් ගෙන ගඟෙන් එගොඩට විසි කරන්නට හෝ හැකි කෙනෙකු මම දැක නැත්තෙමි. 'යහපතිව, තුඹ කැමැති ඕනෑම ප්‍රශ්නයක් අසව' (යි භාගවතුන් වහන්සේ වදාළසේක).

එවිට අලව් යක් තෙමේ භාගවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ කීය.

'මෙලොව වසන මිනිසාට ඇති උතුම් වස්තුව කුමක් ද? කුමක් පුරුදු කළ විට සැපගෙන දෙයි ද? කුමන දෙයක් ඉතා රසවත් වේ ද? කෙසේ දිවි ගෙවන්නාගේ ජීවිතය උතුම් වේ ද?'

මෙලොව වසන මිනිසාට ඇති උතුම් වස්තුව ශ්‍රද්ධාව යි. කුසල් දහම් පුරුදු කළවිට සැප ගෙන දෙයි. සත්‍ය වචනය ඉතා රසවත් දෙයයි. නුවණින් ජීවත්වීම උතුම් ජීවිතයයි (යනුවෙන් භාගවතුන් වහන්සේ පිළිතුරු දුන් සේක).

'සැඩ පහරින් එතෙර වන්නේ කෙසේ ද? සාගරය තරණය කරන්නේ කෙසේ ද? දුක නැති කරන්නේ කෙසේ ද? පිරිසිදු වන්නේ කෙසේ ද? (අලව් යකා ඇසීය).

සැඩ පහරින් එතෙර වනුයේ සැදැහැයෙනි. සාගරය තරණය කරනුයේ කුසල් දහම්හි පමා නොවීමෙනි. දුක නැති කරනුයේ වීර්යයෙනි. පිරිසිදු වනුයේ ප්‍රඥාවෙනි (යි භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දුන් සේක.

ප්‍රඥාව ලබන්නේ කෙසේ ද? ධනය ලබන්නේ කෙසේ ද? කීර්තියට පැමිණෙන්නේ කෙසේ ද? මිතුරන් දිනා ගන්නේ කෙසේ ද? ශෝකයෙන් තොරව මෙලොවින් පරලොව යා හැක්කේ කෙසේ ද? (යි අලව් යක් ඇසීය).

අප්‍රමාදීව නුවණින් කටයුතු කිරීම, රහතුන්ගේ පදහම් ඇදහීම, ඥානවන්තයන්ගේ බසට සවන්දීම, යන මේවායින් ප්‍රඥාව ලැබිය හැකිය.

ගැළපෙන යහපත් ක්‍රියාවන්හි දැඩි උත්සාහයෙන් යෙදෙන නොපසුබට දිරියෙන් යුත් නැණැත්තා ධනය ලබයි. සත්‍යවාදී බැවින් කීර්තිය ලබා ගත හැකිය. පරිත්‍යාග කරන්නාට මිතුරන් දිනා ගත හැකිය.

සත්‍යවාදී බව, ඉඳුරන් දමනය, ධෛර්යය, පරිත්‍යාගශීලී බව, යන ගුණ දහම් සතරින් යුතු සැදැහැති ගිහියා ශෝකයෙන් තොරව මෙලොවින් පරලොව යයි

සත්‍යවාදී බව, ඉන්ද්‍රිය දමනය, ධෛර්යය, පරිත්‍යාගශීලීකම, ඉවසීම, යන මේවාට වඩා පරලොව සැපතට හේතුවන වෙනත් කරුණු තිබේ දැයි අනිකුත් මහණ බමුණන්ගෙන් ද අසා බලව (යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

"වෙනත් මහණ බමුණන්ගෙන් අසා බැලීමට දෙයක් තවදුරටත් නැත. පරලොව සැපතට හේතුවන සියලු කරුණු අද මම ඔබ වහන්සේගෙන් උගතිමි. එකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ මාගේම යහපත පිණිස අලව් නුවරට වැඩි සේක. දුන් දෙයකින් මහත් ඵල ඇතැයි මම අද මැනවින් දැන ගතිමි. මම අද පටන් සම්බුදුන් නමදිමින් එම දහමෙහි යහගුණයන් පළ කරමින් ගමින් ගමට නගරයෙන් නගරයට ඇවිද යන්නෙමි යි අලව්යක් කීය.

එසේ කී අලව්යක් නොබෝ නැවතත් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයෙනි, දහම් දෙසුම ඉතා මැනවි, භවත් ගෞතමයන් වහන්ස, ධර්ම දේශනය ඉතා මනහරය. යම් සේ භවත් ගෞතමයෙනි, මුණින් හරවා තබන ලද බඳුනක් උඩුකුරු කොට තබන්නේ ද, වසා තබන ලද්දක් විවෘත කරන්නේ ද මං මුළා වූවෙකුට නියම මඟ පාදා පෙන්වන්නේ ද ඇස් ඇත්තෝ (මෙහි ඇති දේ) දකිත්වා යි යමෙක් අඳුරේ තැවටී තෙල පහන් දල්වා අල්ලයි ද එමෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් දෙසන ලදී. මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද සංඝයා ද පිහිට කොට (සරණ) යමි. අද පටන් මා දිවි හිමියෙන් (තෙරුවන් සරණ ගිය) උපාසකයෙකු ලෙස පිළිගනු මැනවි".

# 25. කසීභාරද්වාජ සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ දක්ඛිණාගිරියෙහි ඒකනාලා නම් බමුණු ගමෙහි වැඩ වාසය කරන සේක. එසමයෙහි කසීභාරද්වාජ නම් බමුණාගේ නගුල් පන්සියයක් සී සෑමෙහි යොදවන ලදී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි සිවුරු හැඳ පොරවා ගෙන කසීභාරද්වාජ බමුණාගේ සී සාන තැනට වැඩම කළ සේක. එවිට කසීභාරද්වාජ බමුණාගේ එම සීසාන තැන 'වැඳුම්' (දවල් කෑම) ගන්නා වේලාවයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඳුම් පදවන එළඹ එකත් පසෙක සිටි සේක. භාරද්වාජ බමුණා, පිඬු පිණිස වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක උන්වහන්සේට මෙසේ කීය. 'මහණ, මම සී සාමි, වපුරමි, සී සා වපුරා මම අනුභව කරමි. මහණ, ඔබ ද සී සාන්න, වපුරන්න, සී සා වපුරා අනුභව කරන්න'

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක) 'බමුණ: මමත් සී සාමි, වපුරමි. මම අනුභව කරන්නේ සී සෑමෙන් හා වැපිරීමෙනි'.

(එවිට බමුණා මෙසේ කීය)

'භවත් ගෞතමයන්ගේ නගුලක් හෝ සී වැලක් (නගුල් තලයක්) කෙවිටක් හෝ ගොනුන් හෝ අපට නොපෙනෙන්නේ නැත. එනමුත් 'මමත් සී සාමි, වපුරමි. මම අනුභව කරන්නේ සී සෑමෙන් හා වැපිරීමෙන්' යි භවත් ගෞතම කීය'. අනතුරුව කසීභාරද්වාජ බමුණා ගාථාවකින් ද මෙසේ කීය.

'ඔබත් ගොවියෙක් වෙමි' යි. ප්‍රතිඥා කොට ඔබ පවසයි. නමුත් ඔබේ සාම් උපකරණ කිසිවක් පෙනෙන්නේ නැත. ඔබේ ඒ සාම් උපකරණ මොනවා දැයි කරුණාකර කියන්න.

'ශ්‍රද්ධාව මගේ වපුරණ (බීජතර) 'බී' ය. තපස වැස්ස යි. ප්‍රඥාව, වියගහ සහ නගුලයි. පව් කිරීමට ලජ්ජාව (හිරි) නගුලිසයි. සිහිය (සමාධිය) මගේ නගුල් තලය සහ කෙවිට යි'

'රකින ලද කාය සුචරිතයෙන් යුතුව, රකින ලද වාක් සුචරිතයෙන් යුතුව, කුසෙහි ප්‍රමාණ දැන ආහාර ගනිමින් සත්‍යවාදී බව නම් ගොයමෙහි වල් පැළ නෙලීම කොට ගනිමින් අර්හත් ඵලය මගින් සැපවත් ගැලවීම, මගේ වෙයත් මුදා හැරීම කොට ගෙන මා විසින් ද සී සෑම කරනු ලැබේ. මගේ ඒ සී සෑමෙහි ඵල වන්නේ අමාඵලය වූ නිවන යි. මගේ ඒ සී සෑම මගින් සියලු සසර දුකින් මිදිය හැකිය'. (යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

එවිට කසීභාරද්වාජ බමුණා විශාල රන් තලියකට කිරිබත් බෙදා භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන ගොස් මෙසේ කීය. 'භවත් ගෞතමයන් වහන්සේ ද අමා ඵල ගෙන දෙන කෘෂිකර්මය කරන්නෙකි (ගොවියෙකි) එහෙයින් මේ කිරිබත් වළඳනු මැනවි'

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. 'බමුණ, ගී ගයා (ගාථා කියා) ලබන දෙය මම වළඳන්නේ නැත. පිරිසිදු දිවි පැවැත්ම හා එහි ස්වභාවය දන්නාවුන්ගේ පිළිවෙත එය නොවන බැවිනි. බුදුවරු ගී ගයා ලත් ආහාරය නොවළඳති. උතුමන්ගේ පිරිසිදු දිවි මගෙහි පිළිවෙත එයයි'.

'සියලු ගුණයෙන් යුතු මහර්ෂි වූ රහතුන් වහන්සේලාට වෙනත් ආහාර පානවලින් සංග්‍රහ කරව. එය කුසල් කැමැත්තන් ලැබීමට කැමැත්තා විසින් කුසල් බීජ වැපිරීමට සුදුසු සරුබිම එයයි.' යනුවෙන් භාගවතුන් වහන්සේ වදාළ සේක.

'එසේ නම්, භවත් ගෞතමයන් වහන්ස, මම මේ කිරිබත කාටදෙනුව දෙම් දැ' (යි බමුණා ඇසීය.)

බමුණ, දෙවියන් සහිත මහණ බමුණන් දෙව්මිනිසුන් සහිත ලෝකයෙහි තථාගතයන් වහන්සේ හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයන් හැර තවත් කිසිවෙකු මේ කිරිබත වළඳා පහසුවෙන් දිරවිය හැක්කෙකු ඇතැයි මම නොදකිමි. එහෙයින් බමුණ, ඒ කිරිබත, තණකොළ නොමැති තැනක දමව. නැතහොත් ප්‍රාණීන් නොමැති දියෙහි පාකර යවව යි. (බුද්ධරජාණන්වහන්සේ වදාළ සේක.)

එවිට කසීභාරද්වාජ බමුණා ඒ කිරිබත ප්‍රාණීන් නැති දියෙහි පා කළේය. දවස වැඩ කොට අවසානයෙහි (රත් වූ) සීවැල (නගුල්තලය) ජලයෙහි දැමූ විට 'චිරි චිරි' හඬ නගන්නා සේ දුම් දමන්නා සේ දියට දමන ලද ඒ කිරිබත ද 'චිටි චිටි' හඬ නගන්නට විය. දුම් දමන්නට විය. එයින් තැතිගැන්මට හා පුදුමයට, ලොමු දැහැගැන්මට පත් කසීභාරද්වාජ බමුණා භාගවතුන් වහන්සේ වැඩ සිටි තැනට එළඹ - උන්වහන්සේගේ සිරිපා නැමිද මෙසේ කීය.

'පින්වත් ගෞතමයන් වහන්ස, භවත් වහන්සේගේ දම් දෙසුම මැනවි, ඉතා මැනවි. ගෞතමයන් වහන්ස, යමෙක් යටිකුරු කර තබන ලද බඳුනක් උඩුකුරු කර තබන්නේ ද වසා තිබුණු දෙයක් විවෘත කරන්නේ ද මං මුළා වූවෙකුට නියම මග පෙන්වන්නේ ද ඇස් ඇත්තෝ මෙහි තිබෙන රූප ආදී ද්‍රව්‍යයන් දකිත්වා යි යමෙක් අඳුරෙහි පහනක් දල්වා අල්ලා ගෙන සිටින්නේ ද එමෙන් පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් (මට) ධර්මය පහදා දෙන ලදී. මේ මම පින්වත් ගෞතමයන් වහන්සේ සරණ කොට යමි. ධර්මය සරණ කොට යමි. සංඝයා සරණ කොට යමි. මම පින්වත් ගෞතමයන් වහන්සේ ලඟ මහණකම හා උපසම්පදාව ලබන්නට කැමැත්තෙමි'.

මෙසේ කසීභාරද්වාජ බමුණා භාගවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම හා උපසම්පදාව ලැබිය.

උපසම්පදාව ලත් ආයුෂ්මත් භාරද්වාජ තෙමේ කෙලෙසුන් තවන විරියෙන් නිවනාගාමීව දිවිය ගෙවන්නේ යම් උතුම් ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන් කුලපුත්‍රයෝ ගිහිගෙය හැර දමා පැවිදි වෙත් ද එම උතුම් වූ බඹසර හැසිරීමේ අවසන් ප්‍රතිඵලය වන රහත් ඵලයට නොබෝ දිනකින්ම පැමිණියේය. උන්වහන්සේගේ ජාතිය (සසරෙහි නැවත ඉපදීම) අවසන් විය. බඹසර විසීම නිම විය. කළයුතු කිස කොට අවසන් විය. කෙලෙස් නැසීමට කළ යුතු වෙනත් දෙයක් ඉතිරි නොවීය. ආයුෂ්මත් කසීභාරද්වාජ තෙරණුවෝ ද රහතන් වහන්සේලා අතරට එක්වූහ.

# 26. පරාභව සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙකහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේ පිඬු සිටුතුමාගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. එවිට එක්තරා දෙවියෙක් රෑ මැදියම් යාමයෙහි මනහර ශරීර වර්ණයෙන් මුළු දෙව්රම් වෙහෙර බබුළුවමින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ නමස්කාර කොට එකත් පසෙක සිටියේය. එකත් පස්ව සිටි ඔහු භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ කීය.

"පිරිහෙන මිනිසා කවරෙකු දැයි අපි ගෞතමයන් වහන්සේගෙන් විචාරමු. ඒ ගැන දැන ගැනීමට අපි භාග්‍යවතුන් වහන්සේ වෙත ආවෙමු. පිරිහීමේ දොරටුව කුමක් ද"?

"හැඳෙන වැඩෙන (දියුණු වන) මිනිසා දැන ගැනීම පහසුය. ධර්මකාමී මිනිසා දියුණු වෙයි. දහම පිළිකුල් කරන්නා පිරිහෙයි". (යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දුන් සේක).

"මෙසේ පළමු වන පිරිහෙන කරුණ අපි දැන ගනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමේ දෙවන කරුණ කුමක් ද"?

"සත්පුරුෂයන් අප්‍රිය කරන, අසත් පුරුෂයන් ප්‍රිය කරන්නා: අසත් පුරුෂයන්ගේ ඉගැන්වීම්වලට ආශා කරන්නා පිරිහෙයි".

"මෙසේ අපි දෙවන පිරිහීමේ කරුණ දනිමු. භාග්‍යවතුන් වහන්ස: පිරිහීමේ තුන්වන කරුණ වදාළ මැනවි".

"නිතර නිදාගන්නා, බොහෝ ජනයා රැස් ව සිටින තැන් සොයා යන, නිතරු කතාබහෙහි යෙදෙන අලසයා, වහා කිපෙන සුළු තැනැත්තා පිරිහෙයි".

"තෙවන පිරිහීමේ කරුණ දනිමු. භාග්‍යවතුන් වහන්ස, සිව් වන කරුණ වදාළ මැනවි".

"සමත් වත්පොහොසත්කම් ඇතිව සිටියදීත් මහලු වියට පත් වැහැරුණු මව හෝ පියා පෝෂණය නොකරයි ද එය එම පුතාගේ පිරිහීමට හේතුවකි."

"පිරිහීමේ සිව් වන කරුණ අපි දැනගනිමු. භාග්‍යවතුන් වහන්ස, පස් වන කරුණ වදාළ මැනවි".

"යමෙක් රහතන් වහන්සේ නමක් (බ්‍රාහ්මණ) හෝ දුගී දුප්පතෙකු බොරු කියා රවටයි ද ඔහු පිරිහෙයි".

"පස් වන පිරිහීමේ දොරටුව අපි දැනගනිමු. සවන කරුණ වදාළ මැනවි".

"බොහෝ වත්පොහොසත්කම් ඇති ධන ධාන්‍ය ඇති කෙනෙක් තනිවම ඒ ධන සම්පත් පරිභෝග කෙරෙයි ද ඔහුගේ එම මසුරුකම පිරිහීමට කරුණකි".

ය වන කරුණ අපි දනිමු. සත් වන කරුණ වදාළ මැනවි.

තම උසස් ජාතිය නිසා හෝ තම ධනය නිසා හෝ තම කුල ගෝත්‍ර නිසා හෝ අහංකාර වූ යමෙක් තම ඥාති නෑදෑයින් පහත් කොට සිතයි ද එය පිරිහීමට කරුණකි.

'හත් වන පිරිහීමේ කරුණ අපි දනිමු. අට වන කරුණ වදාළ මැනවි'.

යම් මිනිසෙක් ස්ත්‍රීන් කෙරෙහි ලොල්ව, සුරා සොඬව සූදුවෙන් උපයන දෙය තමන්ට ලැබෙන දෙය, විනාශ කරයි ද එ නැනැත්තා පිරිහෙයි.

අට වන කරුණ දනිමු. නවවන කරුණ වදාළ මැනවි

යමෙක් තම බිරිඳගෙන් සෑහීමකට නොපැමිණ වෙසඟනන්, පරඹුනන් සොයා යයි ද හේ පිරිහෙයි.

නව වන කරුණ දනිමු. දසවන කරුණ වදාළ මැනවි.

"ඉක්මවා ගිය තරුණකම් ඇති (මහලු) යම් පුරුෂයෙක් තිඹිරි වැනි තන ඇති තරුණ බිරිඳක ආවාහ කරගෙන (ඇය වෙනත් තරුණ පුරුෂයකු සමග යාවි ද යන සැකයෙන්) රාත්‍රියෙහි නිදිමරයි ද එය පිරිහීමට කරුණකි"

දස වන පිරිහීමේ හේතුව අපි දනිමු. එකොළොස් වන කරුණ වදාළ මැනවි.

මත් මාලු කෑමෙහි ගිජු වූ ඒ සඳහා ධන ධාන්‍යාදිය මහතෙහින් වැය කරන ගැහැණියක හෝ එවැනි එබඳු පුරුෂයකු කළමනාකාර ධුරයෙහි තබාවන්නා පිරිහීමට යයි

එකොළොස් වන පිරිහීමේ හේතුව අපි දනිමු. භාග්‍යවතුන් වහන්ස, දොළොස් වන කරුණ වදාළ මැනවි.

මඳ වූ ධන සම්පතින් යුත්, නමුත් රාජ්‍ය පාලන කුලයෙහි උපන් හේතුවෙන් යමෙක් රජකම් පතයි ද එය පිරිහීමට කරුණකි.

ඉහත කියන ලද පිරිහීමේ හේතූන් නුවණින් පරීක්ෂා කොට ඒවායින් වැළකෙන ආර්ය දර්ශනයෙන් යුත් නුවණැත්තා සැපසිල්ලෙන් ජීවත්වෙයි.

# 27. වසල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුතුමාගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි සිවුරු හැඳ පොරවා ගෙන ගෙන සැවැත් නුවර පිඬු පිණිස වැඩි සේක. එවේලෙහි අග්ගික භාරද්වාජ බමුණාගේ ගෙදර ගිනි දල්වා 'අග්නි හෝමය' පටන් ගෙන තිබිණ. ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණාගේ නිවස වෙත ද එළඹි සේක.

අග්ගික භාරද්වාජ බමුණා ඈත සිටම භාග්‍යවතුන් වහන්සේ එදෙසට වඩිනු දැක උන්වහන්සේට 'මුඩු මහණ: එතැනම නවතුව, හීන, මහණ, ඝනිත, සිටුව, වසලය, එතැනම නතර වෙව්' යි කීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණාගෙන් "බමුණ, වසලයා හෝ වසලයෙකු වන කරුණු හෝ නුඹ දන්නෙහි දැයි විමසූ සේක.

'භවත් ගෞතමයෙනි, වසලයෙකු හෝ වසලයෙකු වන කරුණු මට පහදා දෙන්නේ නම් මැනව" යි බමුණා කීය.

'එසේ නම් බමුණ, අසව. හොඳින් මනසෙහි තබා ගනුව" (යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ).

'එසේය, භවත්නි" යි කී අග්ගික භාරද්වාජ බමුණා එය පිළිගත්තේය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

> 'යම් මිනිසෙක් කිපෙන සුළු වේ ද බද්ධ වෛර ඇත්තේ ද අනුන්ගේ ගුණ හුගුණ කොට කියන්නේ ද මිසදිටු වූයේ ද අනුන් රවටන්නේ වේ ද ඔහු වසලයෙකි යි දත යුතුය.
>
> යමෙක් මේ ලෝකයෙහි එක් කුලයකින් එක්වරම උපන් හෝ බිත්තරයකින් බිහිවීමෙන් දෙවරකට උපන් හෝ ප්‍රාණීන්ට හිංසා පීඩා කෙරේ ද ප්‍රාණීන් කෙරෙහි දයාවක් නැත්තේ ද ඔහු වසලයෙකි යි දත යුතුය.
>
> යමෙක් ගම් නියම්ගම් විනාශ කරයි ද සොරාට පක්ෂ වෙමිලසි ද ජනයා පෙළන්නෙකු යි ප්‍රසිද්ධ වේ ද ඔහු වසලයෙකි යි දත යුතු.
>
> යමෙක් ගමෙහි හෝ වනයෙහි හෝ තිබෙන අන්සතු දෙයක් සොර සිතින් ගනී ද ඔහු වසලයෙකි යි දත යුතු.

යමෙක් ණයට ගෙන 'ඔබ මට ගෙවිය යුතු ණයක් ඇතැයි" කියන විට "ඔබට මගෙන් යා යුතු ණයක් නැතැයි" කියා පැන යයි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් සොල්ලාකැමෙති අදහසින් මඟින් යන්නා මරා ඔවුන් සතු දේ පැහැර ගනියි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙකුගෙන් සාක්ෂි ඇසූ විට, තම ගැලවීම් සඳහා හෝ අනුන් ගලවාලීම සඳහා හෝ මුදල් ලබා ගැනීමට හෝ බොරු සාක්ෂි දෙයි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් බලාත්කාරයෙන් හෝ යහළුවීමෙන් හෝ නෑයන්ගේ, මිතුරන්ගේ භාර්යාවන් සමග අනියම් සබඳකම් පවත්වයි ද හේ වසලයෙකැ යි දත යුතු.

යමෙක් තම හැකියාවක් තිබියදී තම මහලු මවට හෝ පියාට හෝ නොසලකා හරී ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් මවට, පියාට සහෝදර සහෝදරියන්ට නැදිමයිලන්ට හිංසා කරයි ද බණියි ද කෝප කරයි ද හේ වසලයෙකැ යි දත යුතු.

යමෙකු තමා දැනුම් කරුණක් විමසූ විට අහිතවත් දෙයක් කියයි ද විමසන ලද කරුණ සඟවා වෙනත් යමක් කියයි ද එසේ කරන්නා වසලයෙකැ යි දත යුතු.

යමෙක් වැරදි කොට 'මා එය කළේ යයි කිසිවෙක් නො දනිත්වා' යි සිතයි ද රහසිගත පව්කම් කරන ඔහු ද වසලයෙකැ යි දත යුතු.

අනුන්ගේ නිවෙසට ගොස් හොඳින් කෑම බීම වලින් සංග්‍රහ ලැබ එසේ තමන්ට සංග්‍රහ කළවුන්ට අවශ්‍ය විටක ප්‍රතිඋපකාර හෝ සංග්‍රහ නොකරන්නා වසලයෙකැ යි දත යුතු.

යමෙක් මහණ බමුණන් යදියන් බොරුවෙන් රවටයි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් ආහාර වේලාවෙහි පැමිණි මහණ බමුණෙකුට ආහාරයක් යමක් නොදෙයි ද රොස් පරොස් බසින් කථා කරයි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

මේ ලොවෙහි යමෙක් මුළාවෙන් යුතුව තමා සතු කිසි දෙයක් වෙනත් කෙනෙකුට නොදෙයි ද, දෙන්නවුන් වළකයි ද අසත් පුරුෂ වචන කියයි ද හේ වසලයෙකැ යි දත යුතු.

යමෙක් උඩඟු මානයෙන් යුතුව තමන් උසස් කොටත් අනුන් පහත් කොටත් සලකයි ද හේ වසලයෙකැ යි දත යුතු.

යමෙක් අනුන්ට රෝෂ කරයි ද, නපුරු ලෝභී පවිටු අදහස් ඇත්තේ ද කෘපණ මසුරු ද කපටි වේ ද ලජ්ජා නැත්තේ ද පවට බිය නැත්තේ ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් බුදුන්ට, බුදු සව්වන්ට, පිරිවැජියන්ට, ගිහියන්ට, කළපෙළා පිරිහෙළා කතා බහ කරයි ද ඔහු වසලයෙකැ යි දත යුතු.

යමෙක් රහත් නොවී තමා රහතන් වහන්සේ නමෙකැ යි අඟවයි ද ඔහු බඹලොව් සහිත මේ මුළු ලෝකයෙහි ම සිටින මහා සොරා ය. ඔහු වසලයන්ගෙනුත් වසලයෙකි. (අධම වසලයෙකි.)

වසලයෝ නම් මා මෙසේ කෙටියෙන් ප්‍රකාශ කළ පුද්ගලයෝ වෙති. **(තමන් උපන්) ජාතිය හේතු කොට ගෙන කවරෙක් වත් වසලයෙක් නොවේ. බ්‍රාහ්මණයෙක් (උසස් කුලවතෙක්) ද නොවේ. ඒ ඒ පුද්ගලයාගේ ක්‍රියා පරිපාටියෙන් ම ඔහු වසලයෙක් හෝ බමුණෙක් වන්නේය.**

මේ කාරණයෙන් ද ජාතිය හේතු කොට ගෙන යමෙකු සැඩොල් නොවන බව දත හැකිය. එනම්: උපතින් සැඩොල් පුතෙකු වූ බලු මස් කෑම නිසා සෝපාක නමින් හැඳින් වූ මාතංග තෙමේ ඉතා දුක සේ පැමිණිය හැකි උතුම් වූ යසසට පැමිණියේය. බොහෝ ක්ෂත්‍රියයෝ ද බමුණෝ ද ඔහුට උවටැන් කිරීමට පැමිණියහ.

ඒ මාතංග පණ්ඩිත තෙමේ රාගාදී කෙලෙස් දූහුවිල්ලෙන් තොර වූ මහතුන්ගේ මාර්ගය වූ අෂ්ට සමාපත්ති යානාවෙන් කාමයෙහි ඇලීමෙන් වෙන්ව බ්‍රහ්ම ලෝකයට පැමිණියේය.

ඔහු උපත් (පහත් යයි සම්මත) ජාතිය බඹලොව උපතට ඔහුට බාධාවක් නොවිය. වේද මන්ත්‍ර හදාරණ, වේදය ම පිළිසරණ කොට ඇති (උසස් යයි සම්මත) බමුණු කුලයෙහි උපන්නෝ ද පව් කිරීමෙහි නිතර යෙදෙත්. ඔවුහු මෙලොව දී ම නින්දාවට බඳුන් වෙති. පරලොව දී දුගතියට යෙති. ඔවුන්ගේ උසස් කුලය, ජාතිය, නින්දාවෙන් හෝ දුගතියෙන් ඔවුන් වළක්වා ගැනීමට අපොහොසත් වේ.

ජාතිය හේතු කොට ගෙන (කිසිවෙක්) වසලයෙක් නොවේ. ජාතිය හේතු කොට ගෙන බමුණෙක් ද නොවන්නේ ය. ඒ ඒ පුද්ගලයාගේ ක්‍රියාවන් හේතු කොට ගෙන වසලයෙක් වන්නේය: බ්‍රාහ්මණයෙක් ද වන්නේය".

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි අග්ගික භාරද්වාජ බමුණා උන්වහන්සේට මෙසේ කීය.

"භවත් ගෞතමයන් වහන්ස, දහම් දෙසුම මැනවි, දහම් දෙසුම ඉතා මැනවි, යම්සේ මුනින් නමා තබන ලද බඳුනක් උඩුකුරු කොට තබන්නේ ද වැසී තිබුණු යමක් විවෘත කොට දක්වන්නේ ද මං මුළා වූවෙකුට මඟ කියා දෙන්නේ ද ඇස් ඇති අය මෙහි ඇති රූප දකිත්වා යි සිතා යමෙක් අඳුරෙහි පහනක් දල්වා අල්ලා ගෙන සිටී ද එමෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය පැහැදිලි කර දෙන ලදී. ඒ මම බුදුන් සරණ යමි, දහම් සරණ යමි, සඟුන් සරණ යමි, මා අද පටන් දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය උපාසකයෙකු ලෙස පිළිගනු මැනවි".

# 28. සච්ච විභඞ්ග සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස මිගදාය නම් ඉසිපතනයෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි' යි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

'මහණෙනි, අර්හත් වූ සම්බුදු වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනයෙහි දී අනුත්තර වූ දම්සක් දෙසුම පවත්වන ලදි. එය රට තෙර හෝ ශ්‍රමණ හෝ බ්‍රාහ්මණයෙකු, දෙවියෙකු, මාරයෙකු, බ්‍රහ්මයෙකු හෝ ලෝකයෙහි වෙනත් කිසිවෙකු විසින් නොපවත්වන ලද්දකි. ඒ කුමක් ද යත්හොත්: සිව් වැදෑරුම් ආර්ය සත්‍යයන් පිළිබඳ පැනවීමයි, තැබීමයි, විස්තර කිරීමයි, විභාග කිරීමයි පැහැදිලි කිරීමයි.

ඒ චතුරාර්ය සත්‍යයෝ කවරහු ද යත්: **දුක්ඛ ආර්ය සත්‍යය** පැනවීමයි, තැබීමයි, විස්තර කිරීමයි, විභාග කිරීමයි, පැහැදිලි කිරීමයි. **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය** පැනවීමයි......පැහැදිලි කිරීමයි.
**දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය** පැනවීමයි ........................................................................ පැහැදිලි කිරීමයි.
**දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය** පැනවීමයි ......................................පැහැදිලි කිරීමයි.

මෙසේ මහණෙනි, අර්හත් සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් ඉසිපතනයෙහි දී වෙනත් ශ්‍රමණයෙකු බ්‍රාහ්මණයෙකු ................ බ්‍රහ්මයෙකු හෝ ලෝකයෙහි වෙනත් කිසිම පුද්ගලයෙකු ප්‍රකාශ නොකළ චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කෙරෙන 'ධර්ම චක්‍රය' පවත්වන ලදී

මහණෙනි, එම චතුරාර්ය සත්‍යයන් ............. විස්තර වශයෙන් පැහැදිලි කර ගැනීමට සැරියුත් මුගලන් දෙනම ඇසුරු කරව්. මහණෙනි, සැරියුත් මුගලන් දෙනම පණ්ඩිතයෝ වෙති, බඹසර හැසිරෙන්නවුනට අනුග්‍රහ (උදව් උපකාර) කරන්නෝ වෙති.

යම් සේ මවක් නම් සුය සත දරුවාට අනුග්‍රහ කරන්නී ද සැරියුත් තෙමේ ද එසේ ය බඹසර හැසිරෙන්නවුනට අනුග්‍රහ කරන්නේය. යම්සේ කිරි පොවා පෝෂණය කරන්නී ද අලුත් උපන් දරුවන් පෝෂණය කරන්නේ ද එසේ මුගලන් තෙමේ ද බඹසර හැසිරෙන්නවුනට අනුග්‍රහ කරන්නේය.

මහණෙනි, සැරියුත් තෙමේ සෝවාන් ඵලයෙහි (සබ්‍රහ්මචාරීන්) හික්මවයි. මුගලන් තෙමේ උතුම් අර්හත් ඵලයෙහි (සබ්‍රහ්මචාරීන්) හික්මවයි. මහණෙනි, චතුරාර්ය සත්‍යයන් විස්තර වශයෙන් කියන්නට, දේශනා කරන්නට, පනවන්නට, පිහිටුවන්නට, විවෘත කරන්නට, බෙදා දක්වන්නට, පැහැදිලි කරන්නට, සැරියුත් තෙමේ පොහොසත් ය, හැක්කේ යයි වදාළ සුගත වූ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් අසුනෙන් නැගිට විහාරයට පිවිසි සේක.

භාග්‍යවතුන් වහන්සේ එතැනින් පිටත්ව ගිය නොබෝ වේලාවකින් ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන් වහන්සේ 'ඇවැත්නි' කියා භික්ෂූන් ඇමතූ සේක. 'ඇවැත්නි' කියා ඒ භික්ෂූහු ද සැරියුත් තෙරුන්ට පිළිවදන් දුන්හ.

සැරියුත් තෙරණුවෝ මෙසේ වදාළහ.

"ඇවැත්නි, අරහත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනයෙහි දී මෙතෙක් ලොව සිටි මහණබමුණෙකු දෙවියෙකු මාරයෙකු බඹෙකු හෝ වෙනත් කිසිවෙකු විසින් නො පවත්වන ලද දම්සක් පැවැත්වීම කරන ලදී. එනම් චතුරාර්ය සත්‍යයන් දේශනා කිරීම, පැනවීම, පිහිටුවීම, විවරණය කිරීම, බෙද දැක්වීම, පැහැදිලි කිරීම යන මේ දේශනාවයි. ඒ සතර වැදෑරුම් උතුම් සත්‍යයෝ නම්:- **දුක්ඛ සත්‍යය, දුක්ඛ සමුදය සත්‍යය, දුක්ඛ නිරෝධ සත්‍යය, දුක්ඛ නිරෝධගාමිනී පටිපද සත්‍යය** යන මේවායි.

**ඇවැත්නි, දුක්ඛ ආර්ය සත්‍යය යනු කුමක් ද?**

ජාතිය (ඉපදීම) ද දුකකි. ජරාව (දිරීම) දුකකි. ව්‍යාධිය (ලෙඩරෝග) දුකකි, මරණය දුකකි, ශෝකය, වැලපීම, කයෙහි හට ගන්නා වේදනා දුක, සිතෙහි හටගන්නා දොම්නස් දුක, දැඩි වෙහෙස යන මේවා දුක්ය. පතන දේ නොලැබීම දුකකි. කෙටියෙන් උපාදානස්කන්ධයෝ පස්දෙනා දුක් වන්නාහුය.

**ඇවැත්නි, ජාති (ඉපදීම) නම් කුමක් ද?**

ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායෙහි යම් ඉපදීමක්, හටගැනීමක් ගර්භයට ඇතුළුවීමක්, බිහිවීමක්, ආයතන ද ස්කන්ධයන්ගේ පහළ වීමක් ඇද්ද ද එය 'ජාති' නම් වේ

**ඇවැත්නි, ජරා (දිරීම) නම් කුමක් ද?**

ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායෙහි යම් දිරීමක්, මහළු, දිරාපත් වන බවක්, දත් කැඩුන බවක්, ගැලවුන හිසක්, කෙස් පලාම් ඇති සුදු වූ බවක්, සම රැලි වැටීමක්, ආයුෂ පිරිහීමක් (ගෙවී යාමක්), ඇස් කන් නාසා දී ඉඳුරන් ගේ මෝරා යාමක්, වේ ද එය ජරා නාම වේ.

**ඇවැත්නි, මරණය නම් කුමක් ද?**

ඒ ඒ සත්ව නිකායෙන් ඒ ඒ සත්වයන්ගේ චුත වීමක්, ශරීරයෙන් ප්‍රාණය වෙන්වීමක්, ස්කන්ධයන්ගේ බිඳීයාමක්, රූපාදීයේ අතුරුදහන් වීමක්, පමිණුනු මරණයෙන් මිය යෑමක්, කළුරිය කිරීමක්, ශරීරය හෙළා තැබීමක්, වේ ද එය මරණය නම් වේ

**ඇවැත්නි, ශෝකය නම් කුමක් ද?**

ඇවැත්නි, යම්කිසි ව්‍යසනයකින් (විපතකින්) යුක්ත වූ සත්වයාගේ ද යම් කිසි දුක් දනවන කාරණයකින් පෙළෙන කෙනෙකුගේ ද යම් කිසි ශෝක කිරීමක්, ශෝචිත වියළීම ගතියක්, ශෝක සිත් ඇති බවක්, ශරීරය ඇතුළත වියළෙන ස්වභාවයක්, ශරීර ඇතුළත දැඩි සේ වියළෙන ස්වභාවයක් වේ ද එය ශෝකය නම් වේ.

**ඇවැත්නි පරිදේවය (වැලපීම) නම් කුමක් ද?**

යම්කිසි ව්‍යසනයකින් යුක්ත වූ සත්වයාගේ ද යම්කිසි දුක් දනවන කාරණයකින් පෙළෙන කෙනෙකුගේ ද යම්කිසි 'නම් හඬ ගා කියා හැඬීමක්' වේ ද 'ගුණ කිය කියා වැළපීමක්' වේ ද 'නම් හඬ නගා කියා හඬන බවක්' වේ ද 'වැලපෙන බවක් වේ' ද ඇවැත්නි, එය පරිදේවනා නම් වේ.

**ඇවැත්නි, (කායික) දුක නම් කුමක් ද?**

ඇවැත්නි, යම්කිසි කයෙහි හටගන්නා වූ දුකක් ඇද්ද, කයෙහි හට ගන්නා වූ දුක් වූ අමිහිරි, අපහසු, ගතියක් වේ ද කය හා එක් වීමෙන් උපන්නා වූ දුක් වූ රත වේදනාවක් වේ ද එය (කායික) දුක නම් වේ.

**ඇවැත්නි, දෙම්නස නම් කවරේ ද?**

ඇවැත්නි, සිතෙහි හට ගන්නා වූ යම් කිසි අමිහිරි බවක් වේ ද මනාප නොවන අරමුණු සිතට හැපීමෙන් උපන් දුක් දෙන, සුවදායක නොවන යම් කිසි (මානසික) විඳීමක් වේ ද ඇවැත්නි, එය දෙම්නස නම් වේ.

**ඇවැත්නි උපායාසය (දැඩි වෙහෙස) නම් කුමක් ද?**

යම්කිසි ව්‍යසනයකින් යුක්ත වූ යම්කිසි දුක් දනවන කරුණකින් පීඩාවට පත් වූවහුගේ ආයාසය (ක්ලාන්ත ගතිය) බලවත් ගිලන් ස්වභාවයක්, ක්ලාන්ත ස්වභාවයක් වේ ද ඇවැත්නි, එය උපායාස නම් වේ.

**ඇවැත්නි පතන දේ නොලැබීමේ දුක නම් කුමක් ද?**

සසර ඉපදීම ස්වභාවය කොට ඇති සත්වයන් තුළ මෙවැනි ආශාවක් ඇතිවේ. 'අනේ අපි උපදින ස්වභාවය නැත්තෝ වූවු නම් අපට එකාන්තයෙන් උපතක් නොලැබෙන්නේය. එසේ වී නම් ඉතා මැනවි', යන මේ කාරණය, ආශා කිරීමෙන් (පැතීමෙන්) ලද හැකි දෙයක් නොවේ, මෙය පතන දේ නොලැබීමේ දුක නම් වේ.

ජරාව (දිරීම) ස්වභාවය කොට ඇති සත්වයන් තුළ මෙවැනි ආශාවක් ඇති වේ, 'අනේ අපි ජරාව (දිරීම වයසට යාම) ස්වභාවය කොට නැත්තෝ වූවාහු නම් කවදාවත් අප වෙත ජරාව (මහළුවිය) නො එන්නේය', මෙය ද පැතීමෙන් ලද හැකි දෙයක් නොවේ. මෙය ද පතන දේ නොලැබීමේ දුක නම් වේ.

ව්‍යාධිය (ලෙඩවීම) ස්වභාවය කොට ඇති සත්වයන් තුළ මෙවැනි ආශාවක් ඇතිවේ, "අනේ අපි ලෙඩවීම ස්වභාවය කොට නැත්තෝ වූවාහු නම් කවදාවත් අපි රෝගී නොවන්නෙමු" මෙය පැතීමෙන් ලද හැකි දෙයක් නොවේ. මෙය ද පතන දේ නොලැබීමේ දුක නම් වේ.

මරණය ස්වභාවය කොට ඇති සත්වයන් තුළ මෙවැනි ආශාවක් ඇතිවේ. "අනේ අපි මරණය ස්වභාවය කොට නැත්තෝ වූවාහු නම් කවදාවත් අපි නොමැරෙන්නෙමෝ වෙමු" මෙය පැතීමෙන් ලද හැකි දෙයක් නොවේ. (එහෙයින්) මෙය ද පතන දේ නොලැබීමේ දුක නම් වේ.

ශෝකය, වැලපීම, දුක් දෙම්නස් වීම, දැඩි වෙහෙස, යන මේවා ස්වභාවය කොට ඇති සත්වයන් තුළ මෙවැනි ආශාවක් උපදී, 'අනේ, අපි ශෝකය, වැලපීම..... දැඩි වෙහෙස යන මේ ස්වභාවයන් නැත්තෝ වූවාහු නම් කවදාවත් අප වෙත ශෝකය වැලපීම, දුක් දෙම්නස් වීම, දැඩි වෙහෙස නො එන්නේය. මෙය ද පැතීමෙන් ලද හැකි දෙයක් නොවේ. එහෙයින් මෙය ද පතන දේ නොලැබීමේ දුක නම් වේ.

**ඇවැත්නි, කෙටියෙන් පඤ්ච උපාදාන ස්කන්ධයෝ කෙසේ දුක් වන්නාහු ද?**

රූප උපාදාන ස්කන්ධය (සතර මහා භූතාදි රූපරාශිය) වේදනා උපාදාන ස්කන්ධය (සැප, දුක්, උපේක්ෂා යන කෙලෙස් සහිත වේදනා ස්කන්ධය,) සංඥා උපාදාන ස්කන්ධය (රූපසංඥා ආදී සංඥා (අරමුණු හැඳිනීම) සංස්කාර උපාදාන ස්කන්ධය (ස්පර්ශ ආදී සංස්කාර උපාදාන ස්කන්ධය) විඤ්ඤාණ උපාදාන ස්කන්ධය (කෙලෙස් සහිත විඥාන ස්කන්ධය) යන මේවා ඇවැත්නි, සංක්ෂේපයෙන් දුක් වූ උපාදාන ස්කන්ධයෝ නම් වෙති.

ඇවැත්නි, දුක්ඛ ආර්ය සත්‍යයයි කියන්නා ලබන්නේ ඉහත දක්වන ලද එවායි.

**ඇවැත්නි දුක්ඛ සමුදය ආර්ය සත්‍යය නම් කුමක් ද?**

පුනර්භවය (සසරෙහි නැවත නැවත ඉපදීම) කරන්නා වූ උපන් ඒ ඒ භවයෙහි ඇලීම කරන්නා වූ යම් තෘෂ්ණාවක් (ආශාවක්) වේ ද එනම්:- කාම තණ්හාව, භව තණ්හාව, විභව තණ්හාව, යන මේවා දුක හට ගැනීමේ උතුම් සත්‍යය නම් වේ.

**ඇවැත්නි දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නම් කුමක් ද?**

(ඉහත කී) කාම තණ්හා ආදි තෙවැදෑරුම් ආශාවන් නැති කිරීම, අත් හැරීම, සහමුලින්ම විනාශ කිරීම, දුරලීම, එයින් මිදීම, එහි ආලයක් නැතිවීම, ඇවැත්නි, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය යි කියනු ලැබේ.

**ඇවැත්නි දුක් නැති කිරීමේ පිළිවෙත (දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා) ආර්ය සත්‍යය නම් කුමක් ද?**

ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය (අට වැදෑරුම් උතුම් මග) යි. එනම්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, යන මේවා යි.

**ඇවැත්නි සම්මා දිට්ඨි නම් කුමක් ද?**

ඇවැත්නි, මේ දුක යයි දුක ගැන දැනීම, මේ දුක් ඉපදීමේ හේතුවය යන දැනීම, මේ දුක නැතිවීමය යන දැනීම, මේ දුක නැති කිරීමට යෙදිය යුතු පිළිවෙත ය යන දැනීම යන මේවා සම්මා දිට්ඨි නම් වේ.

**ඇවැත්නි. සම්මා සංකප්පය නම් කුමක් ද?**

පස්කම් සැප විඳීමෙන් බැහැරව සිත් සෙයින් නික්ම යාමෙහි කල්පනාව, අනුන් කෙරෙහි වෛර රහිතව අනුන් ද සුවසේ සිටිත්වා යි කල්පනාව, සත්වයන්ට හිංසා කිරීමෙන් වැළකීමේ කල්පනාව, යන මේ සංකල්පනාවෝ සම්මා සංකප්ප නම් වෙති.

**ඇවැත්නි සම්මා වාචා නම් කුමක් ද?**

බොරු කීමෙන් වැළකීම, පිස්ලාම් කීමෙන් වැළකීම, රළු වචන කීමෙන් වැළකීම, හිස් වචාල කතා කීමෙන් වැළකීම, යන මේවා සම්මා වාචා නම් වේ.

**ඇවැත්නි සම්මා කම්මන්ත නම් කුමක් ද?**

සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම, යන මේවා සම්මා කම්මන්ත නම් වේ.

**ඇවැත්නි. සම්මා ආජීවය නම් කුමක් ද?**

ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා වැරදි දිවිපෙවෙත හැරදමා දැහැමින් උපයා සපයා ගත් දෙයින් දිවි ගෙවයි; මෙය සම්මා ආජීව නම් වේ.

**ඇවැත්නි සම්මා වායාම නම් කුමක් ද?**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ නූපන් පව්කාර අකුසල් දහම් නොඉපදවීම සඳහා කැමැත්ත උපදවා ගනියි: උත්සාහ කරයි, වීර්ය කරයි, සිත වීර්යයෙහි පිහිටුවා ගනියි. දැඩි ලෙස වීර්ය කරයි.

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ උපන්නා වූ පව්කාර අකුසල් දහම්, නැසීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වෙර දරයි, ස්ථිර ලෙස අදිටන් කරයි, සිත දැඩි කර ගනියි, නූපන් කුසල් දහම් ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි.... අදිටන් කරයි, සිත දැඩි කර ගනියි, උපන් කුසල් දහම් ස්ථිර ලෙස තමා කෙරෙහි පවත්වා ගැනීම පිණිස අමතක නොවීම පිණිස, වර්ධනය වීම පිණිස, වැඩීම පිණිස, සපිරීම පිණිස කැමැත්ත උපදවයි..... සිත දැඩි කරගනියි ඇවැත්නි, මෙය සම්මා වායාම නම් වෙයි.

**ඇවැත්නි, සම්මා සති නම් කුමක් ද?**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ රූප කායෙහි, කය අනුව බලන්නේ කෙලෙස් තවන වීරියෙන් යුතුව, නුවණින් යුතුව, සිහියෙන් යුතුව, "ලෝක" නම් වූ ශරීරයෙහි නාම සැප කෙරෙහි දැඩි ආශා වූ ලෝභය ද ව්‍යාපාදය නම් වූ නොසතුටු බව ද නැසිඳුවා ගෙන වාසය කරයි. වේදනාවන් කෙරෙහි වේදනාවන්ගේ යථා ස්වභාවය කෙලෙස් තවන වීරියෙන් යුතුව නුවණින් දකිමින්, සිහියෙන් යුතුව ලෝකයෙහි අභිජ්ඣා (ලෝභය) නොසතුටු බව (දොම්නස්ස) යන මේ දෙක නිකම්මවා ගෙන වාසය කරයි. පංච නීවරණ ආදී ධර්මයන් කෙරෙහි ධර්ම ස්වභාවය අනුව බලමින්, කෙලෙස් තවන වීරියයෙන් යුතුව..... සිහියෙන් යුතුව අභිජ්ඣා. දොම්නස්සයන් නිකම්මවා ගෙන වාසය කරයි. ඇවැත්නි මෙය සම්මා සති නම් වෙයි.

**ඇවැත්නි, සම්මා සමාධිය යනු කුමක් ද?**

මේ සසුනෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේක අන්හුවෙන් උපන්නා වූ කාය සිත පිනවීම් කරන **පළමු වන දැහැනට** පැමිණ වාසය කරයි. විතර්ක විචාර දෙක සංසිඳුවීමෙන් තම සිත තුල **පැහැදීම කරන්නා වූ**, සිතෙහි එකඟබවක් වූ විතර්ක විචාර නැති සිත එකඟ කිරීමේ සමාධියෙන් උපන්නා වූ සිත කාය පිනා යාම කරන **දෙවැනි දැහැනට** පැමිණ වාසය කරයි. ප්‍රීතියෙන් ද විරාගයෙන් මැදහත් ස්වභාවය ඇතිව ද වසයි, සිහි ඇතිව මැනවින් දකිමින් සුවය කයින් විඳින්නේ යම් දැහැනක් හේතු කොට ගෙන ද එයි **තුන්වන දැහැනට** පැමිණ මේ හැනැත්තා මැදහත්ය, සිහි ඇත්තේය. සැප විහරණ ඇත්තේය යි ආර්යයන් විසින් කියනු ලබන්නෙකුව වාසය කරයි. කයෙහි සැප ගන්නා සුවදුක් දෙකම නැති කිරීමෙන් පළමුකොට සොම්නස් දොම්නස් දෙක නැති වීමෙන් ද දුක් නොවූ සැප ද නොවූ උපෙක්ෂාව සිහියෙන් පිරිසිදු බව ඇත්තා වූ **සතර වැනි දැහැන්** සිතට පැමිණ වාසය කරයි.

ඇවැත්නි, මෙය සම්මා සමාධි නම් වේ. ඇවැත්නි, මෙය (දුකෙහි දක්වන ලද කරුණු) **දුක්ඛ නිරෝධ ගාමිනී පටිපද** ආර්යසත්‍ය නම් වේ.

ඇවැත්නි, අර්හත් වූ සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී මහණකු, බමුණෙකු, දෙවියෙකු, මාරයෙකු, බ්‍රහ්මයෙකු, හෝ වෙනත් ලෝකයෙහි කිසිවෙකු විසින් නොපවත්වන ලද අනුත්තර වූ දහම් සක පවත්වන ලදී. එනම් මේ සිව් අරිසස් වදාරීම, දෙසීම, දැක්වීම, තැබීම, විවර කිරීම, බෙද දැක්වීම පැහැදිලි කිරීමයි".

ආයුෂ්මත් සාරිපුත්‍ර තෙරනු මේ දෙසුම කළ සේක. සතුටු සිතැති ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ එම දෙසුම සතුටින් පිළිගත්හ.

## 29. ආටානාටිය සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වසන සේක. ඉක්බිති සිව්වරම් රජවරු මහා යක් සෙනගක්, මහා ගඳඹ සෙනගක්, මහා කුම්භාණ්ඩ සේනාවක් මහා නාග සේනාවක් ලවා සිව්දිග ආරක්ෂාව සලසා සිව් දිග බලසෙනග කඳවුරු කරවා, සිව්දිග සේනාව ලවා රැකවල් ලවා, මෙරයම් රැ ය ඉක්මුණු කලැති මනාහර සිරුරු පැහැයෙන් යුතුව මුළු ගිජුකුළ හාත්පසින් බබුළුවා

භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නාහුය. සිව්වරම් රජුන් සමග පැමිණි ඒ යක්ෂයන්ගෙන් ඇතැම් අය භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නාහුය. ඇතැම් අය භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කොට එකත් පසෙක හුන්හ. තවසරු භාග්‍යවතුන් වහන්සේ වැඩි හුන් දෙසට ඇඳිලි බැඳ එකත් පසෙක හුන්හ. සමහරු නම නාමිගොත් අස්වා (කියා) එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන්නා වූ වෙස්සවණ (වෛශ්‍රවණ) මහරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අසතුටු වූ උසස් යක්ෂයෝ සිටිති. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සතුටු (පැහැදුන) උසස් යක්ෂයෝ ද සිටිති. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අසතුටු වූ මැදුම් බලඇති යක්ෂයෝ සිටිති. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සතුටු වූ මැදුම් බලඇති යක්ෂයෝ ද සිටිති. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නොසතුටු වූ පහත් යක්ෂයෝ සිටිති. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුන පහත් යක්ෂයෝ සිටිති. ස්වාමීනි, යක්ෂයෝ බොහෝ දෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අප්‍රසන්නයෝ වෙති, ඊට හේතු කවරේද යතහොත්- ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පරපණ නැසීමෙන් වළකිනු පිණිස දහම් දෙසන සේක. සොරකමින් වළකිනු පිණිස දහම් දෙසන සේක. කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිනු පිණිස දහම් දෙසන සේක. බොරු කීමෙන් වළකිනු පිණිස දහම් දෙසන සේක. රහමෙර පානයෙන් වළකිනු පිණිස දහම් දෙසන සේක.

ස්වාමීනි. යක්ෂයෝ බොහෙවින් පරපණ නැසීමෙන් නොවැළකුනාහු වෙති. සොරකමින් නොවැළකුනාහු වෙති. කාමයෙහි වරදවා හැසිරීමෙන් නොවැළකුනාහු වෙති. බොරු කීමෙන් නොවැළකුනාහු වෙති. රහමෙර පානයෙන් නොවැළකුනාහු වෙති.

එබැවින් ඒ (විරති) ධර්මය ඒ යක්ෂයනට ප්‍රියමනාප නොවේ.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වනයෙහි සඳ බැවුම්වල ද මහත් ශබ්ද නැත්තා වූ නිහඬ තැන්වල ද මිනිසුන්ගේ හැසිරීමෙන් කලබල නැති තැන්වල ද මිනිසුන්ගේ රහස් කටයුතුවලට සුදුසු තැන්වල ද සිත එකඟ කිරීමට (භාවනාවට) සුදුසු සෙනසුන් ඇසුරු කොට සිටිති.

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයෙහි නොපැහැදුනු මහානුභාව සම්පන්න යක්ෂයෝ ද ඒ තැන්වල ස්ථිරව පදිංචි වී සිටිති. ස්වාමීනි, ඔවුන්ගේ පැහැදීම පිණිස, භික්ෂූන්ගේ භික්ෂුණීන්ගේ උපාසකයන්ගේ උපාසිකාවන්ගේ උවදුරු වැළකීම හා ආරක්ෂාව පිණිස ආටානාටිය නැමැති ආරක්ෂක පිරිත භාග්‍යවතුන් වහන්සේ උගෙන වදාරනු මැනවි.

භාග්‍යවතුන් වහන්සේ (වෛශ්‍රවණගේ එම කීම) නිහඬව පිළිගෙන වදාළසේක. ඉක්බිති වෛශ්‍රවණ මහරජතෙමේ භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත් බව දැනගෙන ඒ වේලාවෙහි මේ ආටානාටිය ආරක්ෂාව පැවසීය.

'ඥාණචක්ෂුස් ඇත්තා වූ සිරිමත් වූ **විපස්සී** බුදුරජුන්ට නමස්කාර වේවා. සියලු සතුන් කෙරෙහි අනුකම්පා කළා වූ **සිඛී** බුදුරජුන්ට නමස්කාර වේවා

කෙලෙස් නැසූ කෙලෙස් නැවීමෙහි වෙර ඇත්තා වූ **වෙස්සභූ** බුදුරජුන්ට නමස්කාර වේවා. මාරසේනාවන් මැඩලූ **කකුසඳ** බුදුරජුන්ට නමස්කාර වේවා.

බැහැ නසන ලද පව් ඇති හෙයින් බ්‍රාහ්මණ නම් වූ **කෝණාගමන** බුදුරජුන්ට නමස්කාර වේවා. සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ **කස්සප** බුදුරජුන්ට නමස්කාර වේවා.

යම් බුදුවරයෙක් සියලු දුක් දුරු කරන මේ ධර්මය දේශනා කළ සේක් ද අංගීරස වූ සිරිමත් වූ ශාක්‍ය පුත්‍ර වූ ඒ **ගෞතම** බුදුරජුන්ට නමස්කාර වේවා.

ලොවෙහි යම් රහත් කෙනෙක් නිවන් ලද්දාහු ද තත් වූ පරිද්දෙන් විදසුන් වැඩුවාහු ද උන්වහන්සේලා නිත් කේලම් පවසන්නෝ නොවෙති. මහාත්මයෝ වෙති. පහ වූ සතර බිය ඇත්තාහු වෙති. (උන්වහන්සේලාට ද නමස්කාර වේවා.)

විද්‍යා චරණ ගුණයන්ගෙන් යුක්ත වූ මහාත්ම වූ පහවූ සතර බිය ඇත්තාවූ දෙවිමිනිසුන්ට හිතවත් වූ **ගෞතම** බුදුරජුන්ට දෙවිමිනිස්සු නමස්කාර කරති.

**අදිතියගේ** පුත් වූ හෙයින් **ආදිච්ච** නම් වූ මහාමණ්ඩලයක් ඇත්තා වූ සූර්යයා යම්තැනකින් උදාවේ ද එම සූර්යයා උදාවන කල්හි රාත්‍රිය ද නැති වේ.

යම් දිශාවකින් සූර්යයා උදාවූ කල්හි 'දිවස' යයි කියනු ලැබේ ද එතැනහි ගැඹුරු වූ ගංගාවන් එකතු වීම නිසා පැතිරුණු මහාජල කදක් ඇති මුහුද නමින් හැඳින්වෙන මහා සාගරයක් ඇත.

පැතලා වූ ජලය ඇති එය **'සමුද්‍ර'** යන නමින් හැඳින් වේ. එය මෙයින් නැගෙනහිර දිශාවෙහි පිහිටා (පෙරදිග) ඇතැයි ජනයා කියති.

යසස් ඇත්තා වූ **ගාන්ධර්වයන්ට** අධිපති වූ **ධතරට්ඨ** නම් වූ ඔහු එම නැගෙනහිර දිශාව පාලනය කරයි. ඔහු නැටුම් ගැයුම්වලින් යුතු ගාන්ධර්වයන් පිරිවරා ගෙන විනෝදයෙන් වාසය කරයි. ඔහුගේ බොහෝ පුත්‍රයෝ එකම නමකින් හඳුන්වනු ලබති යි මා විසින් අසන ලදී.

ඔහුගේ මහබලැති **ඉන්ද්‍ර** නමින් හැඳින්වෙන පුත්‍රයෝ **අනූ එක්දෙනෙක්** වෙති. ඔවුහු ද සූර්යවංශයෙහි උපන් හෙයින් ආදිච්චබන්ධු නම් වූ මහාත්ම වූ බුදුරදුන් ඈත සිටම දැක 'ශ්‍රේෂ්ඨ පුරුෂයාණනි, ඔබ වහන්සේට නමස්කාර වේවා, උතුම් මිනිස පුත්‍රයාණනි, ඔබ වහන්සේට නමස්කාර වේවා' යි කියමින් (ඔවුහු) ඔබ වහන්සේට වදිති.

"ඔබ වහන්සේ නිවැරදිව තවීනෙ ගෙවා දත් නුවණින් (මහාකරුණාවෙන්) සියලු සතුන් දෙස බලන්නාහු" යයි (කියමින්) අමනුෂ්‍යයෝ ද ඔබ වහන්සේට වඳිති යි අපි නිතර අසා ඇත්තෙමු. එබැවින් අපි මවුන්ට මෙසේ කියා කරමු. "අපි (පස්මරුන් දිනූ) ජිනයන් වහන්සේට වඳිමු". අපි විද්‍යාචරණ චර්මයන්ගෙන් යුක්ත වූ ගෞතම බුදුන් වඳිමු". යයි කියමින් ගෞතම බුදුරජුන්ට (කොටි) නමස්කාර කරවි.

කේලාම් කියන්නා වූ පිටවත් මස් කන්නා වූ කොටින් අනාගිලුවටයෙහි දෙස් කියන්නා වූ පරපණ නසන්නා වූ දරුණු වූ සොර වූ කැළෑ වූ මිය ගිය හෙයින් **ප්‍රේත** යයි කියනු ලබන්නා වූ ජනයෝ යම්තැනක පවසෙත් ද මෙතැනින් එය **දකුණු දිශාව** යයි ජනයා කියති

කුම්භාණ්ඩයන්ට අධිපති වූ යසස් ඇත්තා වූ **විරූළ්හ** මහරජ තෙමේ එම දිශාව පාලනය කරයි. ඔහු **කුම්භාණ්ඩයන්** විසින් පිරිවරනු ලැබ නැටුම් ගැයුම් වලින් යුතුව ප්‍රීතියෙන් කල්ගත කරයි.

එකම නමකින් හැඳින්වෙන පුත්‍රයෝ බොහෝ දෙනෙක් ඔහුට වෙති. **ඉන්ද්‍ර** නමින් හැඳින්වෙන මහබලැති ඔවුහු ගණනින් අනූඑක්දෙනෙකැයි මා විසින් අසා තිබේ.

ඔවුහු ද මහාප්‍රාඥ වූ පහළ කසර බිය ඇත්තාවූ සූර්යබන්ධු වූ බුදුන් දැක ඈත දිම නමස්කාර කරති. "අහෝ උතුම් පුරුෂයානන් වහන්ස, ඔබට නමස්කාර වේවා. පුරුෂෝත්තමය, ඔබ වහන්සේට නමස්කාර වේවා". ඔබ වහන්සේ යම්තෙ ගෙවා දත් නුවණින් සියලු සතුන් දෙස බලන්නාහුය. අමනුෂ්‍යයන් ද ඔබ වහන්සේට වඳිති යි අප නිතර අසා තිබේ. එබැවින් අපි ඔවුන්ට මෙසේ කියමු කරන්නෙමු. 'ගෞතම ජිනයන් වහන්සේට වඳිමි'. එසේ වඳිමින් 'ගෞතම ජිනයන් වහන්සේට අපි වඳිමු, විද්‍යාචරණ ගුණයන්ගෙන් යුක්ත වූ ගෞතම බුදුරජානන් වහන්සේට අපි වඳිමු." (යයි කියවි)

යම්තැනකින් මහා රශ්මි මණ්ඩලයක් ඇති, **ආදිත්‍ය** නම් වූ සූර්යයාතෙමේ බැස යයි ද යමෙක්හු බැස ගිය කල්හි දවල් කාලය අහවර දහත් වේ ද, යමෙක්හු බැස ගිය කල්හි රාත්‍රිය යි කියනු ලැබේ ද එම බැස ගිය තැන්හි ගැඹුරු වූ ගංගාවන්ගේ ජලය එක් රැස් වූ මුහුද නම් වූ මහා ජලාශය වේ. ඒ ස්ථානය මෙතැනින් **බටහිර දිශාව** යයි ජනයා කියති.

**විරූපාක්ෂ** යන නමින් යුත්, **නාගයන්ට** අධිපති වූ ඒ මහරජතෙමේ නාගයන් පෙරටු කර ගෙන නැටුම් ගැයුම් වැයුම් වලින් යුතුව ඒ දිශාව පාලනය කරයි. ඔහුට බොහෝ පුත්‍රයෝ වෙති. **ඉන්ද්‍ර** නමින් හැඳින්වෙන ඔවුහු ගණනින් අනූඑක්දෙනෙකි. මහබලැති ඔවුහු ද සූර්යබන්ධු වූ මහාප්‍රාඥ වූ නහනළු සසර බිය දැන්නා වූ බුදුරදුන් ඈත දීම දැක "අහෝ උතුම් පුරුෂයානන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. පුරුෂෝත්තමය ඔබ වහන්සේට නමස්කාර වේවා" යි කියා වඳිති. ඔබ වහන්සේ යම්තෙ ගෙවා දත් නුවණින් සියලු සතුන් දෙස බලන්නාහුය.

'අමනුෂ්‍යයන් ද ඔබ වහන්සේට වඳිති' යි අප නිතර අසා තිබේ. එබැවින් අපි ඔවුන්ට මෙසේ නියම කරමු. 'ගෞතම ජිනයන් වහන්සේට වඳිව්. 'එසේ වඳිමින් 'ගෞතම ජිනයන් වහන්සේට අපි වඳිමු. විද්‍යාචරණ ගුණයෙන් යුක්ත වූ ගෞතම බුදු රජාණන් වහන්සේට අපි වඳිමු.' (යයි කියව්)

යම් දිශාවක රමණීය **උතුරුකුරු දිවයින** පිහිටියේ ද ඉතා දර්ශනීය වූ **මහාමේරු පර්වතය** පිහිටියේ ද ඒ උතුරුකුරු දිවයිනෙහි මමත්වයක් නැත්තා වූ ඇඩිව වස්තුව බඳු ගැනීමක් නැත්තා වූ **මනුෂ්‍යයෝ** උපදිති.

ඒ මිනිස්සු ධාන්‍ය බීජ නො වපුරති. නඟුල් උසුලා ගෙන නොයති. දර දමා නොපිසූ ස්වයංජාත හැල් ධාන්‍ය අනුභව කරති. කුඩු හෝ දහයියා නැති පිරිසිදු සුවඳ හැල් සාල් රන් බඳුනෙහි ලා කිරෙන් පැසවා ගෙන ඔවුහු පරිභෝග කරති.

දෙනුන් එකකුර කොට (ලාඩම් ගසා) වාහන ලෙස යොදා ගෙන ඔවුහු තැනින් තැන සංචාරය කරති. සිවුපාවුන් එකකුර (ලාඩම් ගසා) කොට ගෙන ඔවුහු තැනින් තැන සංචාරය කරති. ස්ත්‍රීන් වාහන කොට ගෙන තැනින් තැන සරති. පුරුෂයන් වාහන කොට ගෙන තැනින් තැන සරති. කුමරියන් වාහන කොට ගෙන තැනින් තැන සරති. කුමරුවන් වාහන කොට ගෙන තැනින් තැන සරති. ඒ රජුගේ පිරිස නොයෙක් යාන වාහනවල නැඟී සියලු දිශාවල සංචාරය කරති. යසස් ඇත්තා වූ ඒ මහරජුට ඇත් වාහන ද අස් වාහන ද දිව්‍ය යානාවෝ ද එළඹ සිටිති. ප්‍රාසාදයෝ ද සිවි ගෙවල් ද ඔහුට ඇත. අහසෙහි මැනවින් මවන ලද නගරයෝ ද ඔහුට වෙති. **ආටානාටා කුසිනාටා, පරකුසිනාටා, නාටපුරියා, පරකුසිත නාටා** යන නගර ද උතුරු දෙසින් **කපීවන්ත**, පැළ දෙසින් **ජනොඝ නවනවතිය, අම්බර අම්බරවතිය,** යන නගර හා **ආලකමන්දා** නම් **රාජධානිය** ද වෙයි.

නිදුකානනි, කුවේර මහ රජුට වනාහි **විසාණා** නැමැති **නගරයක්** ඇත. එහෙයින් කුවේර මහරජ තෙමේ **වෙස්සවණ** නමින් හඳුන්වනු ලැබේ.

**තතෝලා, තත්තලා, තතෝතලා, ඕජසී, තේජසී, තතෝජසී, සූර, රාජ, සූරරාජ, අරිට්ඨ, අරිට්ඨනේමි** යන යක්ෂසේනාපතිවරු වෙන් වෙන් වශයෙන් කරුණු පරීක්ෂාකර බලා ඒ වෙසමුණි රජුට ප්‍රකාශ කරති.

ඒ රාජධානියෙහි තඩාගය ද **ධරණී** නම් වේ. එයින් ජලය ගෙන වර්ෂාවෝ වසිති. වර්ෂාව පැතිරෙනුයේ එම තඩාගයෙනි. ඒ විල් තෙරෙහි යක්ෂයන් රැස්ව සාකච්ඡා පවත්වන **භගලවතී** නම් සභාශාලාවක් ඇත.

එහි නිරන්තරයෙන් පලබරින් පිරුණු ගස් ඇත. නොයෙක් කුරුළු සමූහයා ද එහි වෙති. මොනරුන්ගේ හා කොස්වා ලිහිණියන්ගේ නදින් ඒ පෙදෙස නිනාද වෙයි. මිහිරි කොවුල්

නදින් යුතුය. ඒ වනයෙහි ජීවංජීවක කුරුල්ලෝ ද ඔට්ටව චින්නක කුරුල්ලෝ ද චිලිකුකුළෝ ද කකුළුවෝ ද පුෂ්කර සාතක පක්ෂීහු ද සිටිති.

එහි නිරා පැළලිහිණියන්ගේ ශබ්ද හා දණ්ඩමාණවක පක්ෂීන්ගේ ශබ්ද ඇත්තේය. ඒ කුවේර පොකුණ හැම සෘතුවෙහිම නිරන්තරයෙන් ශෝභමානව පවතී.

යමෙක් ඇත්තා වූ ඒ මහරජ පාලනය කරණ පෙදෙස මෙයින් **උතුරු දෙස** යි ජනයා කියති. යක්ෂයන්ගේ අධිපති වූ කුවේර නැමැති මහා යක්ෂයන් පිරිවරා ගෙන නැටුම් ගැයුම් වලින් යුතුව වාසය කරයි. 'ඉන්ද්‍ර' යන එකම නමින් හැඳින්වෙන ගණනින් අනූඑක්දෙනෙකු වන පුත්‍රයෝ රැසක් ද ඔහුට ඇතැයි මවිසින් අසන ලදී.

ශුභබලැති මට්ටු ද මහාත්ම වූ පහසාල ස්සර බිය ඇති සූර්ය බන්ධු වූ බුදුන් ඈත දීම දැක 'අහෝ උතුම් පුරුෂයාණනි, ඔබට නමස්කාර වේවා. පුරුෂෝත්තමය ඔබට නමස්කාර වේවා' යි කියා වඳිති.

උන්වහන්සේ පවිත්‍ර ශෝභා දත් නුවණින් සියලු සතුන් දෙස බලති යි අමනුෂ්‍යයන් ද උන්වහන්සේට වඳිති යි අප විසින් නිතර අසන ලදී. එම මනුෂ්‍යයෝ මෙසේ කියති. 'ගෞතම ජිනයන්වහන්සේට වඳිමු. විද්‍යා චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ බුද්ධරජුන්ට වඳිමු' යයි කියා ඒ ජිනයන් වහන්සේට (කොටි) වඳිති'.

නිදුකානන් වහන්ස, භික්ෂූන්ගේ භික්ෂුණීන්ගේ උපාසකයන්ගේ උපාසිකාවන්ගේ උපද්‍රව වැළැක්ම පිණිස ආරක්ෂාව පිණිස හිංසා වැළැක්ම පිණිස පහසු විහරණය පිණිස පවත්නා වූ ඒ ආටානාටිය ආරක්ෂාව (පිරිත) නම් මෙයයි.

නිදුකානන් වහන්ස, යම්කිසි භික්ෂුවක් විසින් හෝ භික්ෂුණියක විසින් හෝ උපාසකයෙකු විසින් හෝ උපාසිකාවක විසින් හෝ මේ ආටානාටිය ආරක්ෂා පිරිත මනාකොට ඉගෙන ගන්නා ලද්දේ වන්නේ ද මනාකොට පුහුණු කරණ ලද්දේ වන්නේ ද,

ඉදින් ඒ පිරිත උගත්තාවූ ඔහු යම් අමනුෂ්‍යයෙක් හෝ යක්ෂයෙක් හෝ යක්ෂිණියක් හෝ යක් පැටියෙක් හෝ යක් පැටික්කියක් හෝ යක් මහ ඇමැතියෙක් හෝ යක් පිරිසෙහි වූවෙක් හෝ යක් මෙහෙකරුවෙක් හෝ ගඳඹ ස්ත්‍රියක් හෝ ගඳඹ පැටියෙක් හෝ ගඳඹ පැටික්කියක් හෝ ගඳඹ මහ ඇමැතියෙක් හෝ ගඳඹ පිරිසෙහි කෙනෙක් හෝ ගඳඹ මෙහෙකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩ ස්ත්‍රියක් හෝ කුම්භාණ්ඩ පැටියෙක් හෝ කුම්භාණ්ඩ පැටික්කියක් හෝ කුම්භාණ්ඩ මහ ඇමැතියෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි කෙනෙක් හෝ කුම්භාණ්ඩ අනුචරයෙක් හෝ නාගයෙක් හෝ නාග ස්ත්‍රියක් හෝ නාග පැටියෙක් හෝ නාග පැටික්කියක් හෝ නාග මහ ඇමැතියෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාගමෙහෙකරුවෙක් හෝ දුෂිත සිතැත්තේ යන්නා වූ (ඔවුන් පිරිසෙන් කෙනෙකු) අනුව යයි ද සිටින කෙනෙකුට ළංව සිටියි ද හිඳින කෙනෙකුට ළංව හිඳියි ද සැතපෙන කෙනෙකුට ළංව නිදයි ද

නිදුකානන් වහන්ස, ඒ අමනුෂ්‍යයා මාගේ ගම්හි හෝ නියම් ගම්හි හෝ සත්කාරයක් සම්මානයක් නාම නොලබන්නේය. නිදුකානන් වහන්ස, ඒ අමනුෂ්‍යයාට මගේ ආලකමන්දා රාජධානියෙහි ගෙයක් හෝ පිහිටීමක් හෝ නොලැබෙන්නේය.

නිදුකාණන් වහන්ස ඒ අමනුෂ්‍යයාට යක් සමාගමට යක්ව (අවසර) නොලැබෙන්නේය. තවද නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයා ආවාහ විවාහවලදී ද සෙසු අමනුෂ්‍යයන් විසින් බැහැර (පිටමං) කරනු ලබන්නේය.

තවද නිදුකාණන් වහන්ස, සියලු අමනුෂ්‍යයෝ යක්ෂයාගේ බැණීම නම් වූ පරිභව වචනයෙන් බණින්නාහ. හිස් ද පාරන්නාහ. තවද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහුගේ හිසෙහි හිස් ලෝහපාත්‍රයක් නමන්නාහ. තවද අමනුෂ්‍යයෝ ඔහුගේ හිස සත්කඩකට පළන්නාහ. නිදුකාණන් වහන්ස, සැඩපරුෂ වූ රෞද්‍ර වූ එසාවටක කරන්නා වූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතර වරම් රජදරුවන්ගේ බස් නොපිළිගනිති. එම වරම් රජවරුන්ගේ ඇමැතියන්ගේ බස් ද නොපිළිගනිති. වරම් රජවරුන්ගේ ඇමැති නියෝජිතයන්ගේ බස් ද නොපිළිගනිති. නිදුකාණන් වහන්ස ඒ අමනුෂ්‍යයෝ සතර වරම් රජදරුවන්ට සතුරු වූවෝ යයි කියනු ලැබෙති.

නිදුකාණන් වහන්ස, මගධ රටෙහි රජුගේ විජිතයෙහි සොරු යම් සේ එම රජුගේ වචනය නොපිළිගනිත් ද මගධ රජුගේ ඇමැතියන්ගේ වචනය නොපිළිගනිත් ද මගධ ඇමැති නියෝජිතයන්ගේ වචනය නොපිළිගනිත් ද ඒ මහසොරු මගධ රජුගේ පසමිතුරෝ යයි කියනු ලබති.

එමෙන් නිදුකාණන් වහන්ස, සතර වරම් රජ දරුවන්ගේ වචනය නොපිළිගන්නා සැඩපරුෂ, රෞද්‍ර, එසාවටක කරන අමනුෂ්‍යයෝ වෙති. ඔව්හු සතර වරම් රජවරුන්ගේ බස් නොඅදහති. ඔවුන්ගේ ඇමැතියන්ගේ බස් නොඅදහති. ඇමැතියන්ගේ නියෝජිතයන්ගේ බස් නොඅදහති. ඒ අමනුෂ්‍යයෝ සතර වරම් මහරජවරුන්ගේ පසමිතුරෝ යයි කියනු ලබති.

නිදුකාණන් වහන්ස, යම්කිසි අමනුෂ්‍යයෙක්, යකෙක් හෝ වේවා, යකින්නක් හෝ වේවා යක් පැටියෙක් හෝ වේවා යක් පැටික්කියක් හෝ වේවා යක් මහඇමැතියෙක් හෝ වේවා යක් පිරිසෙහි වූවෙක් හෝ වේවා යක් සේවකයෙක් හෝ වේවා ගන්ධබ්බයෙක් හෝ ගන්ධබ්බියක් හෝ වේවා ගන්ධබ්බ පැටියෙක් හෝ පැටික්කියක් හෝ වේවා ගන්ධබ්බ මහ ඇමැතියෙක්, ගන්ධබ්බ පිරිසෙහි වූවෙක් ගන්ධබ්බ මෙහෙකරුවෙක් හෝ වේවා,

කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පැටියෙක් හෝ කුම්භාණ්ඩ පැටික්කියක් හෝ කුම්භාණ්ඩ මහඇමැතියෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ වේවා,

නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පැටියෙක් හෝ නාග පැටික්කියක් හෝ නාග මහඇමැතියෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග සේවකයෙක් හෝ නපුරු සිතැත්තේ භික්ෂුවක හෝ භික්ෂුණියක හෝ උපාසකයකු හෝ උපාසිකාවක හෝ ගමන් කිරීම් යන විට ඔහු පසින් යන්නේ ද සිටින්නාහු ළඟට වී සිටින්නේ ද හුන්නාහු සමීපයෙහි හිඳින්නේ ද නිදන්නාහු ළඟට වී නිදන්නේ ද [illegible] (ස්වාමී) යක්ෂයාට මහ යක්ෂයාට සේනාපතියන්ට, මහ සේනාපතියන්ට කියන සේ 'මේ යකා (අප) අල්ලා ගන්නේය, මේ යකා (අපට) ආවේශ වී යන්නේය, මේ යකා (අප) පෙළන්නේය, මේ යකා (අපට) පීඩා කරන්නේය, මේ යකා අපට හිංසා පාරන්නේය, මේ යකා අපට බොහෝවින් හිංසා කරන්නේය, මේ යකා (අප) අත් නොහැර අල්ලා ගෙන සිටින්නේ යයි (කියා) දැන්විය යුතුය. හඬ නගා කිය යුතුය, කෑ ගසා කිය යුතුය.

(එසේ කිය යුත්තේ) කවර යක්ෂයන්ට ද කවර මහායක්ෂයන්ට ද කවර යක් සෙන්පතියන්ට ද කවර මහා යක් සෙන්පතියන්ට ද? (යතහොත්) ඉන්ද්‍රය, සෝමය, වරුණය, භාරද්වාජය, පජාපතිය, චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය.

පණාදය, ඕපමඤ්ඤය, දේවසූතය, මාතලීය, චිත්තසේනය, ගන්ධබ්බය, නලය රාජය, ජනේසභය.

සාතාගිරය, හේමවතය, පුණ්ණකය, කරතිය, ගුලය, සිවකය, මුචලින්දය, වෙස්සාමිත්තය, යුගන්ධරය.

ගොපාලය, සුප්පගේධය, හිරිනෙත්තිය, මන්දියය, පඤ්චාලය චණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුඛය, දධිමුඛය, මණිමාණිචරය, දීඝය, සේරිස්සකය (යන මොවුන්ටය).

මේ යක්ෂයන්ට මහායක්ෂයන්ට යක් සෙනෙවියන්ට යක්මහ සෙනෙවියන්ට දැන්විය යුතුය, හඬගා කිය යුතුය, කෑගසා මෙසේ කිය යුතුය.

මේ යකා (අප) අල්ලා ගනී. මේ යකා (අපට) ආවේශ වෙයි...... මේ යකා (අප) නොනොහැර අල්ලා ගෙන සිටී යයි (......කෑ ගසා කිය යුතුය)

නිදුකාණන් වහන්ස, මේ ආටානාටිය ආරක්ෂාව වනාහි භික්ෂූන්ගේ ද භික්ෂුණීන්ගේ ද උපාසකයන්ගේ ද උපාසිකාවන්ගේ ද රැකීම පිණිස, ආරක්ෂාව පිණිස, නොවෙහෙසීම පිණිස, පහසු විහරණය පිණිස පවතී.

නිදුකාණන් වහන්ස, අපි බොහෝ වැඩපල ඇත්තෝ වෙමු. බොහෝ කළ යුතු දේ ඇත්තෝ වෙමු. එහෙයින් දැන් අපි පිටත්ව යමු යි සිව්වරම් දෙවි රජවරු බුදුරජාණන් වහන්සේට දන්වා සිටියහ.

“මහරජවරුනි, තොප රිසි කල් දනුව”යි බුදුරජාණන් වහන්සේ අවසර දුන් සේක.

එවිට ඒ සිව්වරම් රජවරු වාඩි වී හුන් තැනින් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට එතැන්හි දී අතුරුදහන්ව ගියහ. ඒ (සිව්වරම්) යක්ෂයෝ ද හුන් තැනින් නැගිට සමහරු භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට අතුරුදහන් වූහ. සමහරු භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කොට අතුරුදහන්ව ගියහ. සමහරු භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් දෙසට ඇඳිලි බැඳ අතුරුදහන්ව ගියහ. සමහරු තම තමන්ගේ නාමගොත් කියා අතුරුදහන්ව ගියහ. සමහරු නිහඬව ම අතුරුදහන්ව ගියහ.

**තෙවන බණවර නිමි.**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඉකුත් වූ පසු භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක. මහණෙනි, ඉකුත් රාත්‍රියෙහි සිව්වරම් රජවරු විශාල යක් පිරිසක්, ගන්ධර්ව පිරිසක්, කුම්භාණ්ඩ පිරිසක් සහ නාග පිරිසක් ද කැටුව සිව් දෙසෙහි ආරක්ෂා සංවිධාන තරකොට පිහිටුවා රෑ මැදුම් යාමෙහි මුළු ගිජුකුළු පව්ව ආලෝකවත් කරමින් මා වෙත එළඹ මා වැඳ එකත් පස්ව හුන්හ. ඒ යක්ෂයෝ ද මා වෙත පැමිණ සමහරු මට වැඳ එකත් පස්ව හුන්හ. සමහරු මා සමඟ පිළිසඳර කතාකොට එකත් පස්ව හුන්හ. සමහරු නම නමින්ගේ නාම ගොත් මට ඇසෙන්ට කියා එකත් පස්ව හුන්හ.

එකත් පස්ව හුන් වෙසමුණු මහරජ මට මෙසේ දැන්විය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූ මහානුභාව ඇති යක්ෂයෝ සිටිති. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුනු මහානුභාව සම්පන්න යක්ෂයෝ ද සිටිති............................)

(මෙතැන් සිට ආටානාටිය සූත්‍රයෙහි දෙවන බණවරෙහි අර්ථ තේරුම් ගැනීම පහසුය. පළමු බණවරට වඩා මෙහි වෙනස වනුයේ පළමු බණ වරේදී වෙසමුණු රජ බුදුරජානන් වහන්සේට කී දෙය දෙවන බණ වරේදි බුදුරජානන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට දේශනා කළ ආකාරයෙන් ලියා තිබීම පමණකි.)

**නිමි.**

# උපග්‍රන්ථය

## අතිරේක පිරිත් සූත්‍ර ආදිය

### 1. පිරිත් ආරාධනාව

**විපත්ති පටිබාහාය - සබ්බසම්පත්ති සිද්ධියා**
**සබ්බදුක්ඛවිනාසාය- පරිත්තං බෲථ මඞ්ගලං.**

ඉහත සඳහන් ගාථාව තුන්වරක් කියා පිරිත් දෙසීමට මණ්ඩපය තුළ වැඩ සිටින මහා සංඝයාට ආරාධනා කළ යුතුය. පළමු වර "සබ්බ දුක්ඛ විනාසාය" යනුවෙන් ද දෙවන වර "සබ්බභය විනාසාය" යනුවෙන් ද තුන්වන වර "සබ්බරෝග විනාසාය" යනුවෙන් ද වෙනස් කොට කිය යුතුය.

### 2. පිරිත් පේකිරීම

අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා, සඞ්ඛාර නිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා, සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො ඵස්ස නිරොධා, වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

**අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨෝසි පුන ගෙහං න කාහසි**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං**
**විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා'ති.**

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඕපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.

සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවක සඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

## 3. ජයමඞ්ගල ගාථා

1. බාහුං සහස්සමභිනිම්මිත සා'යුධං තං
ගිරිමෙඛලං උදිතඝොරසසෙනමාරං,
දානාදිධම්මවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

2. මාරාතිරෙකමභියුජ්ඣිතසබ්බරත්තිං
ඝොරම්පනා'ළවකමක්ඛමථද්ධයක්ඛං,
ඛන්තී සුදන්තවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

3. නාළාගිරිං ගජවරං අතිමත්තභූතං
දාවග්ගිචක්කමසනීව සුදාරුණං තං,
මෙත්තම්බුසෙකවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදාරුණං තං
ධාරං තියොජනපථඞ්ගුලිමාලවන්තං,
ඉද්ධීභිසඞ්ඛතමනො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

5. කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨවචනං ජනකායමජ්ඣෙ,
සන්තෙන සොමවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

6. සච්චං විහාය මතිසච්චකවාදකෙතුං
වාදාභිරොපිතමනං අතිඅන්ධභූතං,
පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

7. නන්දොපනන්දභුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙරභුජගෙන දමාපයන්තො,
ඉද්ධූපදෙසවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

8. දුග්ගාහදිට්ඨිභුජගෙන සුදට්ඨහත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං,
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

9. එතා'පි බුද්ධජයමඞ්ගල අට්ඨගාථා
යො වාචනො දිනදිනෙ සරතෙ ම'තන්දී,
හිත්වාන නෙකවිවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො.

භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා,
සබ්බබුද්ධානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ

භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බධම්මානුභාවෙන සදා සොත්ථි භවන්තු තෙ

භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බසංඝානුභාවෙන සදා සොත්ථි භවන්තු තෙ

**(මඞ්ගල, රතන, කරණීයමෙත්ත යන තුන් සූත්‍රය මෙතැනට දේශනා කළයුතුයි.)**

යන්දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවෙන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවෙන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
සංඝානුභාවෙන විනාසමෙන්තු

සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චේකානඤ්ච යං බලං,
අරහන්තානඤ්ච තේජේන රක්ඛං බන්ධාමි සබ්බසෝ.

## 4. මහා ජයමඞ්ගලගාථා

මහාකාරුණිකො නාථො, හිතාය සබ්බපාණිනං,
පූරෙත්වා පාරමී සබ්බා, පත්තො සම්බොධිමුත්තමං,
එතෙන සච්චවජ්ජෙන, හොතු තෙ ජයමඞ්ගලං.

ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දිවඩ්ඪනො,
එවං තුය්හං ජයො හොතු, ජයස්සු ජයමඞ්ගලං

සක්කත්වා බුද්ධරතනං, ඔසධං උත්තමං වරං,
හිතං දේවමනුස්සානං, බුද්ධතේජේන සොත්ථිනා,
නස්සන්තු'පද්දවා සබ්බේ, දුක්ඛා වූපසමෙන්තු තේ.

සක්කත්වා ධම්මරතනං, ඔසධං උත්තමං වරං,
පරිළාහූපසමනං , ධම්මතේජේන සොත්ථිනා,
නස්සන්තු'පද්දවා සබ්බේ, භයා වූපසමෙන්තු තේ.

සක්කත්වා සංඝරතනං, ඔසධං උත්තමං වරං,
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං, සංඝතේජේන සොත්ථිනා,
නස්සන්තු'පද්දවා සබ්බේ, රෝගා වූපසමෙන්තු තේ.

යං කිංචි රතනං ලෝකෙ විජ්ජති විවිධා පුථූ,
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ.

යං කිංචි රතනං ලෝකෙ විජ්ජති විවිධා පුථූ,
රතනං ධම්ම සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ.

යං කිංචි රතනං ලෝකෙ විජ්ජති විවිධා පුථූ,
රතනං සංඝ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ.

නත්ථි මේ සරණං අඤ්ඤං, බුද්ධෝ මේ සරණං වරං,
ඒතේන සච්චවජ්ජේන, හෝතු තේ ජයමංගලං.

නත්ථි මේ සරණං අඤ්ඤං, ධම්මෝ මේ සරණං වරං,
ඒතේන සච්චවජ්ජේන, හෝතු තේ ජයමංගලං.

නත්ථි මේ සරණං අඤ්ඤං, සංඝෝ මේ සරණං වරං,
ඒතේන සච්චවජ්ජේන, හෝතු තේ ජයමංගලං.

සබ්බීතියෝ විවජ්ජන්තු, සබ්බරෝගෝ විනස්සතු,
මා තේ භවත්වන්තරායෝ, සුඛී දීඝා'යුකෝ භව.

භවතු සබ්බමංගලං, රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බබුද්ධා'නුභාවේන, සදා සොත්ථී භවන්තු මෙ.

භවතු සබ්බමංගලං, රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බධම්මා'නුභාවේන, සදා සොත්ථී භවන්තු මෙ.

භවතු සබ්බමංගලං, රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බසංඝා'නුභාවේන, සදා සොත්ථී භවන්තු මෙ.

නක්ඛත්තයක්ඛභූතානං, පාපග්ගහනිවාරණා,
පරිත්තස්සානුභාවේන, හනන්තු මය්හං උපද්දවෙ

(ගාථාවන්හි 'මෙ' යන්නෙහි තේරුම 'මට' යනුයි. 'මය්හං' යන්නෙහි තේරුම 'මගේ' යනුයි. අනුන්ට කියන කල එතැනට 'තෙ' යනු ද 'තුය්හං' යනු ද යොදා කිය යුතුයි 'දීඝායුකො හව' යන තැන්හි 'හව' යනු තමාට කියාගන්නා කල 'හොමි' යි කිය යුතුයි.)

## 5. ඇතවුම් පිරිත

යෙ සන්තා සන්තචිත්තා තිසරණසරණා එත්ථ ලොකන්තරෙ වා
භුම්මා භුම්මා ච දෙවා ගුණගණගහණබ්‍යාවටා සබ්බකාලං,
එතෙ ආයන්තු දෙවා වරකනකමයෙ මේරුරාජේ වසන්තා
සන්තො සන්තොසහෙතුං මුනිවරවචනං සොතුමග්ගං සමග්ගා.

සබ්බෙසු චක්කවාලෙසු, යක්ඛා දෙවා ච බ්‍රහ්මුණො,
යං අම්හෙහි කතං පුඤ්ඤං, සබ්බසම්පත්ති සාධකං,
සබ්බෙ තං අනුමොදිත්වා, සමග්ගා සාසනෙ රතා,
පමාදරහිතා හොන්තු, ආරක්ඛාසු විසෙසතො.

සාසනස්ස ච ලොකස්ස, වුඩ්ඪි භවතු සබ්බදා,
සාසනම්පි ච ලොකඤ්ච, දෙවා රක්ඛන්තු සබ්බදා,
සද්ධිං හොන්තු සුඛී සබ්බෙ, පරිවාරෙහි අත්තනො,
අනීඝා සුමනා හොන්තු, සහ සබ්බෙහි ඤාතිභි.

රාජතො වා චොරතො වා මනුස්සතො වා අමනුස්සතො වා අග්ගිතො වා උදකතො වා පිසාචතො වා ඛාණුකතො වා කණ්ටකතො වා නක්ඛත්තතො වා ජනපදරොගතො වා අසද්ධම්මතො වා අසන්දිට්ඨිතො වා අසප්පුරිසතො වා චණ්ඩහත්ථි අස්ස මිග ගොණ කුක්කුර අහි විච්ඡිකා මණි සප්ප දීපි අච්ඡ තරච්ඡ සූකර මහිස යක්ඛ රක්ඛසාදීහි නානා භයතො වා නානා රොගතො වා නානා උපද්දවතො වා ආරක්ඛං ගණ්හන්තු. පණිධානතො පට්ඨාය තථාගතස්ස දසපාරමියො දස උපපාරමියො දස පරමත්ථපාරමියො පඤ්චමහාපරිච්චාගෙ තිස්සො චරියා පච්ඡිම භවෙ ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමණං පධානචරියං බොධිපල්ලඞ්කෙ මාරවිජයං සබ්බඤ්ඤුතඤ්ඤාණ පටිවෙධං නවලොකුත්තර ධම්මන්ති සබ්බෙපි'මෙ බුද්ධගුණෙ ආවජ්ජිත්වා වෙසාලියං තීසු පාකාරන්තරෙසු තියාමරත්තිං පරිත්තං කරොන්තො ආයස්මා ආනන්දත්ථෙරො විය කාරුඤ්ඤචිත්තං උපට්ඨපෙත්වා.

**(රතනසුත්‍රාදි පිරිත් සූත්‍ර මීළඟට කිය යුතුයි.)**

## 6. ජිනපඤ්ජරය

ජයාසනගතා වීරා, ජෙත්වා මාරං සවාහිනිං,
චතුසච්චාමතරසං, යෙ පිවිංසු නරාසභා.

තණ්හඞ්කරාදයො බුද්ධා, අට්ඨවීසති නායකා,
සබ්බෙ පතිට්ඨිතා මය්හං, මත්ථකෙ තෙ මුනිස්සරා.

සිරෙ පතිට්ඨිතා බුද්ධා, ධම්මො ච තව ලොචනෙ,
සඞ්ඝො පතිට්ඨිතො මය්හං, උරෙ සබ්බගුණාකරො,

හදයෙ අනුරුද්ධො ච, සාරිපුත්තො ච දක්ඛිණෙ,
කොණ්ඩඤ්ඤො පිට්ඨිභාගස්මිං, මොග්ගල්ලානො'සි වාමකෙ.

දක්ඛිණෙ සවණෙ මය්හං, ආහුං ආනන්දරාහුලා,
කස්සපො ච මහානාමො, උභො'සුං වාමසොතකෙ.

කෙසන්තෙ පිට්ඨිභාගස්මිං, සුරියො ව පභංකරො,
නිසින්නො සිරිසම්පන්නො, සොභිතො මුනිපුඞ්ගවො.

කුමාරකස්සපො නාම, මහෙසී චිත්‍රවාදකො,
සො මය්හං වදනෙ නිච්චං පතිට්ඨාසි ගුණාකරො.

පුණ්ණො අඞ්ගුලිමාලො ච, උපාලි නන්දසීවලී.
ථෙරා පඤ්ච ඉමෙ ජාතා, ලලාටෙ තිලකා මම

සෙසාසීතිමහාථෙරා, විජිතා ජිනසාවකා,
ජලන්තා සීලතෙජෙන, අඞ්ගමඞ්ගෙසු සණ්ඨිතා.

රතනං පුරතො ආසි, දක්ඛිණෙ මෙත්තසුත්තකං
ධජග්ගං පච්ඡතො ආසි, වාමෙ අඞ්ගුලිමාලකං

ඛන්ධමොරපරිත්තඤ්ච, ආටානාටියසුත්තකං,
ආකාසච්ඡදනං ආසි, සෙසා පාකාරසණ්ඨිතා.

ජිනා'ණාබල සංයුත්තෙ, ධම්මපාකාරලඞ්කතෙ,
වසතො මෙ චතුකිච්චෙන, සදා සම්බුද්ධපඤ්ජරෙ.

වාතපිත්තාදිසඤ්ජාතා, බාහිරජ්ඣත්තුපද්දවා
අසෙසා විලයං යන්තු, අනන්තගුණතෙජසා.

ජිනපඤ්ජරමජ්ඣට්ඨං විහරන්තං මහීතලෙ,
සදා පාලෙන්තු මං සබ්බෙ, තෙ මහාපුරිසාසභා

ඉච්චෙවමච්චන්තකතො සුරක්ඛො
ජිනා'නුභාවෙන ජිතූ'පද්දවො,
බුද්ධා'නුභාවෙන හතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්ම'නුභාවපාලිතො,

ඉච්චෙවමච්චන්තකතො සුරක්ඛො
ජිනා'නුභාවෙන ජිතූ'පද්දවො,
ධම්මා'නුභාවෙන හතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්ම'නුභාවපාලිතො.

ඉච්චෙවමච්චන්තකතො සුරක්ඛො
ජිනා'නුභාවෙන ජිතූ'පද්දවො,
සඞ්ඝා'නුභාවෙන ජිතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්ම'නුභාවපාලිතො,

සද්ධම්මපාකාරපරික්ඛිත්තොසි
අට්ඨා'රියා අට්ඨ දිසාසු හොන්ති,
එත්ථන්තරෙ අට්ඨ නාථා භවන්ති
උද්ධං විතානං ච ජිනා ඨිතා තෙ.

භින්දන්තො මාරසෙනං තව සිරසි ඨිතො,
බොධිමාරුය්හ සත්ථා,
මොග්ගල්ලානො'සි වාමෙ වසති භුජතටෙ,
දක්ඛිණෙ සාරිපුත්තො,
ධම්මො මජ්ඣෙ උරස්මිං විහරති භවතො,
මොක්ඛතො මොරයොනිං
සම්පත්තො බොධිසත්තො චරණයුග ගතො
භානුලොකෙකනාථො.

සබ්බා'වමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බී'තිරොගගහදොසමසෙසනින්දා,
සබ්බ'න්තරාය භයදුස්සුපිනං අකන්තං,
බුද්ධා'නුභාවපවරෙන පයාතු නාසං.

සබ්බා'වමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බී'තිරොගගහදොසමසෙසනින්දා,
සබ්බ'න්තරාය භයදුස්සුපිනං අකන්තං,
ධම්මා'නුභාවපවරෙන පයාතු නාසං.

සබ්බා'වමඞ්ගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බී'තිරොගගහදොසමසෙසනින්දා,
සබ්බ'න්තරාය භයදුස්සුපිනං අකන්තං,
සඞ්ඝා'නුභාවපවරෙන පයාතු නාසං.

(තමන්ට ම පිරිත් කියා ගන්නා විට "තුය්හං" යන තැනට "මය්හං" කියා ද, "තෙ" යන තැනට "මේ" කියා ද, "තව" යන තැනට "මම" කියා ද, "තුවං" යන්නට "මං" කියා ද, "වරාහි" යන්නට "වරාමි" කියා ද, "පරික්ඛිතොසි" යන්නට "පරික්ඛිතො අස්මි" කියා ද යොදගත යුතු.)

## 7. අටවිසි පිරිත

තණ්හඞ්කරො මහාවීරො, මේධංකරො මහායසො,
සරණංකරො ලොකහිතො, දීපංකරො ජුතින්ධරො.

කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛො, මඞ්ගලො පුරිසාසභො,
සුමනො සුමනො ධීරො, රේවතො රතිවඩ්ඪනො

සොභිතො ගුණසම්පන්නො, අනොමදස්සී ජනුත්තමො,
පදුමො ලොකපජ්ජොතො, නාරදො වරසාරථී.

පදුමුත්තරො සත්තසාරො, සුමෙධො අප්පටිපුග්ගලො,
සුජාතො සබ්බලොකග්ගො, පියදස්සී නරාසභො.

අත්ථදස්සී කාරුණිකො, ධම්මදස්සී තමොනුදො,
සිද්ධත්ථො අසමො ලොකෙ, තිස්සො වරදසංවරො.

ඵුස්සො වරදසම්බුද්ධො, විපස්සී ච අනූපමො,
සිඛී සබ්බහිතො සත්ථා, වෙස්සභූ සුඛදායකො.

කකුසන්ධො සත්ථවාහො, කොණාගමනො රණඤ්ජහො,
කස්සපො සිරිසම්පන්නො, ගොතමො සක්‍යපුඞ්ගවො.

එතෙසං සච්චේන සීලෙන, ඛන්තිමෙත්තබලෙන ච,
තේ'පි තුවං අනුරක්ඛන්තු, ආරොග්‍යෙන සුඛෙන ච'ති.

යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං,
බුද්ධා'නුභාවේන විනාසමේන්තු.

(මේ ගාථාවෙහි "බුද්ධානුභාවේන" යන තැනට "ධම්මානුභාවේන" සහ "සංඝානුභාවේන" යනුවෙන් යොදා තුන්වරක් කිය යුතුයි.)

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා, භයප්පත්තා ච නිබ්භයා,
සෝකප්පත්තා ච නිස්සෝකා, හොන්තු සබ්බේ'පි පාණිනෝ.

එත්තාවතා ච අම්හේහි, සම්භතං පුඤ්ඤසම්පදං,
සබ්බේ දේවා'නුමෝදන්තු, සබ්බසම්පත්තිසිද්ධියා.

දානං දදන්තු සද්ධාය, සීලං රක්ඛන්තු සබ්බදා,
භාවනා'භිරතා හොන්තු, ගච්ඡන්තු දේවතා'ගතා

සබ්බේ බුද්ධා බලප්පත්තා, පච්චේකානඤ්ච යං බලං,
අරහන්තානඤ්ච තේජේන, රක්ඛං බන්ධාමි සබ්බසෝ.

නක්ඛත්තයක්ඛභූතානං, පාපග්ගහනිවාරණං,
පරිත්තස්සානු'භාවේන, හන්තු තේසං උපද්දවේ.

ආකාසට්ඨා ච භුම්මට්ඨා, දේවා නාගා මහිද්ධිකා,
පුඤ්ඤං තං අනුමෝදිත්වා, චිරං රක්ඛන්තු සාසනං.

## 8. අඞ්ගුලිමාල පිරිත.

පරිත්තං යං භණන්තස්ස, නිසින්නට්ඨාන ධෝවනං,
උදකම්පි විනාසේති, සබ්බමේව පරිස්සයං,
සොත්ථිනා ගබ්භවුට්ඨානං, යං ච සාධේති තං ඛණේ,
ථේරස්සඞ්ගුලිමාලස්ස, ලෝකනාථේන භාසිතං,
කප්පට්ඨායි මහාතේජං, පරිත්තං තං භණාමහේ.

යතෝ'හං භගිනි අරියාය ජාතියා ජාතෝ නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපේතා, තේන සච්චේන සොත්ථි තේ හෝතු සොත්ථි ගබ්භස්ස.

(දරු ප්‍රසූතිය අපහසු කාන්තාවන්ට මෙයින් පිරිත් කියා යවිබව පැන් ගැමෙන් පහසුවෙන් ප්‍රසූතිය සිදුවන බව ද සර්වඥයන් වහන්සේ ඒ සඳහා ම වදාරන ලද බව ද සඳහන් වේ).

# 9. ජය පිරිත

සිරි ධිති මති තෙජො ජයසිද්ධි මහිද්ධි මහාගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණසමත්ථස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස. ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානුභාවෙන අසීත්‍යානුබ්‍යඤ්ජනලක්ඛණානුභාවෙන අට්ඨුත්තරසත මඞ්ගලලක්ඛණානුභාවෙන ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන කෙතුමාලානුභාවෙන දස පාරමිතානුභාවෙන දස උපපාරමිතානුභාවෙන දස පරමත්ථ පාරමිතානුභාවෙන සීල සමාධි පඤ්ඤානුභාවෙන බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන සඞ්ඝානුභාවෙන තෙජානුභාවෙන ඉද්ධානුභාවෙන බලානුභාවෙන ඤෙය්‍යධම්මානුභාවෙන චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවෙන නවලොකුත්තරධම්මානුභාවෙන අට්ඨඞ්ගිකමග්ගානුභාවෙන අට්ඨසමාපත්ත්‍යානුභාවෙන ඡළභිඤ්ඤානුභාවෙන මෙත්තාකරුණා මුදිතා උපෙක්ඛානුභාවෙන සබ්බ පාරමිතානුභාවෙන රතනත්තය සරණානුභාවෙන තුය්හං සබ්බ රොග සොක උපද්දව දුක්ඛ දොමනස්සුපායාසා විනස්සන්තු. සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු. දීඝායුකො හොතු, සතවස්සජීවෙන සමඞ්ගිකො හොතු. සබ්බදා ආකාස පබ්බත වන භූමි තටාක ගඞ්ගා මහාසමුද්ද ආරක්ඛක දෙවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු සබ්බබුද්ධානුභාවෙන සබ්බධම්මානුභාවෙන සබ්බසංඝානුභාවෙන බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තිණ්ණං රතනානං ආනුභාවෙන චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවෙන පිටකත්තයානුභාවෙන ජිනසාවකානුභාවෙන සබ්බෙ තෙ රොගා, සබ්බෙ තෙ භයා, සබ්බෙ තෙ අන්තරායා, සබ්බෙ තෙ උපද්දවා, සබ්බෙ තෙ දුන්නිමිත්තා, සබ්බෙ තෙ අවමඞ්ගලා විනස්සන්තු.

ආයු වඩ්ඪතො ධන වඩ්ඪතො සිරි වඩ්ඪතො යස වඩ්ඪතො බල වඩ්ඪතො වණ්ණ වඩ්ඪතො සුඛ වඩ්ඪතො හොතු සබ්බදා.

දුක්ඛරොගභයා වෙරා - සොකා සත්තු උපද්දවා,
අනෙකා අන්තරායා'පි විනස්සන්තු ච තෙජසා

ජයසිද්ධි ධනං ලාභං සොත්ථි භාග්‍යං සුඛං බලං
සිරිආයු ච වණ්ණො ච භොගවුද්ධි ච යසවා
සතවස්සා ච ආයු ච ජීවසිද්ධි ච හොතු තෙ

(මෙම පිරිත සියලු රෝගයන්ට ද අමනුෂ්‍යභයට හා ග්‍රහදෝෂ වලට ද යහපති "තුය්හං" යන්නට "මය්හං" කියා ද "තෙ" යන්නට "මෙ" කියා ද තමන්ම කියාගන්නා විට යොදගත යුතුය "තුම්හෙ" යන තැනට "අම්හෙ" කියා යොදා ගත යුතුය).

## 10. බොජ්ඣඞ්ග පිරිත

සංසාරෙ සංසරන්තානං, සබ්බදුක්ඛවිනාසනෙ,
සත්ත ධම්මෙ ච බොජ්ඣඞ්ගෙ, මාරසෙනා පමද්දනෙ.

බුජ්ඣිත්වා යෙ'චිමෙ සත්තා තිභවා මුත්තකුත්තමා,
අජාතිං අජරාබ්‍යාධිං, අමතං නිබ්භයං ගතා.

එවමාදිගුණොපෙතං, අනෙකගුණසංගහං,
ඔසධං ච ඉමං මන්තං, බොජ්ඣඞ්ගං තං භණාමහෙ

බොජ්ඣඞ්ගො සති සංඛාතො, ධම්මානං විචයො තථා,
විරියං පීති පස්සද්ධි බොජ්ඣඞ්ගා ච තථා'පරෙ.

සමාධුපෙක්ඛ බොජ්ඣඞ්ගා සත්තෙ'තෙ සබ්බදස්සිනා
මුනිනා සම්මදක්ඛාතා, භාවිතා බහුලීකතා

සංවත්තන්ති අභිඤ්ඤාය, නිබ්බානාය ච බොධියා,
එතෙන සච්චවජ්ජෙන, සොත්ථි තෙ හොතු සබ්බදා,

එකස්මිං සමයෙ නාථො, මොග්ගල්ලානඤ්ච කස්සපං,
ගිලානෙ දුක්ඛිතෙ දිස්වා, බොජ්ඣඞ්ගෙ සත්ත දෙසයි

තෙ ච තං අභිනන්දිත්වා, රොගා මුච්චිංසු තං ඛණෙ,
එතෙන සච්චවජ්ජෙන, සොත්ථි තෙ හොතු සබ්බදා

එකදා ධම්මරාජා'පි, ගෙලඤ්ඤෙනා'භිපීළිතො,
චුන්දත්ථෙරෙන තං යෙව, භණාපෙත්වාන සාදරං

සම්මොදිත්වා ච ආබාධා, තම්හා වුට්ඨාසි ඨානසො,
එතෙන සච්චවජ්ජෙන සොත්ථි තෙ හොතු සබ්බදා,

පහීණා තෙ ච ආබාධා, තිණ්ණන්නම්පි මහෙසිනං,
මග්ගාහතකිලෙසා'ව පත්තා'නුප්පත්තිධම්මතං,
එතෙන සච්චවජ්ජෙන, සොත්ථි තෙ හොතු සබ්බදා.

**(සියලු ආරක්ෂාවටම යහපති. තමා සඳහා කියාගන්නා විට "මෙ" යනු යොදගත යුතුය.)**

## 11. චක්ක පිරිත

දස සහස්සුද්ධපාරමිතො, බුද්ධො ලොකග්ගනායකො,
මාරසෙනා අභිජ්ජන්තා, සම්පත්තා ද්වාදස යොජනා.

ඛන්ති මෙත්තමධිට්ඨානං, විමංසිත්වාන චක්ඛුම්හා,
නවාහතෙව සරනානං, දිසං චක්කං විසොධයි

අපරියන්තක සත්තානං හිතාය ච සුඛාය ච,
බුද්ධං නිච්චං විසොධෙසි පරිත්තං තං භණාමහෙ.

යථාපි විශ්‍රුතො සත්ථා, අධිගතො සො මහායං ධම්මෙන. එවං මාරසෙනං විද්ධංසෙය්‍යං, පලාපෙය්‍යං, අසිවකාසදිසං චක්කං, එවං තිතක්ඛ මයා පාරමියො පූරෙත්වා බුද්ධත්තං පත්වා මාරසෙනං විද්ධංසෙත්වා ලද්ධධම්මචක්කස්සානුභාවෙන,

පුරත්ථිමාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

අග්ගිසාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

දක්ඛිණාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

නිරිතියාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

පච්ඡිමාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

වායබ්බාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

උත්තරාය දිසාය ආගතානි අරිභයානි
අසීතිභයසහස්සානි පටික්කමන්තු.

ඊසානාය දිසාය ආගතානි අරිභයානි
අසීතියා භයස්සානි පටික්කමන්තු.

උපරිමාය දිසාය ආගතානි අභියානි
අසීතියක්ඛසහස්සානි පටික්කමන්තු.

හෙට්ඨිමාය දිසාය ආගතානි අභියානි
අසීතියක්ඛසහස්සානි පටික්කමන්තු.

අසීති චක්කවාළසහස්සං වසන්තං, එවං නිප්පඤ්ච මයා පාරමියො පූරෙත්වා බුද්ධත්තං පත්වා මාරසෙනං විද්ධංසෙත්වා ලද්ධධම්මචක්කසක්කානුභාවෙන

ඉමස්මිං ඨානෙ ඉමස්මිං විහාරෙ වා ඉමස්මිං ගෙහෙ වා භික්ඛූ වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා රාජා වා රාජදෙවී වා රාජපුත්තො වා රාජධීතා වා රාජනත්තා වා රාජනත්තී වා, **භූතානං** සීස රොගො ලලාට රොගො කණ්ණ රොගො ඝාන රොගො චක්ඛු රොගො මුඛ රොගො දන්ත රොගො ඔට්ඨ රොගො සකලසරීර රොගො සඤ්ජාපයති කායා ද්වත්තිංසාකාරම් කාරණීය කොළඹය උපද්දවා දය නාශකා අට්ඨ දෙයා පතෙබ් **තෙ** විනස්සන්තු, පටික්කමන්තු පලායන්තු.

උද්ධං ආකාසෙ වා භූමියං වා හෙට්ඨා පථවියං වා විසාවා යක්ඛභූතා වා මා හොන්තු

භුම්මා දෙවා ආකාසදෙවා යක්ඛා තෙ සපරිවාරා **තං** පාලයන්තු

(භූතයන්ගෙන් හා නවග්‍රහයන්ගෙන් පිදුවන සියලු උපද්‍රව වලට මෙයින් 108 වරක් පිරිත් කොට නොපැදුල් විතුර බොන්ට දෙනු. තෙල් අරක්කාවත් දිය යටින් ගත් ගල් වැලි මතුරා අවකොණ විලලනු. මෙහි නම සඳහා කියන විට 'භූතානං' යන්නට 'මය්හං' කියා ද 'තෙ' යන්නට 'මෙ' කියා ද, 'තං' යන්නට 'මං' කියා ද යොද කිය යුතු යි.

## 12. ගිනි පිරිත

ජාලො මහාජාලො, ජාලං මහාජාලං, ජාලිනො මහාජාලිනො, ජාලිනං මහාජාලිනං, ධූමෙ ධූමෙ පජ්ජලෙහා, ධූමං ධූමං සම්පන්නං, ධූතං ගමිති ධූතං ගමිති, මිගයිති මිගයිති, දිට්ඨාලා දන්තලා මද්දලා රොහිලා සාරලා දුබ්බලා විහනි විහනි ලිහනි ලිහනි කිහනි කිහනි විහනි විහනි විහනි විහනි මුහනි මුහනි ධූහනි ධූහනි ධාරණී ධාරණී'ති.

සිරි ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි මහාගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණසමත්ථස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවේන, අසීත්‍යානුබ්‍යඤ්ජනලක්ඛණානුභාවේන, අට්ඨුත්තරසත මංගල ලක්ඛණානුභාවේන, ඡබ්බණ්ණරංස්‍යානුභාවේන, කේතුමාලානුභාවේන, දසපාරමිතානුභාවේන, දසඋප පාරමිතානුභාවේන, දසපරමත්ථපාරමිතානුභාවේන, සීලසමාධිපඤ්ඤානුභාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන, තේජානුභාවේන, ඉද්ධ්‍යානුභාවේන, බලානුභාවේන, ඤෙය්‍ය ධම්මානුභාවේන, චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවේන, නවලෝකුත්තරධම්මානුභාවේන, අට්ඨංගිකමග්ගානුභාවේන, අට්ඨසමාපත්ත්‍යානුභාවේන, ඡළභිඤ්ඤානුභාවේන, චතුසච්චඤාණානුභාවේන, දසබලඤාණානුභාවේන, සබ්බඤ්ඤුතඤ්ඤාණානුභාවේන, මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානුභාවේන, සබ්බපරිත්තානුභාවේන, රතනත්තයානුභාවේන, රතනත්තය සරණානුභාවේන, **තුය්හං** සබ්බ රෝග සෝක උපද්දව දුක්ඛ දෝමනස්සුපායාසා'පි විනස්සන්තු, සබ්බන්තරායාපි විනස්සන්තු, සබ්බසංකප්පා **තුය්හං** සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු, සතවස්සජීවේන සමංගිකෝ හෝතු, සබ්බදා ආකාස පබ්බත වන භූමි තලාක ගංගා මහාසමුද්ද ආරක්ඛක දේවතා සදා **තුම්හේ** අනුරක්ඛන්තු පදක්ඛිණා,

භවතු සබ්බමංගලං, රක්ඛන්තු සබ්බදේවතා, සබ්බබුද්ධානුභාවේන සබ්බධම්මානුභාවේන සබ්බසංඝානුභාවේන, සදා සොත්ථී භවන්තු **තේ**. බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තිණ්ණං රතනානං ආනුභාවේන, චතුරාසීතිසහස්සධම්මක්ඛන්ධානුභාවේන, පිටකත්තයානුභාවේන, ජිනසාවකානුභාවේන, ජිනසාසනානුභාවේන, සබ්බේ **තේ** රෝගා, සබ්බේ **තේ** භයා සබ්බේ **තේ** අන්තරායා සබ්බේ **තේ** උපද්දවා, සබ්බේ **තේ** දුන්නිමිත්තා, සබ්බේ **තේ** අවමංගලා විනස්සන්තු.

ආයු වඩ්ඪකෝ ධන වඩ්ඪකෝ සිරි වඩ්ඪකෝ යස වඩ්ඪකෝ බල වඩ්ඪකෝ වණ්ණ වඩ්ඪකෝ සුඛ වඩ්ඪකෝ හෝතු සබ්බදා

දුක්ඛ රෝග භයා වේරා, සෝකා සත්තූ චුපද්දවා,
අනේකා අන්තරායාපි, විනස්සන්තු ච තේජසා.

ජයසිද්ධි ධනං ලාභං, සොත්ථි භාග්‍යං සුඛං බලං,
සිරිආයු ච වණ්ණෝ ච, භෝගං වුද්ධී ච යසවා,
සතවස්සා ච ආයූ ච, ජීවසිද්ධී භවන්තු **තේ**

භවතු සබ්බමංගලං, රක්ඛන්තු සබ්බදේවතා,
සබ්බබුද්ධානුභාවේන, සදා සොත්ථී භවන්තු **තේ**

පඤ්චමාරජිනෝ නාථෝ, පත්තෝ සම්බෝධිමුත්තමං,
චතුසච්චං පකාසෙසි, මහාවීරං නමාමහං
එතේන සච්චවජ්ජේන, යක්ඛා භූතා පලායන්තු.

(සියලු දේට ම යහපති. තුන් වරක් කිය යුතුය. තමාට කියාගන්නා විට "තුය්හං" යන තැනට "මය්හං" කියා ද "තේ" යන තැනට "මේ" කියා ද "තුම්හේ" යන තැනට "අම්හේ" කියා ද යොදා කිය යුතුයි.)

## 13. වැසි පිරිත

සුභූති ච මහාථේරෝ, මහාකායෝ මහෝදරෝ,
නීලවණ්ණෝ මහාතේජෝ, පවස්සන්තු වලාහකා

අභිත්ථනය පජ්ජුන්න, නිධිං කාකස්ස නාසය,
කාකං සෝකාය රන්ධෙහි, මං ච සෝකා පමෝචය,
එතේන සච්චවජ්ජේන, සම්මා දේවෝ පවස්සතු.

(වැසි ලැබීම පිණිස කියනු ලබන්නකි.)

## 14. වට්ටක පිරිත

පූරෙන්තං බෝධිසම්භාරේ, නිබ්බත්තං වට්ටජාතියං,
යස්ස තේජේන දාවග්ගි, මහාසත්තං විවජ්ජයි.

ථේරස්ස සාරිපුත්තස්ස, ලෝකනාථේන භාසිතං,
කප්පට්ඨායි මහාතේජං, පරිත්තං තං භණාමහෙ

අත්ථි ලෝකේ සීලගුණෝ, සච්චං සෝචෙය්‍යනුද්දයා,
තේන සච්චේන කාහාමි, සච්චකිරියමනුත්තරං.

ආවජ්ජිත්වා ධම්මබලං, සරිත්වා පුබ්බකේ ජිනේ,
සච්චබලමවස්සාය, සච්චකිරියං අකාසහං.

සත්ති පක්ඛා අපතනා, සන්ති පාද අවඤ්චනා,
මාතාපිතා ච නික්ඛන්තා, ජාතවේද පටික්කම.

සහ සච්චෙ කතෙ මය්හං, මහාපජ්ජලිතො සිඛී.
වජ්ජෙසි සොළස කරීසානි, උදකං පත්වා යථා සිඛී.

සච්චෙන මෙ සමො නත්ථි, එසා මෙ සච්චපාරමී,
එතෙන සච්චවජ්ජෙන, සොත්ථි **තෙ** හොතු සබ්බදා.

(වස විෂ වලින් සිදුවන උවදුරුවලට ද ගිනි බිය ආදියෙන් වැළකීමට ද, දැවීමෙන් හටගත් තුවාල ආදියට වතුර - තෙල් මැතිරීමට ද සුදුසුය. තමා සඳහා "තෙ" යන තැනට "මේ" යොදා කිය යුතුයි.

## 15. ජලනන්දන පිරිත

චතුවීසති බුද්ධානං, යො ගමිස්සති උත්තමං
පාරමී සීලයුත්තෙහි, ජලනන්දන උත්තමං

අනොමාති ජලං තීරෙ, උත්තමං පාරමිවරෙ
පාරමී සො ජලං හොති, සබ්බබන්ධනභේදනං.

ආනන්දො'පි මහාථෙරං, උත්තමං ධම්මභණ්ඩාකං,
යෙන තිත්ථි මහාථෙරං, සයනෙ බන්ධනවිධංසනං

ඉති ත්‍රිලොකබුද්ධෙහි යෙන ධම්මානුභාවතො,
යන්තුමන්තුහරං සත්වා, විනාසං බුද්ධානුභාවතො,

ඉන්දිනො හොති නාමා බුද්ධං, මාරසෙනා පභිජ්ජති.
දසකොටිසහස්සානි, සබ්බබන්ධනභේදනං.

පාරමීනා ගුණා තොනන්ති යො භවිස්සති උත්තමං,
අනෙකජාතිසංසාරං, සහසං ධම්මානුභාවතො.

සයානො වා සහස්සානි උත්තමං ගුණපුග්ගලං,
අතීතං යෙන පරෙතො'පි, සබ්බවිද්ධි භවන්තු **තෙ.**

(ගැය යන දිය පාරකින් ගල්කැට 8 ක් ගෙන 108 වරක් මතුරා හිරු උදාවීමට පළමුව මුවට් නහරයා ගහා ගෙයි කොන් සතරේ වළලනු. සියලු යක්ෂ ප්‍රේත පිශාචාදීන්ගෙන් වන භය දුරු වෙයි. ගිනියම් උණට තුන් වරුවක් පිරිත් කියනු. නැසිලිතෙල් මතුරා හිස ගැල්වීම ආරක්ෂාවට යහපති. ඇස්වහ කටවහ ආදී දෝෂවලට, බාලරෝගවලට සුබයි. තමාට කියන විට 'තෙ' යන්නට 'මෙ' යොදා කිය යුතුයි.)

## 16. සතර කමටහන

බුද්ධානුස්සති මෙත්තා ච, අසුභං මරණස්සති,
ඉති ඉමා චතුරාරක්ඛා, භික්ඛු භාවෙය්‍ය සීලවා.

### i. බුද්ධානුස්සති

අනන්තවිත්ථාරගුණං, ගුණතොනුස්සරං මුනිං,
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු, බුද්ධානුස්සතිමාදිතො.

සවාසනෙ කිලෙසෙ සො, එකො සබ්බෙ නිඝාතිය,
අහු සුසුද්ධසන්තානො, පූජානඤ්ච සදාරහො.

සබ්බකාලගතෙ ධම්මෙ, සබ්බෙ සම්මා සයං මුනි,
සබ්බාකාරෙන බුජ්ඣිත්වා, එකො සබ්බඤ්ඤුතං ගතො.

විපස්සනාදිවිජ්ජාහි, සීලාදිචරණෙහි ච,
සුසමිද්ධෙහි සම්පන්නො, ගගනාභෙහි නායකො.

සම්මා ගතො සුභං ඨානං,අමොඝවචනො ච සො.
තිවිධස්සාපි ලොකස්ස, ඤාතා නිරවසෙසතො.

අනෙකෙහි ගුණොඝෙහි, සබ්බසත්තුත්තමො අහු,
අනෙකෙහි උපායෙහි, නරදම්මෙ දමෙසි ච.

එකො සබ්බස්ස ලොකස්ස, සබ්බසත්තානුසාසකො,
භාග්‍යඉස්සරියාදීනං, ගුණානං පරමො නිධි.

පඤ්ඤාස්ස සබ්බධම්මෙසු, කරුණා සබ්බජන්තුසු,
අත්තත්ථානං පරත්ථානං, සාධිකා ගුණජෙට්ඨිකා,

දයාය පාරමී චිත්වා, පඤ්ඤාය'ත්තානමුද්ධරි,
උද්ධරී සබ්බධම්මෙ ච, දයාය'ඤ්ඤෙ ච උද්ධරී.

දිස්සමානො'පි තාවස්ස, රූපකායො අචින්තියො,
අසාධාරණඤාණඩ්ඪෙ ධම්මකායෙ කථා'ව කා'ති

## ii. මෙත්තානුස්සති

අත්තූපමාය සබ්බෙසං, සත්තානං සුඛකාමතං,
පස්සිත්වා කමතො මෙත්තං, සබ්බසත්තෙසු භාවයෙ.

සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො, අහං නිච්චං අහං විය,
හිතා ච මෙ සුඛී හොන්තු, මජ්ඣත්තා'ථ ච වෙරිනො.

ඉමම්හි ගාමක්ඛෙත්තම්හි, සත්තා හොන්තු සුඛී සදා,
තතො පරඤ්ච රජ්ජෙසු, චක්කවාළෙසු ජන්තුනො

සමන්තා චක්කවාළෙසු, සත්තා'නන්තෙසු පාණිනො,
සුඛිනො පුග්ගලා භූතා, අත්තභාවගතා සියුං.

තථා ඉත්ථී පුමා චෙව, අරියා අනරියා'පි ච,
දෙවා නරා අපායට්ඨා, තථා දසදිසාසු චා'ති.

## iii. අසුභානුස්සති

අවිඤ්ඤාණ'සුභනිභං, සවිඤ්ඤාණ'සුභං ඉමං,
කායං අසුභතො පස්සං, අසුභං භාවයෙ යති.

වණ්ණසණ්ඨානගන්ධෙහි, ආසයො'කාසතො තථා,
පටික්කූලානි කායෙ මෙ, කුණපානි ද්විසොළස.

පතිතම්හා'පි කුණපා, ජෙගුච්ඡං කායනිස්සිතං,
ආධාරො හි සුචි තස්ස, කායෙ තු කුණපෙ ඨිතං.

මීළ්හෙ කිමී'ව කායො'යං, අසුචිම්හි සමුට්ඨිතො,
අන්තො අසුචි සම්පුණ්ණො, පුණ්ණවච්චකුටී විය.

අසුචි සන්දතෙ නිච්චං, යථා මෙදකථාලිකා
නානාකිමිකුලාවාසො, පක්කචන්දනිකා විය.

ගණ්ඩභූතො රොගභූතො, වණභූතො සමුස්සයො,
අතෙකිච්ඡො'තිජෙගුච්ඡො, පභින්නකුණපූපමො'ති.

## iv. මරණානුස්සති

පවාතදීපතුල්‍යාය, සායුසන්තතියාක්ඛයං,
පරූපමාය සම්පස්සං, භාවයෙ මරණස්සති.

මහාසම්පත්ති සම්පත්තා, යථා සත්තා මතා ඉධ,
තථා අහං මරිස්සාමි, මරණං මම හෙස්සති

උප්පත්තියා සහෙවෙදං මරණං ආගතං සදා,
මරණත්ථාය ඔකාසං, වධකො විය එසති.

ඊපකං අනිච්චතාපනං යාතනං ගම්භීරදුක්ඛං,
ජීවිතං උදයා අත්ථං සූරියො විය ධාවති.

විජ්ජුබුබ්බුළඋස්සාව ජලරාජිපරික්ඛයං,
ඝාතකො'ච රිපූ තස්ස, සබ්බත්ථා'පි අවාරියො.

සුයසත්ථාමපුඤ්ඤිද්ධිබුද්ධිවුද්ධි ජිනද්ධයං,
ඝාතෙසි මරණං ඛිප්පං, කා තු මාදිසකෙ කථා.

පච්චයානඤ්ච වෙකල්ලා, බාහිරජ්ඣත්තුපද්දවා,
මරාමො'රං නිමෙසා'පි, මරමානො අනුක්ඛණන්ති.

## 17. සංවෙගවත්ථු

භාවෙත්වා චතුරාරක්ඛා, ආවජ්ජෙය්‍ය අනන්තරං,
මහාසංවෙගවත්ථූනි, අට්ඨ අට්ඨිතවීරියො.

ජාති ජරා ව්‍යාධි චුති අපායා
අතීත අප්පත්තකවට්ටදුක්ඛං,
ඉදානි ආහාරගවෙට්ඨිදුක්ඛං
සංවෙගවත්ථූනි ඉමානි අට්ඨ.

පාතො'ච සායම්'පි චෙව ඉමං විධිං යො
ආසෙවතෙ සතතමත්තහිතාභිලාසී,
පප්පොති සො'තිවිපුලං හතපාරිපන්ථො,
සෙට්ඨං සුඛං මුනිවිසිට්ඨමතං සුඛෙන

## 18. මෙත් වැඩීමේ ගාථා

පුඤ්ඤෙනානෙන මෙ යාව ජීවං සබ්බත්‍ථ සබ්බදා,
සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො, අබ්‍යාපජ්ජො භවෙය්‍ය'හං.

පියානං හිතා ච වෙරී ච, මජ්ඣත්‍තා සබ්බපාණිනො,
සුඛී අවෙරා නිද්දුක්ඛා, අබ්‍යාපජ්ජා ච හොන්තු තෙ.

තථා අස්මිං සරාරාමෙ, ගාමපබ්බතපාදකෙ,
රජ්ජෙ'පිමස්ස දීපස්ස, ගාමඛෙත්තවනාදිසු.

චක්කවාළසීමස්සාපි, මහාදීපචතුස්වපි,
අධිසහස්සබුද්ධදීපෙසු, තෙසු ගාමාදිකෙසු'පි.

තථා සමන්තානන්තෙසු, චක්කවාළෙසු තෙසු'පි
හෙට්ඨා අවීචිතො යාව, භවග්ගා දසදිසාසු'පි

ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා, සුද්ද චණ්ඩාලපුක්කුසා,
මනුස්සා අමනුස්සා ච, සුපණ්ණා ච අසෙසකා,

සබ්බෙ අපා ද්විපාදච, චතුප්පාද බහුප්පදා,
තෙසු භූතෙසු සබ්බෙසු, ථලා සබ්බා'පි ඉත්ථියො.

සබ්බෙ ජෙට්ඨා කනිට්ඨා ච සබ්බෙ දීඝා ච රස්සකා,
සබ්බෙ සුඛුම ථූලා ච, හීන මජ්ඣිම උත්තමා.

දූරට්ඨාපි අදූරට්ඨා. සන්නිකට්ඨා ච කෙවලා,
යෙ පඤ්චගතිකා සත්තා, සබ්බෙ තෙ චතුයොනිකා.

යෙ සබ්බෙ පාණිනො ජීවා, භූතා සත්තා ච පුග්ගලා
සුඛී අවෙරා නිද්දුක්ඛා. අබ්‍යාපජ්ජා ච හොන්තු තෙ

නාගා ච සබ්බෙ පාතාලෙ, අසුරා චාසුරෙ පුරෙ,
නරකෙ යමරාජානො, නෙරයිකා විසාතිනො.

තිරච්ඡානගතා යක්ඛා, පෙතා පෙතගණෙසු ච,
අසුරකායා ච සත්තා ච, සබ්බේ භූමිස්සිතා'පි ච

සුඛිතා හොන්තු නිද්දුක්ඛා, අවේරා ච අනාමයා,
දීඝායුකා අසොකුම්මෙදං, පියා පප්පොන්තු නිබ්බුතිං

විහාරෙසු ච යක්ඛෙසු, චෙතියෙ පටිමාඝරේ,
බොධිරුක්ඛෙසු සබ්බෙසු, සෙසරුක්ඛ වනෙසු ච

පබ්බතෙසු ච සබ්බෙසු, කන්දරෙ නිජ්ඣරෙ තථා,
නදීගඞ්ගාතටාකෙසු, වාපී පොක්ඛරණීසු ච

ජලාසයෙසු සබ්බෙසු, සමුද්දෙසු ච දෙවතා,
යක්ඛා'පි දෙවතා නාගා, යක්ඛ සත්තා ජලාසයා.

සුඛිතා හොන්තු නිද්දුක්ඛා, අවේරා ච අනාමයා,
දීඝායුකා අසොකුම්මෙදං, පියා පප්පොන්තු නිබ්බුතිං.

ථලාසයා ච සබ්බේ'පි, සබ්බේ සත්තා වනාසයා,
රුක්ඛෙසු දෙවතා සබ්බා විමානවාසදෙවතා.

සුඛිතා හොන්තු නිද්දුක්ඛා, අවේරා ච අනාමයා,
දීඝායුකා අසොකුම්මෙදං, පියා පප්පොන්තු නිබ්බුතිං.

භුම්මට්ඨා දෙවතා සබ්බා, ආකාසට්ඨා ච දෙවතා,
චාතුම්මහාරාජිකා ච, තාවතිංසා ච දෙවතා.

යාමා ච තුසිතා දෙවා, නිම්මාණරතිනො'පි ච,
පරෙහි නිම්මිතා යක්ඛා, දෙවා ච වසවත්තිනො.

සබ්බේ බ්‍රහ්මපාරිසජ්ජා, තථා බ්‍රහ්මපුරෝහිතා,
මහාබ්‍රහ්මා පරිත්තාභා, අප්පමාණාභ නාමකා.

ආභස්සරා ච බ්‍රහ්මානො, පරිත්තසුභ නාමකා,
අප්පමාණසුභා චෙව, සුභකිණ්ණක නාමකා,

වෙහප්ඵලා'සඤ්ඤසත්තා, අවිහාතප්පකා'පි ච,
සුදස්සා ච සුදස්සී ච, අකනිට්ඨා ච රූපිනො,

ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතනානි ච,
ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤා ච,

සබ්බෙ'පි තෙ බහූ සත්තා, පාණභූතා ච පුග්ගලා,
සුඛිතා හොන්තු නිද්දුක්ඛා, අවෙරා ච අනාමයා,

යෙහි යා සුඛසම්පත්ති, අලද්ධා තං ලභන්තු තෙ,
ථිරා ච හොන්තු ලද්ධාය, සුඛසම්පත්තියා සදා.

විජ්ජාසම්පත්තිභොගෙහි, පවඩ්ඪන්තු යසස්සිනො,
පරිවාරබලප්පත්තා, භයොපද්දවවජ්ජිතා

සබලා සුඛසම්භාරා, අඤ්ඤමඤ්ඤං හිතෙසිනො,
මොදන්තු සුඛිතා සබ්බෙ, මා කඤ්චිපාපමාගමා.

සද්ධා පාමොජ්ජබහුලා, දනසීලබහුස්සුතා,
ගුණඤ්ඤූසීතසන්තානං ආයුං පාලෙන්තුනාමයා.

සම්මාදිට්ඨිං පුරොධාය, සද්ධම්ම පටිපත්තියා,
ආරාධෙන්තු හිතොපායමට්ඨන්නදුක්ඛබාධනං.

ඉති නානප්පකාරෙන, සත්තෙසු හිතමානසං,
මාතා'ව පියපුත්තම්හි, පවඩ්ඪෙයං නිරන්තරං.

භවග්ගුපාදාය අවීචිහෙට්ඨතො
එත්ථන්තරෙ සත්තකායූපපන්නා,
රූපී අරූපී ච අසඤ්ඤිසඤ්ඤිනො
දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං

ඉමං හි මෙත්තං පරිචාරං යො
භාවෙති පාතො ච දිවා ච රත්තිං,
සුඛං සුපෙච්ච ච සුඛං පබුජ්ඣති
සුපෙන්තු පාපං සුපිනං න පස්සති

පියො ච යො හොති නරාමරානං
රක්ඛන්ති තං දෙවගණා'පි නිච්චං
පරප්පයුත්තා ච විසග්ගිසත්ථා
න තං හි බාධෙන්ති මලං සදා'පි

චිත්තං සමාධිං තුවටලංපි ගච්ඡති
වණ්ණො මුඛො වයස ච විපසීදති,
අමුළ්හකො යෙව කරොති කාලං
ආයුක්ඛයෙ බ්‍රහ්මනිවාසගාමී.

අපිමං විහාරඝරපබ්බතරුක්ඛගාමෙ
සබ්බෙසු දීපනගරෙසු'පි චක්කවාළෙ,
දෙවාසුරා ගරුළරක්ඛස නාග යක්ඛා
රක්ඛන්තු මං සකනුභාවබලෙන නිච්චං.

## 19. රන්දෙණේ ගාථා

නමො තෙ කරුණා කාර - නමො තෙ මුනිසාගර
නමො තෙ අමිතාකාර - නමො තෙ අමිතණ්ණව

රංසිමාල නමො තුය්හං - නරම්බුරුහමණ්ඩලං
ජලමාල නමො තුය්හං - ගච්ඡාරණ්ණුපවාතලෙ

ඉද්ධානන්ත ගුණාධාර - සද්ධම්ම රතනාකර
පාදෙ වන්දාමි තෙ නාථ - යද්ධාය සබ බුද්ධිනා

අලිනගා විජ්ජු වරං පභස්සරං - විපුත්තපත්තණෙ දොනිද්ධයං පදා වරං
චෙරස්ස සීසෙ ගතෙ පතිට්ඨිතං - අනුත්තරො ගෙයා සතම්හි වණ්ණිතා

නාරේසු මිගානස්ස ගුණේහි බුද්ධං - අනුච්චිතො ගම්භ ගතාය පාදං
උට්ඨෙහි යො කස්සප ථෙර පාදං - මහානාගෙ පඤ්ච සතෙහි භික්ඛූ

ඛිත්තක අග්ගිං ජලමානනාය - සබ්බම්පි වෙ චන්දනදාරුකායෙ
සරීරතීයෙ දුගතස්ස ධාතුයො - මුත්තං සුවණ්ණං සුමනංච දිස්සති

සන්ධසම්බන්ධවම්මණ්ණු - මහාපාකාරසණ්ඨිතො,
සණ්ණංමාගිතනාරාකං - ධම්මසංවෙගසඤ්ඤිතො

සත්සිරිකානරො නාථො - කෙතුමාලාය'ලඞ්කතො,
දක්ඛිණාවත්තකෙසො'සි - නීලාමල සිරොරුහො.

උණ්හීස සීසො රුචිරො - පරිපුණ්ණසිරො වරො,
අනොළොකිය මුද්ධාසි - ඝනඡත්තරමුද්ධනො.

උණ්ණා සරුචිරොදර - ලලාටනට සොභිනො,
මුදුතූල නිභොදත - උණ්ණාමණ්ඩල මණ්ඩිතො.

ඉන්දචාපනිභො නීල - භූ ආචාරා සුසණ්ඨිතො;
සණ්ඨිතාමිසු තන්තාය - තුණ්ඩගනාසො විරොචති

ලොචනද්වයමාභාති - පසාදවණ්ණසමුජ්ජලං,
දෙහදෙවවිමානම්හි - මණිජාලපමුත්තාමං.

රංසිමාල නාමො තු යස්සං - බුද්ධසෙතාදිපඤ්ජරං,
එවං තං බුද්ධ ජානාථ - බුද්ධං දස විලොචනං.

## 20. නරසීහ ගාථා

1. චක්කවරඞ්කිත රත්තසුපාදො
ලක්ඛණමණ්ඩිත ආයතපණ්හි,
චාමර ඡත්ත විභූසිතපාදො
එස හි තුය්හ පිතා නරසීහො.

2. සක්‍යකුමාරවරො සුඛුමාලො
ලක්ඛණචිත්තිත පුණ්ණසරීරො,
ලොකහිතාය ගතො නරවීරො
එස හි තුය්හ පිතා නරසීහො.

3. පුණ්ණ සසඞ්ක නිභමුඛ වණ්ණො
දෙවනරාන පියො නරනාගො,
මත්තගජින්දවිලාසිතගාමී
එස හි තුය්හ පිතා නරසීහො.

4. ඛත්තියසම්භවඅග්ගකුලීනො
දෙවමනුස්ස නමස්සිත පාදො,
සීලසමාධිපතිට්ඨිත චිත්තො
එස හි තුය්හ පිතා නරසීහො.

5. ආයතයුත්තසුසණ්ඨිතනාසො
ගොපඛුමො අභිනීලසුනෙත්තො,
ඉන්දධනූ අභිනීලභමූකො
එස හි තුය්හ පිතා නරසීහො.

6. වට්ටසුමට්ටසුසණ්ඨිතගීවො
සීහ හනූ මිගරාජසරීරො,
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

7. සිනිද්ධ සුගම්භීර මඤ්ජුසුඝොසො
හිංගුල බන්ධු සුරත්ත සුජිව්හො,
වීසති වීසති සෙතසුදන්තො
එස හි තුය්හ පිතා නරසීහො.

8. අඤ්ජන වණ්ණ සුනීල සුකෙසො
කඤ්චන පට්ටවිසුද්ධ ලලාටො,
ඔසධි පණ්ඩර සුද්ධසුවණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

9. ගච්ඡති නීලපථෙ විය චන්දො,
තාරගණා පරිවෙඨිත රූපො,
සාවකමජ්ඣගතො සමණින්දො
එස හි තුය්හ පිතා නරසීහො.

## දුටුගැමුණු රජතුමා යුද්දයට යන විට රත්පතක ලියා මවුත්තෙහි තබාගෙන ගිය මහානුභාවසම්පන්න ගාථා තුන

බුද්ධො තිලොකසරණො, බුද්ධො අරියො තමොනුදො
එවං නං සරණං සෙමි, බුද්ධො මෙ සරණං චිරං
ගච්ඡාමි සරණං බුද්ධං, නත්ථි මෙතං භයං සදා.

ධම්මො තිලොකසරණො, ධම්මො සුවියො නමොනුදෙ
එවං තං සරණං ගමිමං, ධම්මො මෙ සරණං වරං
ගච්ඡාමි සරණං ධම්මං, නත්ථි මෙ යාං භයං සදා.

සඞ්ඝො තිලොකසරණො, සඞ්ඝො, සුවියො නමොනුදෙ
එවං තං සරණං ගමිමං, සඞ්ඝො මෙ සරණං වරං
ගච්ඡාමි සරණං සඞ්ඝං, නත්ථි මෙ යාං භයං සදා

දුටුගැමුණු රජතුමා නිතර භාවිත කෙළේය යි ප්‍රසිද්ධ මහානුභාවසම්පන්න ජයමඞ්ගල ගාථාව. එය අපෙක්ෂාවෙන් යුත් කටයුතු පටන් ගන්නා විට තෙවරක් කියනු.

ජයො හිබුද්ධස්ස සුබොධිමූලෙ
අහොසි මාරස්ස පරාජයො හි
උග්ඝොසයුං දෙවගණා පසන්නා
එතෙන සච්චෙන ජයස්සු මය්හං

## 21 විහාර අස්න

............ මය ...... වස් පිරි ........... වස් නම් සිටියලත් ............ මේ දවසැ ............ බද ......... දේවාලයට ........ දිවා භාගයෙහි සූ ........ විහාරාභ්‍යන්තරයෙහි ...... කොතෙර් ධාතුවරුන් වහන්සේ වඩා මහා සංඝයා වහන්සේ නි රැස්වැ පෙරයම් රාත්‍රියෙහි බණ අමහර කරන තැනට ~

සගම්, පස්ගම්, අරස්සනා, මාදන්වල, විල්වල, කඩුගෙදර, මොරපාය, දිඹුල, පුසුල්පිටිය, නියම්ගම්පායපර්වතය ~ වල්පාසගොඩ, සැලව, අරම, මැදිලිය, දිප්පිටිය, ඔම්පතේ, හාරියගම, ගල්දැල්ල, අලුත් නුවර, පරණ නුවර, මාතලේ, මාකඩවර, හිඳුල, කප්පාගොඩ ~ පදීඳර, උතුරාවල, අම්බුළුගල, දන්ගිරිගල, වාගිරිගල, අලනාගල, අලව්තුර, වතුර, මාතුරාව ~ කටුස්සගම, බීසෝවෙල, දදියම, අරන්දෙර, දෙරවක, මවකපටිට, තොටගෙදර, මිදුරැපිටිය, අතනගල්ල, ලාර්ගෙවල, ගොඩිගෙදර, දෙරණාගොඩ ~ යටවින්න, රාගම, මීගමුව, දස්ගමුව, දෂගෙදණිය, බෙලිගල, නව්ගමුව, බමුණුගම, වට්ටාරම ~ වතුදෙණිය, පූනාරිය, ගල්කඩතම, කොල්පුර, මකදපාල, උඩපොල, අල්ගම, නාවකොලගමුව, ඇත්කඳ විහාරය ~ තුරැණෑගල,

කුරුවෙණියාගල, ආදගල, ඉබ්බාගල, යක්දෙස්සාගල, තාප්ගම, යංවැල්ල, කඩිකාව, මුලගණේ, කඩැල්ලෑලෙන, නියඳවනේ, නාගල විහාරය ~ රැස්වේරුව, කලංගමුව, පෙරියකඩුව, දේවගිරි විහාරය ~ පංගමු විහාරය, උතුරුපඩු විහාරය, බුජස්ලෙන, යාන්ලෙන, ජයකාඩුලෙන, සැගැලෙන, කුඹීරුලෙන, රිදීලෙන, රම්බඩගල්ල, දෙල්විට, විල්ගම, අස්ගිරිය, රුයිගම, ඇම්බැක්ක, මිලිලවාතය, බම්බා විහාරය ~ රන්ගිරි දඹුල්ල, සීගිරිය, කලාවැව, බලල්ලෑව, අනුරාධපුරයෙහි ශ්‍රී මහාබෝධීන් වහන්සේය. ලෝවාමහාප්‍රාසාද ස්ථානය, මිරිසවැටි විහාරය, අභයගිරි විහාරය දෙනානකඩ, තගිරිතකය, රත්නමාලී චෛත්‍යය, ථූපාරාම චෛත්‍යය, මිහින්තලේ, අටසැටලෙන, නිකුපත්පාණ, සුරුළුමහමුනියාව ~ මුන්නේශ්වරම, ඇත්තල, මන්නම, මන්නාරම, මාන්තොට්ටම, පොන්පරප්පුව, මල්විල, දෙමළපට්ටනමෙහි, නාගකෝවිල, කදුරුගොඩ විහාරය, තෙලිපොල, මල්ලාගම, මිනිවංගමු විහාරය, තන්නි දිවයින, අග්නි දිවයින, නාග දිවයින, පුවඟුදිවයින, කාර දිවයින, මොල්ලියාවෙල, තිරිකුණාමලය, විල්ගම් වෙහෙර, නිස්සමහා වෙහෙර, ඉලන්දගොඩ, කදුරුකොට්ටයෙහි අතුඹදය, ලංකාතිලකය, වටදාගෙය, විජයොත්පාය, අභයගිරි විහාරය, ජේතවන විහාරය, කපිල විහාරය, ඉසිපතනාරාමය, කුසිනාරාරාමය, පූර්වාරාමය, දක්ෂිණාරාමය, පශ්චිමාරාමය, උත්තරාරාමය, සත්මිණිපෑය, සිව්මිණිපෑය, දෙමළමහ සෑය, පොළොන්නරු විහාරය ~ සූළුනන්නරු විහාරය, සිතුල්පව් විහාරය, ධනඤ්ජය විහාරය, කුකුළුවා විහාරය, දිඹුලාගල විහාරය ~ නාබාවෙහෙර, මියුගුණ වෙහෙර, සොරොන්නාතොට, බදුල වෙහෙර, යුදගනාපිටිය, රුහුණුබද කතරගම, උග්ගල් අළුත් නුවර, නඹගමුව, මුලගිරිය, ඔවාගිරි විහාරය ~ දෙවිනුවර දිව්‍යරාජභවනය, මත් පිළිමගෙය, සිටි පිළිමගෙය, ගල්ගණේ, වැලිගම අග්‍රබෝධි විහාරය, පරගොඩ විහාරය, තොටගමු විහාරය, ගලපාත විහාරය, බෝධිමළු විහාරය, වනවාසවිහාරය, බෙම්වෙහෙර, බෙම්තොට, කප්තොට, තොරණ, විසිදගම, කොතලාවල, රඹුක්කන, පාතදුරේ දේවාලය ~ බෙල්ලන්විල, පැපිලියාන, නාවින්න, විජයාරාමය, සුභද්‍රාරාමය, ජයවර්ධන කෝට්ටයෙහි පිළිමගෙය, ෂණ්මුඛ දේවාලය, කිත්සිරිමෙවන් කැලණිය, රජමහකැලණිය, විභීෂණ දේවාලය ~ වැලිවිට, බොල්ලෑගල, සේවාගම, දියාපති ඝාගය, තඹදෙවොල, බෝමිරිය, සංවැල්ල, කොහොල්බවුවාව, අතුරුගිරි විහාරය ~ දෙණගමුව, දෙල්ගමුව, බඩුගෙදර, දෙණවක, සපරගමුව, ගිලීමලය, සමන්තකූට පර්වතය, දිවාගුහාව, බල්ලාකෙල, සීදගල, කළුගමුව, ගංගාතිලක විහාරය ~ කුඹල්ඔළුව, අළුදෙණිය, කොටකෝදෙණිය ඉළුපැත්දෙණිය, යෝත්දෙණිය, තිග්ගම්මන, අරන්තන, සන්තානාගොඩ වෙයිහිරිය; ඇම්බැක්ක, ලංකාතිලකය, ගඩලාදෙණිය, දලිවෙල, ගනුල්දෙණිය, උරුලෑවත්ත, කොටබෝගොඩ, රත්මුංගොඩ, දෙල්දෙණිය, මැණික්දිවෙල, මොණරාගොඩ, කොළුගල, වල්ගම්පාය, දත්තොට විකුර, සියඹලාගොඩ ~ දැවම්වෙල, දියකෙළිනාවෙල, සූරියගොඩ, නොබ්බෑකඩුව,

ගන්නොරුව, කුරුගම්මන, මාලගම්මන, අත්තරගම, මැදවෙල, ගල්ලෑල්ල, දෙලපිල්ල, අලව්තුගොඩ, ගොනගොන, නිකවටුපාව, ඇඹිල්ල විහාරය, ආලෝක විහාරය ~ කුරුවිටකොටගම්බර, කඩුවෙල, දුනුවිල, ඇඹිල, නිත්තවෙල, සිරිමල්වත්ත, අඹුළුගම, ගංගාරාම විහාරය ~ යොංකටිගල පුලූන් විහාරය, පරණ විහාරය, නාගවිමානය, උපෝසථාරාමය, ශ්‍රී දංෂ්ට්‍රාධාතු මන්දිරය ඇතුළු සියලු විහාර දේවාලය වල අධිගෘහිත දෙවිමහරජාණන් තම්නුන් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට සම්භක්ත දෙවියනුත් උපවෙනෙහි දෙවියනුත් නොහැර කැඳවා ගෙන මංගල සූත්‍රාදි බණ අසනු පිණිස ඊම ~ සම්භාමහාසංඝයා වහන්සේට අභිමතදෝ ~ අභිමත දේ ~ අභිමත දේ ~ අභිමතයි ~ අභිමතයි ~ අභිමතයි ~ සම්භාමහාසංඝයා වහන්සේ යහපත් විදල මෙහෙවර සංඝාණත්තිය නුගුළුවා භය යුතු ~

විහාරඥප්ත නිමි.

## 22 ලිත කීම.

ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදහස් හාරසිය අනූහයක් වූ ඇසළ මස පුර ඉරිද මූල නැකත පණස් හතරයි, විනාඩි හතලිස් දෙකයි පසලොස්වක තිථි අටයි, විනාඩි තිස් පහයි.

(මෙහි යොද ඇත්තේ පැරණි වර්ෂයකි. එහි අවශ්‍ය තැන්වලට අවශ්‍ය දිනයට ගැලපෙන සේ වර්ෂ, මාස, පක්ෂ, දින, නැකත, තිථිය, යොද පසක් කරගත යුතුයි.)

## 23. දේවාල තල්පත

ශ්‍රී ශුද්ධ බුද්ධවර්ෂයෙන් දෙදහස්.......... පැමිණි ........මස.......නම් තිථිය ලත්....... මෙ දවස ........දිශාභාගයෙහි වූ...... යෙහි විසිතුරු කොට කරවන ලද මණ්ඩපයට බොහෝ යතිවරුන් වහන්සේ වඩා මහාසංඝයා වහන්සේත් රැස් වැ සාරයාම රාත්‍රියෙහි බණ සම්භර කරන තැනට

මේ දෙවස්ථානයෙහි අධිගෘහිත දෙවි මහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට.

ත්‍රිකූට දෙවියනුත් උපවෙනෙහි දෙවියනුත් නොහැර කැඳවා ගෙනැ මයිලගුසුත්‍රාදී බණ අසනු පිණිස ඊම.
සම්භම්භනාසංඝයා වහන්සේ සහට විදල මහෙවර සංඝාණිනිය නුගුළුවා ඉය පුතු.

(දේවාල කල්පන ලියනා විට තිත් ඇති තැන් දුදුරු සේ යොද පළමුවන පැත්තේ 'ට' යන තැනට හිස්පෙළ නිමවිනා. දෙනවන පැත්තෙ 'ම' 'නා' දෙකට දෙපෙළ හිමවනා.)

## 24. දෙරකඩ අස්න

ශෝභශීලපාදි අමිතගුණගණෝගයෙන් උපලක්ෂිත වූ පින්වත් ස්වාමීන් වහන්ස ~ විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩපද්වාරයෙහි මිනිස්සු ඇත ~ අනෙකානේකාලංකාරාභූෂිතපුභාපාලංකෘත ධර්මශ්‍රාවණයනාවට ගියා වූ දේව දූතයා වන මම මෙහි අවුත් සිටිනෙමි ~
ස්වස්ති ශ්‍රී කර මනෝරම්‍ය කනකගිරි ශෘංග තුංගාලංකාර ලංකාපුර ප්‍රවරාධිශ්වර ~ මෛවවස්වත මනුවංශ ශ්‍රී මහාසම්මත මහා රාජාධිරාජෝත්තම ~ වරවංශාභිජාතලක්ෂණ සම්පූර්ණ මහීරක්ෂණ දක්ෂ ස්වර්ණවර සිංහාසනාරූඪ ~ අංග වංග කලිංග තෙලිංග බංගාල පරංගි ඕලන්ද කර්ණාට ගුර්ජරාදි පරමණ්ඩලේශ්වර ~ ගජ තුරග කනක මණි භූෂණ දිව්‍යාම්බර ස්වර්ණසිවිකාදි නානාප්‍රකාරභාගධෙයාතීත රාජනිකේතනන්දිතොත්තුංග මකර තෝරණ මහාද්වාර රාජිත නිත්‍යසතාධර්මප්‍රවර්ත්න ~ සුරරාජ සම්භෝග නරරාජ ගුණෝපේත ගිරිරාජ ධෛර්ය විද්‍යුරාජ ගජභාර සෘතනිත ~ මෘගරාජ නිරාජ කවිතෝජ නරවීර මහරාජ මනුරාජ කුලරාජ යසබිජ ~ භූවිභාප නෘපදීප පරතාප ගගනරූප ශත්‍රුකෝප රණවෙශ්‍ර ජනනාප සකලාප සිරිවාහ උපමාන සයිනාන ~ සිරිසාර ගුණසාර ඝනසාර නරලෝකපුරන්දර වරරාජ භයංකර වීරරාජ ජයංකර සිරිධාරපුරන්දර භූලෝක පුරන්දර ~ දිනේශ්වර කුලේශ්වර නාගේශ්වර හයේශ්වර ජනේශ්වර රාජ පරමේශ්වර වූ ~ සකලලෝක දශදිගාභ්‍යන්තරයෙහි පැතලා වූ ඝනබහල රිපුතිමිර නිකර විධ්වංසනය කිරීමෙන් ~ අරුණ තරුණ කිරණ ප්‍රභාමණ්ඩිත ප්‍රාදුර්භූත සූර්යදිව්‍යරාජයා මෙන් ශ්‍රී ලංකාද්වීපයෙහි නානාවිධිනවූ අන්ධකාර සන්දෝ

හඳුරිඳුය කෙරෙමින් ලෝකශාසනාභිවෘද්ධිවර්ධනය කිරීම සඳහා ~ ඉන්ද්‍රෝපේන්ද්‍ර චන්ද්‍රශේඛර ප්‍රජාපත්‍යාදී දිව්‍යරාජ සමූහයා විසින් ~ සකල පුණ්‍යසම්භාරයෙන් නිර්මිත කොට සිතුමිණි රුවනක් මෙන් පහළ කරන ලද්දා වූ ~ අපගේ ද්වීපචක්‍රවර්ති ස්වාමීන් වහන්සේගේ අඛිලලෝකපූජිතප්‍රශස්ත ශශිබිම්බප්‍රතිබද්ධ රශ්මිමාලා ස්වර්ණපාණ්ඩුලක්ෂණ පාදාවක්‍රය පැවැත්තා වූ ~ මිණි චරවිධූලලිත ලලාට ස්ථලාභ්‍යන්තර කොට ඇති සුප්‍රතිෂ්ඨිත ස්වර්ණයුගලයක් බඳු වූ ~ රුහුණු මායා පිහිටි රට්ය යන ත්‍රිසිංහලාභ්‍යන්තරයෙන් ........... රට්ට අන්තර්ගත වූ ~ ........... ග්‍රාමාභ්‍යන්තරවාසී වූ මෙම පින්කමට ඇතුළත් දායක මූලික කාරකාදී සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ජනයන්ට ~ අනිෂ්ට දර්ශන දිග්දාහ උල්කා රුධිරාම්බර ධූමකේතු චක්‍රාකාරාච්ඡ ග්‍රහසට්ටන භූමිකම්පා ~ ගන්ධර්වශීන පරිවේශ රක්ෂහානුප්‍රාකාර ගෝපුරද්වාර පතන වෘක්ෂශාඛාපිච්ඡිලපට්ටභේද දිව්‍යාතුරග සූති නිශාකාකරව ~ පූර්වගමණ්ඩූක ශ්වේත මණ්ඩූක දර්ශන මෘග නර ප්‍රසූති ශ්වාන ශෘගාල මහෝකාර හෝකාරාදී රව ~ අකාල පුෂ්පඵල සාපෝත උලූක නාග මෙිස පක්ෂි ඇටිකුච් කොබෝ දෙබර ගෘහප්‍රවේශ ~ තෙල් වේ නුඹස් ගෙරී කුරුපහර, කූඤ්ඤුස්ථූල මී බන්ධන ජදනාගමන ශුනක බිලාල කලහ කාකයමෛථුන දර්ශන නිශාකන්දවාප ~ ශකුන ගෝචර ග්‍රහණ පක්ෂ්වංග ශෙව්නෘති පාංශු වර්ෂණ භූම්‍යාරම්භ වනාරම්භ ගෘහාරම්භ ප්‍රාකාරබන්ධනාදීයෙන් සංදර්ශන වූ ද ~ නොහොත් ~ මෙම පින්කම කරවීමට ඇතුළත් දායක මූලික කාරකාදී සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ජනයන්ගේ ~ භාග්‍යහානත්‍යන්තරෝත්පන්න දුස්වප්න දුර්නිමිත්ත කලිකලහ වෛරකලාප විග්‍රහවිවාදයින් වන්නා වූ ~ අෂ්ටාතිරේක නවුති සංඛ්‍යාත රෝගයෙන් හා නවාතිරේක නවුතිසංඛ්‍යාත ව්‍යාධියෙන් හා ~ සංවත්සර යෘතුපරිවර්තනෝපක්‍රම ජන්මනක්ෂත්‍රාධිපති ග්‍රහ දූෂණාදී සකලාන්තරාය සර්වෝපද්‍රව නිවාරණය කොට ~ කීර්ති හාරහාර තුෂාර කන්ලාර ක්ෂීරස්ඵටික ක්ෂීරාර්ණවාකාර ~ අරුණකර කිරණ ස්ඵුරණ තරුණාරුණ ප්‍රවාලාංකුරප්‍රවාලාර්ණවවර්ණ ~ සුරභි සුරතරු හඳ සව් නවනිධීන් සාදෘශ වූ සකලෛශ්වර්යයාභිවෘද්ධිවර්ධනය කරනු පිණිස ~ ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ ය යන සතරවරම් දෙවි මහ රජදරුවන් ඇතුළු වූ සැම දෙවියෝ ම සහසිරිවරින් වැඩිසේක ~

දෙරණට අස්න නිමි.

# 25. අනුශාසනාව

## මෙතැන්හි රැස්වූ දෙවියන්ට පඬුරු පිණිස

සුප්‍රතිපන්න සද්භාවාදී රක්ෂිත ශෝභිත ශීලස්කන්ධ ගුණප්‍රතාපාලංකෘත. ශ්‍රීනිකේත වරචාරු දේහශ්‍රීසාර විරාජිත දූරීකෘතාශේෂ දෝෂාන්ධකාර ප්‍රකීර්ණ නෙක ගුණගණානුභාවෝත්පන්න මහාසංඝයාවහන්සේ ~ ස්වර්ග මර්ත්‍ය පාතාලසංඛ්‍යාත භුවනත්‍රයවාසී සමස්ත සත්වහිතාභිවෘද්ධිය පිණිස ~ බාලජන සංසර්ග විරහිත වැ අඛණ්ඩිතාචාර මණ්ඩිත පණ්ඩිත ජන භජන සේවන පර්‍යුපාසන සම්භාෂණාදී වූ අටතිසක් මංගල කථාවන් කරණ කොටගෙන ~ අනල්ප කල්පෝපචිත කුශලබල සමුද්භව දශබල චතුර්වෛශාරද්‍ය ඥානාදී ගුණ ගණ මණි මයූඛ විසර විස්ඵූරිතාමිත ධර්මකාය සම්පත්තීන් විශුද්ධ වූ, ~ ත්‍රිභුවනෛකතිලක සකලඥෙය සාගරපාරගතානේක ගුණරත්නමන්දිරාශේෂජනවන්දනීය, මකුට මණිමරීචිකාදම්බචුම්බිත වරණ නඛකිරණශ්‍රේණීන් විරාජමාන වූ, සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ විසින් ~ මධුමද්මුදිතලලිත රතිකර මනෝහර කුරවීක නාද නිර්විශේෂාෂ්ටාංග සමුපේත මධුර ස්වරයෙන් දේශනා කරන ලද ~ අඥානජනසංසර්ගාපගමාදී අෂ්ටෝත්තර ත්‍රිංශත් ප්‍රභේද මංගල ලක්ෂණයෙන් උපලක්ෂිත වූ ~ ධර්මාර්ථ දේශනා ප්‍රතිවේධගම්භීර සුරාසුරෝරගමනුජ ශ්‍රවණ ජනමන කර්ණරසායන වූ ~ මේ මංගලසූත්‍රය ගණසජ්ඣායනා කොට වදාල සේක ~ එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

මෙම පින්කම කරවීමට දායක වූ ප්‍රධානාප්‍රධාන සකල සත්පුරුෂ සාධුජනයන් විසින් සත් දවසක් මුළුල්ලෙහි දුර්වාරසපරිවාර ඝෝරමාරාර්යාහංකාර නිර්වාපක අනේක දෙව යක්ෂ රාක්ෂස ගරුඬ ගන්ධර්ව සිද්ධවිද්‍යාධරමෞලිමණිමාලාලංකෘත අංඝ්‍රිපද්මයුග්මයක් ඇති බුද්ධාදී රත්නත්‍රයවිෂයෙහි පවත්වන ලද ~ දීප පූජා ධූප පූජා පුෂ්ප පූජා සුගන්ධපූජා වන්දනමානනාදී සත්කාර කරණයෙන් ජනිත වූ පින් අනුමෝදන් විය යුත්තේය ~

ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානදර්ශනානේක ගුණ භූෂණ භූෂිතාශේෂ විෂධරෝරග ගරුඬ ගණසදෘශ මාර වීර තිමිර නිධන

දිවාකරාකාර චාරුතර ශ්‍රීසාර විරාජිත ශ්‍රීඝන සකල ශාසනෝදයකාරී ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන ප්‍රව්‍රජාන්වයාගත ~ විශුද්ධප්‍රාතිමෝක්ෂ සංවරශීල සංසිද්ධ ප්‍රසිද්ධගුණ ප්‍රශස්ත මහාසංඝයා වහන්සේ විෂයෙහි පවත්වන ලද ආවාස දන ප්‍රත්‍යය දන තාම්බූල දන කර්පූර දන අඤ්ජලිකර්ම සාමීචි කර්මාදීයෙන් ජනිත වූ පින් අනුමෝදන් විය යුත්තේය ~

ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහේශ්වර සුයාම සන්තුෂිතාදී කාමාවචර රූපාවචර දිව්‍යරාජයන් විසින් ද එහි පින් අනුමෝදන් වියයුත්තේය ~

අනේකවිධමණිසිඛරවිනිර්ගත අමෘතකරකිරණනිභ හිමපටල ප්‍රකටිත සිසිර ශීකර වාරිපූරිත නිර්ඣරාකුල ගිරිනිර්ඣර නීරධාරාලංකෘත මේරුයුගන්ධරේෂධර කරවීක සුදර්ශන නේමින්ධර විනතකාශ්වකර්ණ කෛලාස වින්ධ්‍ය ගන්ධමාදන මන්ථාචලමලයාදි පර්වතස්ථායී දිව්‍යසමූහයා විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

අන්තරීක්ෂවිමානයෙහි වාසය කරන රවි- චන්ද්‍ර- කුජ- බුධ- ගුරු- ශුක්‍ර- ශනි- රාහු- කේතු යන නවග්‍රහයන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

අශ්විනාදී සප්තවිංශති නක්ෂත්‍ර තාරකාවන්ට අධිපති වූ දේව වෛද්‍යාදී සප්තවිංශතිදේවතාවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

මේ ශ්‍රී ලංකාද්වීපයෙහි අධිගෘහිත ඛදිරදේහලී විංශෝද්භූත උත්පලවර්ණ සුමන කාර්තිකේය විභීෂණ සංඛ්‍යාත සතර දේවාලයෙහි දෙවිම්හ රජදරුවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

මහීවරවධූදර නාභි මණ්ඩලාකාර ප්‍රශස්ත කජංගල සලලවතී ශ්වේතකර්ණ ථූන උශීරධ්වජාභිධාන පර්යන්ත පරිච්ඡේද නිමිත්ත හත නදී ග්‍රාම නිගම ප්‍රතිමණ්ඩිත තුන්සියයක් යොදුන් දැයම් විතරැති සියලු බුද්ධාදී උතුමන්ගේ ජන්මභූමි වූ මධ්‍යදේශයෙහි පිහිටි පාණ්ඩව ගිජ්ඣකූට ඉසිගිලි වේභාර වෛපුල්‍ය පර්වතාදියෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ඉන්ද්‍ර සෝමාග්නිනෛරුත්‍යවාරුණ්‍යාදි අෂ්ටදික්පාලයන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ඉන්ද්‍ර සෝම වරුණ භාරද්වාජ ප්‍රජාපත්‍යාදි අෂ්ටවිංශති යක්ෂ සේනාධිපතීන් විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ආදිත්‍ය චන්ද්‍ර විශ්වාදි ගණදේවතාවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

පුෂ්පදන්තෝර්වශ්‍ය කුවේර මණිභද්‍රාදි භූතගණයා විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

සියලු බෝධි වෘක්ෂ චෛත්‍ය ප්‍රතිමාගෘහ ග්‍රාමාරාම විහාර නගරාරණ්‍ය තරුවනසරසරිත්සාගරවිමානාදියෙහි අධිගෘහීත දේවතාවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

කර්ණාට, ලලාට, කාශ්මීර, කාම්බෝජ, කම්පිල්ල, හරිපුංජ, නේපාල, යබර, බර්බර, ගුර්ජර, චීන, මහාචීන ~ ගන්ධාර, ජලධාර, මෝධාර, සිරිරට්ය, කුරුරට්ය, මහාරට්ය, වඞ්ගරට්ය, සෝනන්ත, පුරන්තන්ත, පත්තුන්න, කල්‍යාණ, කුරාන, මර්කටාන්ත, ගෝටාන්ත, මහාගෝටාන්ත ~ ගයාතෘංග, වංග, තුංග, තුරංග, කංග, කොංග, කාලිංග, තෛලිංග, ලාඩ, ගෞඩ, ද්‍රවිඩ, මඩිඩි, වඩිග, පාරසී, කොෂසි, උරුමුසි, කාරල, කේරල, නේපාල, මලයාල, බංගාල ~ රෝජ, වරරෝජ, ප්‍රතිකාල්, අරමණ, මල්ලව, තොණ්ඩ, පාණ්ඩිමණ්ඩල, කාවේරි, කායල, සිල්ලමාදි, සර්වදේශාධිගෘහීත දේවතාවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

වට විටප සිතලයාලංකාකාරාන්ත නාගග්‍රෝධාශ්වත්ථ වකුලපාටලාශෝක සලල සාල පල්ලක්ෂී පලාශ තිකුම්භ නිම්බ ජම්බීර උදුම්බර කදම්බාදී තරුවන ගහණයෙහි අධිගෘහීත දේවතාවන් විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ගංගා යමුනා සරස්වතී සින්ධු චන්ද්‍රභාගා භාගීරථී නර්මදා දී වූ ගංගාවන්හි අධිගෘහීත දේවතාවන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ප්‍රබල පවනබල ලලිත නිතාන්ත සන්තත සංසදන වේගවද් ඝණ්ඨිර පිණ්ඩ මණ්ඩිත චණ්ඩිමශ්‍රාහ නණ්ඩාවණ්ඩ නිවසිත ස්ඵුරිත දිංමුඛ විද්‍යුත් ප්‍රාය කල්ලෝලමාලා සමුල්ලසිත ~ වේලාතටනිකට මුක්ති මුක්තා ප්‍රවාල උත්තුංග තරංගාභිරාම චතුස්සාගර සංරක්ෂණයෙහි නියුක්ත, ක්‍රමෝන්නත නිම්බපත්‍රාකාර භ්‍රූයුග්මයෙකින් හා ~ භාව භාවලීලා කටාක්ෂ ප්‍රේමණීය නයනාම්‍යන ප්‍රතිභාග සම්පන්න රූපලාවණ්‍ය විශේෂ සම්පත්තියෙන් යුක්ත වූ මණිමේඛලා නම් දිව්‍යාංගනාව විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

හේමසිංහාසනාසීන දක්ෂිණකර ගෘහීත කනක කලසාභිරාම වූ මහීකාන්තාව විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

සුගන්ධ මකරන්දකීර්ණ ප්‍රඵුල්ල විකසිත. මත්තාලිනිකර නිෂේවිත විචිත්‍ර ශතපත්‍රාසනාරූඪ වූ සරස්වතී දිව්‍යාංගනාව විසින් ද එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

අසුරපුරාධීශ්වර වූ වේපචිත්‍යාදි අසුරේන්ද්‍රයන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

උරගපුරාධීශ්වර වූ මණිකනක කිරීටකූට ප්‍රතිෂ්ඨිත ශංඛපාල මහාකාලාදී නාගේන්ද්‍රයන් විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

ජල ස්ථල වෘක්ෂ පර්වත විශ්‍රැතානේක ප්‍රස්‍රවණ ජලගම්භීර කන්දරාන්තර නිස්තර නිකුඤ්ජ නිර්ඣර ප්‍රපාත ගිරිශිඛර සින්ධුපද්මාකරාදීන් වාසස්ථාන කොට ඇති දේවසමූහයා විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේය ~

මෙසේ යථෝක්ත වූ මේ සියලුම පින් අනුමෝදන් ව අධිකතර සම්පත්තීන් සමෘද්ධ වූ දිව්‍යසමූහයා විසින් ~ මේ පින්කම කරවීමට ඇතුළත් දායකකාරකාදීන්ට අමනෝඥ අසන්තුෂ්ට දුෂ්ටාරිෂ්ට අමනුෂ්‍ය කෙනෙක් ඇත්නම් ~ ඔවුන්ට අවවාදනුශාසනා කොට අවවාදක්ෂම වූ නම් හිතසුඛකරණ ප්‍රවෘත්ත සාධුභාවයෙහි පිහිටුවා කායික මානසික ව්‍යසන සහිත ~ තිථි කරණ හෝරා මුහූර්ත නවග්‍රහාදී පීඩා සංසිඳුවා ආයුරාරෝග්‍යාදි සකලෛශ්වර්‍යාභිවෘද්ධි වර්ධනය කටයුත්තේය ~

එසේත් අවවාදක්ෂම නොවන්නා වූ ස්තබ්ධ විපරීතාධ්‍යාශයෙන් යුක්ත වූ අමනුෂ්‍ය කෙනෙක් වූ නම් චතුර්දිගාධිපති වූ ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ ය යන සකල යක්ෂ රාක්ෂසාධිපති සතර වරම් දෙවි මහ රජ දරුවන් විසින් ~ භික්ෂු භික්ෂුණ්‍යාදී වූ සිවුවනක් පාරිෂද්‍යයන්ගේ ගෝපණ රක්ෂාවරණ අවිහිංසා ඵාසු විහරණය පිණිස මහාකරුණා ඥානයෙන් දේශනා කරන ලද්ද වූ ~ සකල සත්විහිත විධායක ප්‍රබුද්ධබුද්ධි ඇති මෙහෙසුවාදීන කුම්භ නිර්භෙදිතාංකෝගරිහන මාර විර සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් ~ සප්ත රත්න ප්‍රාකාරගෝපුර පරිඛාපරික්ෂිප්ත රක්ෂාවරණයෙන් යුක්ත වූ රාජගෘහ නගරවරාසන්නයෙහි වූ ගිජුඩුවිහගාකාර කූටාලංකෘත හෙයින් ගිජ්ඣකූට නම් වූ ~ පර්වතමස්තකයෙහි තරුණ රවි කිරණ සන්ධ්‍යාවලාහක ප්‍රභාරඤ්ජිත ඉන්ද්‍රචාපවිද්‍යුල්ලතා පරික්ෂිප්ත කනක ගිරිශිඛරයක් සේ අචින්ත්‍යානුපමේය වූ ප්‍රඥා වරබුද්ධාසනාරූඪ ව වැඩහිඳ දේශනා කරන ලද්ද වූ ~ කෝටිශතසහස්‍රපරිවාර වාසී යක්ෂ රාක්ෂසෝරග ගරුඩ ගාන්ධර්ව සිද්ධ භූත ප්‍රේත පිශාචාදීන් විසින් අවිලංඝනීය වූ ආඥා ඇති මේ ආටානාටිය සූත්‍රාන්ත ධර්මදේශනාව ~ මේ වැඩහුන් දෙදෙනා වහන්සේ ඇතුළු වූ මහාසංඝයා වහන්සේ ලවා පිරුවා වන සේක ~

තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ක්ෂාන්තිමෛත්‍රෝපගමපාදීන් සිට බණ අසා ශාසනෝපකාරී වූ රත්නත්‍රය ශරණ පරායණ සකල සත් පුරුෂ සාධුජනයන්ට ~ සංකූපරිවර්තනසෝපක්‍රම දුෂ්ට ප්‍රතිපක්ෂ යක්ෂ රාක්ෂය තරක්ෂ ව්‍යාඝ්‍රාක්ෂෙණාක්ෂ මිහිපර්වතාශිර්ෂිපදපෝපද්‍රව ගෘහ සංක්‍රාන්ති දුස්වප්න දුර්නිමිත්ත කලි කලහ පෛශූන්‍යවිග්‍රහවිවාදාදීන් වන්නා වූ ~ සකලාන්තරාය සර්වෝපද්‍රව නිවාරණය කොට ~ කීර්තිතාරහාර තුෂාර කුන්දාර ක්ෂීරසම්පත්ත ක්ෂීරාර්ණවාකාර ~ අරුණංකර කිරණස්ඵුරණ තරුණාරුණ ප්‍රවාලාංකුර ප්‍රවාලාර්ණව වර්ණ පුරහි පුරතරුශිඛයට නවනිධීන් පාදගත වූ සකලෛශ්වර්යාභිවෘද්ධි වර්ධනය කටයුතු ~

අනුශාසනාව නිමි.

## 26. සිවලී පිරිත

පූරෙත්වා පාරමී සබ්බා, පත්තො සම්බොධිනායකා,
සීවලිගුණයොගෙන, පරිත්තං තං භණාමහෙ.
න ජාලින්'ති ජාලිනාවි, ධා. වි. ලා. ආම ඉ ස්වාහා.
බුද්ධයාමි බුද්ධියනාමි.

නානාසීමේචමෝඛියං, නානාජාලිනි පංජලිං,
සදෙවමනුස්සපූජිතං, සබ්බලාභා භවන්තු මෙ

සීවලි ච මහාථෙරො, යො'රහා පච්චයාදිනං,
පියො දෙවමනුස්සානං, පියො බ්‍රහ්මානමුත්තමො
පියො නාගසුපණ්ණානං, පීණින්ද්‍රියං නමාමි'හං,

පදුමුත්තරො නාම ජිනො, සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි, කප්පෙ උප්පජ්ජි නායකො.

සත්තානං ආධාරභූතො'හං, මහාදුක්ඛපරිපීළිතො,
මාතා මෙ ඡන්දදෙනෙන, ඨපමාසි දුක්ඛිතා.

ඛෙමෙසු දිජස්සාතෙහි, අරහත්තමපාපුණිං,
සදෙවා නාගා මනුස්සා ච, පච්චයානුපනෙන්ති මෙ

පදුමුත්තරනාමඤ්ච, විපස්සිං ච විනායකං,
සම්පූජයිං පමුදිතො, පච්චයෙහි විසෙසතො.

තතො තෙසං විපාකෙන, කම්මානං විපුලුත්තමං,
ලාභං ලභාමි සබ්බත්ථ, වනෙ ගාමෙ ජලෙ ථලෙ,

කද දෙවාභිනෙහි, මමපාය මිහාමිනි,
පච්චයෙහි මහාවීරො, සසංඝො ලොකනායකො,

උපට්ඨිතො මයා බුද්ධො, ගහෙත්වා රජ්ජසම්පදං,
ගතො ජේතවනං ගන්ත්වා, එතදග්ගෙ ඨපෙසි මං.

ජේතවනං දස්සනත්ථාය, යදා යාති විනායකො,
තිංසභික්ඛුසහස්සෙහි, සහ ලොකග්ගනායකො,

ලාභීනං සීවලී අග්ගො, මම සිස්සෙසු භික්ඛවො,
සබ්බලොකහිතො සත්ථා, කිත්තයී පරිසාසු මං.

කිලෙසා ඣාපිතා මය්හං, භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා, විහරාමි අනාසවො.

ස්වාගතං වත මෙ ආසි, බුද්ධසෙට්ඨස්ස සන්තිකං,
තිස්සො විජ්ජා අනුප්පත්තා, කතං බුද්ධස්ස සාසනං.

පටිසම්භිදා චතස්සො ච, විමොක්ඛාපි ච අට්ඨ මෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා, කතං බුද්ධස්ස සාසනං.

බුද්ධපුත්තො මහාථෙරො, සීවලී ජිනසාවකො,
උග්ගතෙජො මහාවීරො, තෙජසා ජිනසාසනං.

රක්ඛන්තො සීලතෙජෙන, ධනවන්තො යසස්සිනො,
එවං තෙජා'නුභාවෙන, සදා රක්ඛතු සීවලී.

කප්පට්ඨායී'ති බුද්ධස්ස, බොධිමූලෙ නිසීදිය,
මාරසෙනප්පමද්දන්තො, සදා රක්ඛතු සීවලී.

දසපාරමිතං පත්තො, පබ්බජි ජිනසාසනෙ,
ගොතම සක්‍යපුත්තො'සි, ථෙරෙන මම සීවලී.

මහාසාවකා අසීතිංසු, පුඤ්ඤතෙජො යසස්සිනො,
සබ්බෙභාගලාභීසු, උත්තමො තෙන සීවලී.

එවං අචින්තියා බුද්ධා බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං, විපාකො හොති අචින්තියො.

තෙසං සච්චෙන සීලෙන, ඛන්තිමෙත්තබලෙන ච,
තෙපි මං අනුරක්ඛන්තු සබ්බදුක්ඛවිනාසනං.

තෙසං සච්චෙන සීලෙන, ඛන්තිමෙත්තබලෙන ච,
තෙපි මං අනුරක්ඛන්තු සබ්බභයවිනාසනං.

තෙසං සච්චෙන සීලෙන, ඛන්තිමෙත්තබලෙන ච,
තෙපි මං අනුරක්ඛන්තු සබ්බරෝගවිනාසනං.

(මේ පිරිත භාවිත කිරීමෙන් වෙළඳාම ආදියෙන් ලාභ ද ආහාරපානාදිය සුලභ ද වේ. රජ සොර සතුරු භය සහ අන්‍යදෙසින් හටගන්නා අනතුරු ද දුරු වේ. මෙහි "මේ" යන තැනට "තෙ" තියා ද, "මං" යන තැනට "තුවං" තියා ද අනුන් සඳහා කියන විට යෙදිය යුතුය.)

## 27. සීවලී දැහැන.

නමෝ සිද්ධ සීවලී රාජා පරිචියා සබ්බතොමෙව ආකාසෙ උදකෙ තෙවී පංසුං භස්සං නම්පි සාරෙමි සබ්බලාභා උපෙන්තු මේ.

නමෝ බොධිසද්දිසස්සති තෙජ් පියදස්සති නමඃ

පදුමුත්තරො නාම ජිනො, සබ්බධම්මෙසු චක්ඛුමා, ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො සීලං තස්ස අසඞ්ඛෙය්‍යං, සමාධිවජිරූපමො, අසංඛියං ඤාණවරං විමුත්ති ච අනූපමා, මනුජාමර නාගානං, බ්‍රහ්මානං ච සමාගමෙ

නමාමිහං මහාලාභිං, සීවලී නාම අරහන්තං, තස්ස තෙජෙන සබ්බලාභා උපෙන්තු මේ

සීවලී ච මහාථෙරො, යො'රහො පච්චයාදිනං, තිලිජාන සිඛෝභායං මහා ආ. උ උම්මතා ආ. සබ්බජනා බහුජනා.

පියො දෙවමනුස්සානං, පියො බ්‍රහ්මානමුත්තමො, පියො නාගසුපණ්ණානං, පීණින්ද්‍රියං නමාමහං, නාසංසීමෝ ච මේ සියං නානාපාලිහි සදඤ්ජලිං, සදෙවමනු සසඞ්ඝ පූජිතං සබ්බලාභා උපෙන්තු මේ

නමෝ පෙරසැහති සො නාම කිං මේ සුතං එතං සබ්බනේති සීවලි තෙජානං එවං සීවලී නමඃ

සම්මාසම්බුද්ධහම්මසෝතිණෙණසා, ධම්මං දෙසෙති නායකො, සසාවකං මහාලාභිං, ලාභසඤ්ඤවිනානං ඥාණිධිරං, එපෙසි එකදගගමිහි, අවියාදු විසාරදං, තදහං බනිහියො ආපිං, නාගරෙ හංසවතියනයෙ.

නමෝ ජාති ජලාගාර පිසඳාන ආකාස අසනතිං එ ඊවිදහනකි යසස පෙරසස තෙ එයනෙ නමඃ

සුතවා ජිනසස තං වාකයං, සාවසසස ගුණං බිනං, නිමිනානයිරවා යනනාහං, කොඒසිපවා සභාවනං, මිතාදහං දදිපවාන, තං ධානමභිපසපයිං, කද මං විනානං පාදෙ දිස්වාන පරියායනො, සො සරෙන මහාවීරො, ඉදං වචනමබ්‍රවී, තතො ජිනසස වචනං සොතුකාමා මහාජනා, දෙවදානවගන්ධබ්බා, බ්‍රහ්මානො ච මහිද්ධිකා.

නමෝ තෙජං ලොකසෙට්ඨං නරාසභං එතං ඉතෙජන යෙට්ඨං නරාහතිං තෙජ නමඃ

සම්බුද්ධආසි නමස්සිංසු සකාංජලි, නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම, අනෙනයෙන මහාදෙන. දිනනං සකායානසං විසොසා, සොතුකාමා ඵලං තයස, ඵාසකරොති මහාමුනෙ.

නමෝ ශ්‍රී බුද්ධ ජය ජය ඒ සවාහා

නමෝ පෙරසස යනො හොති යසස යනතා පියායාති යසස යනති නමෝ නමඃ

ලාභීනං සීවලී අග්ගො මම සිස්සො හිනබ්බවො
සබ්බලොකහිතො පත්ථා, තිනනයි පරිභාසු මං

රෙවතං දසනත්ථාය, යද යාති විනායකො,
තිංස භික්ඛුසහස්සෙහි, සහලොකගගනායකො

නමෝ සර්වාපකාරයානි තෙසං භගවතො ඉති රාජහංස සො නමඃ. නමෝ භව භව සර්වසිද්ධිකාරණාය සහස්‍රකොටිබ්‍රහ්මනාය නබ්ජලොහං ඉති සාධනෙ නමඃ. නමෝ හන හන දහන ප්‍රසිව සිද්ධි සාධකාය ශුද්ධශ්‍රී සම්බන්ධනාය හනනමුඛ තෙ නමඃ. නමෝ තෙසං ඉති සඞ්ඝ ධරණං කොටි ප්‍රකොටි බන්ධනං සවිකං සදප්‍රහවිතො නමඃ නමෝ භුව භූව පුව සොග දක්ෂිණ උනු ප්‍රභූ සීවලී තෙ නමඃ, නමෝ හොගීඤාම හන්න ඡානහංස භගවතො නමෝ නමඃ. නමෝ සීවලී ප්‍රයකි නාපති අා රී ෆා ඒ ඕ වෙ න සො බනු ඉුවයින ධාරණායතෙ බඳු නිර්වාණ ප්‍රගලතෙ නමඃ

## 28. සීවලී යන්ත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | භයා | සුග | සං |
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | සම්ප | සුග | සං |
| විජ්ජා | සාං | මඥෝ | අරහං | තෙතා | තො | ඕදු |
| අරහං | සම | පරාදු | පලාකා | තිඤං | ථාන | යසා |
| විදූ | අයේ | මපත | යසර | නාග | ධාතී | දෙවිං |
| නාපදි | භගවා | අරහං | ධම්මිනු | ධම්මා | විඥං | ඉඩි |
| නාගතිලා | ගවිතා | නිමිත | මහාවී | සරන | ජෙන | සරහ |
| දේවා | ගමිග | රණ | විනති | නාථමා | සරණ | තෙප් |

## 29 උදේ සවස භාවිත කටයුතු සීවලී දැහැන

1. නමෝ සිද්ධ සීවලී රාජා පඨවියා සරක්ඛතොමෙව ආකාසෙ උදකෙන තෙජි සං හයසං තස්මි සාරෙම් සබ්බලාභා උපෙනතු මේ ~

2. නමෝමහං මහාලාභිං සීවලී නාම අරහතනං නයසා තෙජේන සබ්බලාභා උපෙනතු මේ ~

3. නමෝ ථෙරයස යතො හොති යසස යතතා පියායානි යසා පතති නමෝ නමඃ ~

4. නමෝ ථෙරයාතතියෝ නාම තිං මේ පූජං එතං ගණ්හතෙනි සිවලී තෙජානං එවං සීවලී නමඃ නවිසසතති නමඃ ~

5. නමෝ තෙජං ලොකෝත්තසෙට්ඨිං නරායසං, එතං තෙජේන සෙට්ඨිං නරාභාගිං තෙජ නමඃ ~

6. නමෝ භොගිසද්දියසනනි තෙජී සියදයසානි නමඃ ~

7. නමෝ ඝාති ඵලාගාර විසදනා ආකාස අහතතිංච විවිද හනති යසා ථෙරසස තෙ ජයතෙ නමඃ ~

8. බුද්ධං සිං සං සිද්ධිං නමෝ මුනි මුනි ශ්‍රී මුනි මුනි සවාහා ~

**(අනුන් සඳහා "මේ" යන්නට "තෙ" කියා යොදගත යුතුයි.)**

# 30 රතන යන්ත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1<br>යා ඉ ස ස | 2<br>නි ඥා<br>සභා රතා | 3<br>ධලි වට<br>ලම් | 4<br>තූ සෝ<br>දූ සතං | 5<br>කා ස ඝ<br>ත | 6<br>නී බෙඩ<br>සාදු රජා |
| 7<br>ස ඩ භා ඪ | 8<br>ඕන ගු සි භා | 9<br>ශ සා සං<br>නු | 10<br>සා ඳු ත සි | 11<br>නි ම ස්ථා<br>යා | 12<br>ගු කා ගි ප |
| 13<br>මිශ්‍රා ග ගු<br>ජා | 14<br>නි ට සා ය | 15<br>වාතතු නී | 16<br>යා ඇ පා | 17<br>නි යෝ වම | 18<br>ව මි ර |

කොටු 18 ක් වන සේ ඇඳ සූත්‍රයේ මුල ගාථාව පටන් එක ගාථාවක් එක කොටුවකට එන සේ ගාථා 18 කොටු දහ අටේ ලිවීම සාමාන්‍ය සිරිතයි. කොටු 16 කට බෙදා ප්‍රස්තාරක්‍රමයෙන් ලියන ක්‍රමයක් ද ඇත. එය යන්ත්‍රශාස්ත්‍රය දන්නකු විසින් කළ යුතුයි. මෙහි දක්වා ඇත්තේ ඒ දෙකට ම වෙනස් ක්‍රමයකි. මෙහි ද කොටු 18 කි. මුල ගාථාව පටන් සියලු ගාථාවල අකුර බැගින් එම කොටුවල ලිවීම මෙහි ක්‍රමය යි. මේ සටහනේ මුල ගාථා දෙක පමණක් යොදා ඇත. අනෙක් ගාථාත් මෙසේ ම ලිය යුතු යි. මෙහි ඇති වටනය නම් හැම ගාථාවකම අකුරු මාරුවී කොටු දහ අටේ පිරී සිටීම යි. මෙය ද පුරාතන ක්‍රමයකි. මුලගාථාවේ 'ය' යන්න මුල කොටුවේ ද "නී" යන්න දෙවන කොටුවේ ද යනාදී ක්‍රමය මෙහි ඇත. මුල ගාථාව නිම වූ පසු දෙවන ගාථාව ද ඊළඟ ගාථා ද ලියන්නේ ද මෙසේ මයි.

මෙම යන්ත්‍රය පිරිසිදු ව රන් තහඩුවක හෝ රිදී තහඩුවක හෝ තඹ තහඩුවක හෝ භූස්කොළයක ලියා ගෙයි ගොම පිරිබඩලා උළුවියන් බැඳ රතන සූත්‍රයෙන් 1000 වරක් ජප කර බැඳීම් සියලු අමනුෂ්‍ය දෝෂවලට ද, දරුවන්ට පැමිණෙන බාලග්‍රහ දෝෂවලට ද, ස්ත්‍රීන්ට පැමිණෙන අමනුෂ්‍ය දෝෂවලට ද, ග්‍රහ දෝෂවලට ද, නපුරු ස්වප්නවලටද සියලු ආරක්ෂාදියට ද සුදුසුය.

## 31. නවගුණ යන්ත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉ | ති | ථි | වා | පි | ග | සෝ |
| ත්ථා | ත්ත | ස | ද්ධෝ | රි | වි | භ |
| ස | නු | නෝ | රෝ | සු | ර | භ |
| දේ | ම්ප | දූ | ක | න්න | ජ්ජා | ද්ධෝ |
| ම්මා | රි | ලෝ | වි | ග | සා | ග |
| ව | ස | අ | තෝ | භ | ච | බු |
| ස | ස | ණ | ද | ර | ම්ම | වා |
| ම් | හං | නු | ර | ස්සා | අ | නං |

මෙම යන්ත්‍රය මෙහි පෙනෙන ආකාරයට රන් තහඩුවක හෝ රිදී තහඩුවක හෝ තඹ තහඩුවක දූපකොළයක ලියා 'ඉතිපිසෝ' යනාදී ගාථාවෙන් 108 වරක් ජප කර ළදරුවන්ට පැළඳවීමෙන් සියලු ග්‍රහදෝෂ, යක්ෂ ප්‍රේත ආදී දෝෂ නිවාරණය වේ. වැඩිහිටි සියලුදෙනාගේ ආරක්ෂාවට ද සුදුසුය. අටවිසි පිරිතෙන් ද ජප කළහැකිය.

## 32. ජලනන්දන යන්ත්‍රය



මේ යන්ත්‍රය තඹ කොළයක ඇඳගෙන අභිසම්භිදන යන්ත්‍රවිධියට දැක්වූ පරිද්දෙන් ජප කරගත යුතුයි. ජප කිරීම මෙහි අන් තැනෙක පළවී ඇති අංක 14 දරන ජලනන්දන පිරිතෙනි. සියලු සුබ කටයුතු සඳහා යහපති. නරක වැඩ සඳහා යෙදුව හොත් විපත් සිදු වේ. මහත් ආනුභාව ඇති ජලනන්දන පිරිත මෙන්ම මෙය ද බොහෝ ආනුභාව ඇත්තේය.

# 33. අභිසම්භිදානෙ මන්ත්‍ර හා යන්ත්‍ර

1. නමෝ අභිසම්භිදානෙ ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
2. නමෝ සම්මාසම්බුද්ධෝ ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
3. නමෝ පච්චේක සම්බුද්ධෝ ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
4. නමෝ සාරිපුත්ත මොග්ගල්ලානෙ ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
5. නමෝ අඞ්ගුලිමාල මහාථෙරෝ මහාවීරෝ මහාබලෝ ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
6. නමෝ සීවලී ච මහාථෙරෝ මහාකායෝ මහාලාභී ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.
7. නමෝ සත්තතිංස බෝධිපක්ඛිය ධම්මා චත්තාරෝ සතිපට්ඨානා චත්තාරෝ ඉද්ධිපාද චත්තාරෝ සම්මප්පධානා පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්තබොජ්ඣඞ්ගානි අරියෝ අට්ඨඞ්ගිකො මග්ගො බුද්ධමන්තං ච මන්තං ධම්මමන්තං ච මන්තං සඞ්ඝ මන්තං ච මන්තං .............................. නාමස්ස සබ්බරෝග සබ්බදෝස සබ්බන්තරායා විනස්සන්තු ධූපෙන ධූපෙන පජ්ජලති පජ්ජලති තීහුං තීහුං ධූහු ධූහු පරමේස්වාහා.

ආරක්ෂාදිය සඳහා මේ මන්ත්‍රවලින් ජප කිරීම යහපත්ය. පිරිසිදු රත්නැඹිලි තෙල් ජප කොට රන් පූරයෙක ලා පැළඳීමෙන් ආරක්ෂාව ද ජය ද ලැබේ. බාලගිරිදෝෂයට තාපුරු උණ රෝගාදියට තාපුරු සිහින දැකීමට විශේෂයෙන් ස්වප්න මෝචනයට ඇස්වහ ආදී දෝෂවලට තෙල් හෝ ජලය ජප කොට ආරක්ෂා කිරීම යහපති. භූතදෝෂ වැළැක්මට මේ මන්ත්‍රවලින් පොල්තෙල් ජප කොට උදේ සවස පහන් දැල්වීම යෝග්‍යය. පිරිවානා ගල් ආදී ද්‍රව්‍ය ජප කොට ගෙවත්තේ සතරකොනෙන් වැළලීම ද යහපති. 7 වන මන්ත්‍රයේ "............ නාමස්ස" යන තැන්හි තිත් යොදා ඇති තැන ආතුරයා ගේ නම යෙදිය යුතුයි. ස්ත්‍රියක පදහා නම් "නාමස්ස" යන්න "නාමිකාය" කියා යොදා ගතයුතුයි.

## යන්ත්‍රය - අංක 1




රන් හෝ තඹ කොළයක් ගෙන මේ සටහන අනුව ඇඳගත යුතුයි. පළල මෙන් 3 ගුණයක් හෝ 5 ගුණයක් හෝ 7 ගුණයක් හෝ දිග විය යුතුයි. කොන් සම වන්නට ගත යුතුයි. කොන් විෂම වීම දෙස් සහිතයි. යන්ත්‍රයේ 1 දරන කොටුවේ 1 දරන මන්ත්‍රය ලිවිය යුතුයි. අනික් කොටුවලත් එසේ ය. නම යෙදීම පෙර සඳහන් කළ ලෙසය. අකුරු නො වරදවා අකුරෙකින් අකුරක් නො නැසෙන සේ ලිවිය යුතුයි. බැඳි අකුරු බැඳ ම ලිවිය යුතු යි. 108 වරක් වත් ජප කළ යුතුයි. දහස්, දසදහස්, ලක්ෂ වාරය යනාදි ක්‍රමයට ජප කිරීම වඩා ගුණදායකයි. වාරගණන වැඩි වූ තරමට යහපති. ජපකිරීම අවසානයේ දී ජය පිරිත, බොජ්ඣංග පිරිත, අටවිසි පිරිත, ගිනි පිරිත, ජයමංගලගාථා, මහා ජයමංගලගාථා ආදී සෙත් පිරිත් එකෙකින් හෝ කීපයෙකින් ජප කළ යුතු යි. දසදහස්වරක් යන්ත්‍රය ජප කරනු ලැබේ නම් සෙත් පිරිත් ජපය 500 වර බැගින් වත් විය යුතුයි. යන්ත්‍රයේ ඇතුළ පිට නූල් දෙකේ ගැට 14 යි. ඒ එක එක ගැටයට සෙත් පිරිත් වලින් යට කී පරිදි සුදුසු වාර ගණනක් ජප කිරීම සුදුසුය. කස්තූරිගෝරෝචන වලින් පලිප්පු කළ යුතුයි. සුදු හඳුන් රත්හඳුන්, දේවදාර, අගිල්, ගුගුල්, සුවඳකොට්ටම්, ජටාමාංස, හැවැන්දරා විෂ්ණුක්‍රාන්ති, සාම්බ්‍රානි සඳුන් ලාටු යන ද්‍රව්‍ය එකතරමට ගෙන කුඩු කර ධූපය සාදගෙන ජප කරන විට ඒ දුම් යන්ත්‍රයට ඇල්ලිය යුතුයි.

## යන්ත්‍රය අංක 2




මේ යන්ත්‍ර සටහනේ කොටු 7ක් ඇති නමුත් අංක 9 ක් ඇත. ඒ අනුව මූල මන්ත්‍ර තුනේත් 9 වැන්නෙත් වෙනසක් නැත. 4 ට "නමෝ ආනන්දථෙරෝ" යන්න ද 5 වැන්නට "නමෝ කස්සපමහාථෙරෝ" යන්න ද 6 ට "නමෝ සීවලී මහාථෙරෝ" යන්න ද 7ට "නමෝ සාරිපුත්ත මොග්ගල්ලානා" යන්න ද 8 ට "නමෝ අඞ්ගුලිමාල මහාථෙරෝ" යන්න ද මුල් කොට ගනිති. එබැවින් මේ යන්ත්‍රය ලියන විට 2-3 දරන කොටුවේ 2-3 දරන මන්ත්‍ර දෙක ද 5-6 කොටුවේ 5-6 දරන මන්ත්‍ර දෙක ද ලිවිය යුතුය. ලිවීම ජප කිරීම ආදිය පෙර පරිද්දෙනි.

## 34. පිරිත් සූත්‍ර සජ්ඣායනා කරන විට මුලින් කියන ගාථා

ඒ ඒ පිරිත් සූත්‍ර කීම ආරම්භ කරන විට මුලට කියන ගාථා කොටසක් ද ඇත. ඒ මෙසේයි.

"නිබ්බානං ගුණසංයුත්තං යං දෙසෙසි මහාමුනි,
යං සුත්වා පටිපජ්ජන්තා, සබ්බදුක්ඛා පමුච්චති,
සබ්බලෝකහිතත්ථාය, පරිත්තං තං භණාමහෙ."

**(දසධම්ම සූත්‍රය)**

"යං මඞ්ගලං ද්වාදසසු, චින්තයිංසු සදේවකා
සොත්ථානං නාධිගච්ඡන්ති, අට්ඨතිංසඤ්ච මඞ්ගලං,
දෙසිතං දෙවදෙවේන, සබ්බපාපවිනාසනං,
සබ්බලෝකහිතත්ථාය, පරිත්තං තං භණාමහෙ."

**(මඞ්ගල සූත්‍රය)**

කොටිසතසහස්සෙසු, චක්කවාළෙසු දෙවතා,
යස්සාණං පටිග්ගණ්හන්ති, යං ච වෙසාලියං පුරෙ
රොගාමනුස්සදුබ්භික්ඛසම්භූතං තිවිධං භයං,
ඛිප්පමන්තරධාපෙසි, පරිත්තං තං භණාමහෙ."

(රතන සූත්‍රය)

"යස්සානුභාවතො යක්ඛා, නෙව දස්සෙන්ති භිංසනං,
යම්හි චෙවානුයුඤ්ජන්තො, රත්තින්දිවමතන්දිතො,
සුඛං සුපති සුත්තො ච, පාපං කිඤ්චි න පස්සති,
එවමාදිගුණූපෙතං, පරිත්තං තං භණාමහෙ."

(කරණීයමෙත්ත සූත්‍රය)

සබ්බාසීවිසජාතීනං, දිබ්බමන්තාගදං විය,
යං නාසෙසි විසං ඝොරං, සෙසඤ්චාපි පරිස්සයං,
ආණාක්ඛෙත්තම්හි සබ්බත්ථ, සබ්බදා සබ්බපාණිනං,
සබ්බසො'පි නිවාරෙති, පරිත්තං තං භණාමහෙ."

(ඛන්ධ පරිත්ත)

අග්ගික්ඛන්ධොපමං සුත්වා, ජාතසංවෙගභික්ඛුනං,
අස්සාදත්ථාය දෙසෙසි, යං පරිත්තං මහාමුනි,
සබ්බලොකහිතත්ථාය, පරිත්තං තං භණාමහෙ."

(මෙත්ත සූත්ත)

"පූරෙන්තො බොධිසම්භාරෙ, නාථො තෙමියජාතියං,
මිත්තානිසංසං යං ආහ, සුනන්දං නාම සාරථිං
සබ්බලොකහිතත්ථාය, පරිත්තං තං භණාමහෙ."

(මිත්තානිසංසය)

පූරෙන්තං බොධිසම්භාරෙ, නිබ්බත්තං මොරයොනියං
යෙන සංවිහිතාරක්ඛං, මහාසත්තං වනෙචරා,
චිරස්සං වායමන්තාපි, නෙව සක්ඛිංසු ගණ්හිතුං,
බ්‍රහ්මමන්තන්ති අක්ඛාතං, පරිත්තං තං භණාමහෙ."

(මොරපරිත්තය)

"රාහුනා ගහිතො චන්ද, මුත්තො යස්සානුභාවතො,
සබ්බවෙරිභයං නාසං, පරිත්තං තං භණාමහෙ."

(චන්දපරිත්ත)

"සූරියො රාහුගහිතො, මුත්තො යස්සානුභාවතො,
සබ්බභයවිනාසං නාසං, පරිත්තං තං භණාමහෙ."

(සූරියපරිත්ත)

"යස්සානුස්සරණේනා'පි, අන්තලික්ඛෙ'පි පාණිනො,
පතිට්ඨමධිගච්ඡන්ති, භූමියං විය සබ්බථා,
සබ්බූපද්දවජාලම්හා, යක්ඛචොරාදිසම්භවා,
ගණනා න ච මුත්තානං, පරිත්තං තං භණාමහෙ"

(ධජග්ගසූත්‍ර)

"යං මහාකස්සපත්ථෙරො, පරිත්තං මුනිසන්තිකා,
සුත්වා තස්මිං ඛණෙයෙව, අහොසි නිරුපද්දවො,
බොජ්ඣඞ්ගබලසංයුත්තං , පරිත්තං තං භණාමහෙ."

(මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ග)

"මොග්ගල්ලානො'පි ථෙරො යං, පරිත්තං මුනිසන්තිකා,
සුත්වා තස්මිං ඛණෙයෙව, අහොසි නිරුපද්දවො,
බොජ්ඣඞ්ගබලසංයුත්තං පරිත්තං , තං භණාමහෙ."

(මහා මොග්ගල්ලානත්ථෙරබොජ්ඣඞ්ග)

"භගවා ලොකනාථො' යං, චුන්දත්ථෙරස්ස සන්තිකා,
සුත්වා තස්මිං ඛණෙයෙව, අහොසි නිරුපද්දවො,
බොජ්ඣඞ්ගබලසංයුත්තං , පරිත්තං තං භණාමහෙ."

(මහාචුන්දත්ථෙරබොජ්ඣඞ්ග)

"ථෙරො යං ගිරිමානන්දො, ආනන්දත්ථෙරසන්තිකා,
සුත්වා තස්මිං ඛණෙයෙව, අහොසි නිරුපද්දවො,
දසසඤ්ඤානුපසංයුත්තං, පරිත්තං තං භණාමහෙ"

(ගිරිමානන්ද සූත්‍ර)

"පච්චෙකබුද්ධනාමානි, දෙසෙන්තො යං අදෙසයී,
අනන්තබලසංයුත්තං, පරිත්තං තං භණාමහෙ."

(ඉසිගිලි සූත්‍ර)

## 35. තිස්පෑ පිරිතක් අවසානයේ පසුද උදේ පිරිත අවසන් කිරීමේ දී පහත සඳහන් කොටස් සජ්ඣායනා කරති.

කරණීය මෙත්ථ කුසලෙන - පෙ - පුනරෙතීති,

යන්දුන්නිමිත්තං - පෙ -
බුද්ධානුභාවෙන - පෙ -
ධම්මානුභාවෙන - පෙ -
සංඝානුභාවෙන - පෙ -

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා - හොන්තු සබ්බෙපි පාණිනො

සබ්බෙ බුද්ධා බලප්පත්තා - පච්චෙකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තෙජෙන - රක්ඛං බන්ධාමි සබ්බසො

ජයාසන ගතා වීරා - ජෙත්වා මාරං සවාහිනිං
චතුසච්චා මතරසං - යෙ පිවිංසු නරාසභා

තණ්හංකරාදයො බුද්ධා - අට්ඨවීසති නායකා
සබ්බෙ පතිට්ඨිතා තුය්හං - මත්ථකෙ තෙ මුනිස්සරා

වන්දාමි චෙතියං සබ්බං - සබ්බ ඨානෙසු පතිට්ඨිතං
සාරීරික ධාතු මහා බොධිං - බුද්ධරූපං සකලං සදා

ඉමිනා පුඤ්ඤ කම්මෙන - උපජ්ඣායා ගුණුත්තරා
ආචරියූපකාරා ච - මාතා පිතා පියා මමං

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛම මෙ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත

ඕකාස ද්වාරත්තයෙන කතං සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ, ඕකාස වන්දාමි භන්තෙ.

## 36. චූල ජිනපඤ්ජර පිරිත

### (I)

දිසාසු දස භාගෙසු - ඨිතා බුද්ධා අනන්තකා
වෙරාපි අන්තරායාපි - විනස්සන්ති අසෙසතො
එවමාදි ගුණොපෙතං - පරිත්තං තං භණාමහෙ

පදුමුත්තරො පුරත්ථිමායං - අග්ගිම්හිවෙව රෙවතො
දක්ඛිණෙ කස්සපො බුද්ධො - නෙරුතෙ ච සුමංගලො

පච්ඡිමෙ ච සිඛී බුද්ධො - වායව්‍යා මෙධංකරො
උත්තරො පියදස්සී ච - ඊසානෙ දීපංකරො

පච්ඡිමො කකුසන්ධො ච - ආකාසෙ සරණංකරො
අච්චන්තරායා සබ්බෙ තෙ[1] - සොක රොග භයානි ච

විනස්සන්තු සදා තුය්හං[2] - සබ්බිරියා පරෙසු ච
යක්ඛාදි දෙවතානි ච - රාජ චොරොරි අග්ගිහි

අමනුස්සෙහි සබ්බෙහි - තිරච්ඡාන ගණෙහි ච
ජාතා උපද්දවා සබ්බෙ - විනස්සන්තු අසෙසතො

### (II)

සිරස්මිං තෙ[1] බුද්ධ සෙට්ඨො - සාරිපුත්තො ච දක්ඛිණෙ
වාමංසෙ මොග්ගල්ලානො - තෙ[1] පුරතො පිටකත්තයං

පච්ඡිමෙ තව[3] ආනන්දො - චතුද්දිසා ඛීණාසවා.
සමන්තා ලොකපාලා ච - ඉන්දදෙවා ච බ්‍රහ්ම ච
එතෙසං ආනුභාවෙන - සබ්බුපද්දවුපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තු අසෙසතො.

## 37. මත්ස්‍ය රාජ පිරිත

පුනා පරං යදා හොමි - මච්ඡරාජා මහා සරෙ
උණ්හෙ සූරිය සන්තාපෙ - සරෙ උදක ඛීයථ

තතො කාක ච ගිජ්ඣා ච - බකා කුලල සේනකා
භක්ඛන්ති දිවා රත්තිං - මච්ඡෙ උපනිසීදිය

එවං චින්තෙත සහංහාරං - සහසද්දාගීහි පීළිතො
සොතනුන්නො උපායෙන - කදාහි දුක්ඛා පමොචයෙ

විචින්තයිත්වා ධම්මිතත්ථං - සච්චං අද්දස පච්චයං
සච්චෙව ඨත්වා පමොචෙස්සං - කදාතීතං තං අතික්කමයං

අනුස්සරිත්වා සතං ධම්මං - පරිමිත්තං විචින්තයං
ආකාසි සච්ච කිරියං - ලොක ධුව සච්චතං

යතො සරාමි අත්තානං - යතො පත්තොස්මි විඤ්ඤුතං
නාභිජානාමි සංචිච්ච - එකපාණම්පි හිංසිතං

එතෙන සච්ච වජ්ජෙන - පජ්ජුන්නො අභිවස්සතු
අභිත්ථනය පජ්ජුන්න - නිධිං කාකස්ස නාසය
කාකං සොක පරෙත්ථෙහි - මච්ඡෙ සොකා පමොචය

සහකතෙ සච්චවරෙ - පජ්ජුන්නො අභිගජ්ජිය
ථලං නින්නංච පූරෙන්තො - ඛණෙන අභිවස්සථ

එවං රූපං සච්චවරං - කත්වා විරිය මුත්තමං
වස්සාපෙසිං මහාමෙඝං - සච්චතෙජ බලස්සිතො
සච්චෙන මෙ සමො නත්ථි - එසා මෙ සච්ච පාරමී

## 38 දසමාර පිරිත

1. ඉති තදහය සෙනා ගච්ඡයං අසද්සද්මිස්සද්දං
විවිය විහඹ වාචං උග්ගිරන්තී රමිත්තී
සහස දූරිත වෙලා බග්ගරාසී වහන්තී
දූසිත ලලිත චිත්තා යුද්ධ සජ්ජා අසෙද්ධං

2. ඉති මුනි කකුසන්ධො දීපමාගම්ම මෙතං
වන පිට ජන සබ්බං නිබ්බුතිං පාපුනිත්වා
තදහනිය සිරි අම්බොධි සාඛං ච නෙත්වා
නිදහිය ගගනම්හා ජම්බුදීපා අගච්ඡි

3. එවම්පි කොණාගමනො මුනින්දො
දත්වා බහූනං ඵලමග්ගදානං
නෙත්වා තතො උදුම්බර බොධි සාඛං
සොපාගමාසී දූත ජම්බුදීපා

4. එවම්පි කස්සප ජිනො වරමණ්ඩදීපං
පත්තො වලග්ග රතනො බහුනො ජනස්ස
දත්වාන ආහිත තං වට බොධි සාඛං
රොපාපයිත්ව මිගමා පුනජම්බුදීපං

5. පාරොහ දන්තො විත කූට කුම්භො
ඝනෙන පොතත්ථ විරාජමානො
සොනිජ්ජරා සාර මදප්පවාහො
ධජො යථා භාති පුරාධිපස්ස

6. තස්මිං සමන්තනග මුද්ධනි ලොක නාථො
ජකිරණණ රංසිනිකරං දිසි පඝරන්තො
සිස්ථූති සො පරිඛිතො සරසාගරන්තො
ආලොකයං ධීනමිකාසි ඝනොපි විණ්ණමණො

7. ලංකාවධූ කුමිනකූට කිරිට කූට
සක්කෙහි නගස්ස ජිනරාජ මිණිවිහන්තො
ඤමිපීන්පදං සිවපදං පටිමන්ති ලොකො
නන්දාති ගො භජත සෙවිත සබ්බකාලං

8. දිවා විහාරං භගවා සසඞ්ඝො
කත්වාන තස්මිං පන තිසද්ධිකාලං
මහියමානො සදෙවකෙහි
තතො ගතො රොහණ අම්බරස්මා

9. තස්මිං සසඞ්ඝො මුනි දීඝවාපියං
ථූපාය ඨානෙ පරමාය භූමියං
ගරු කරොන්තො ජනතාං මහීතලෙ
නිරොධමාපජ්ජ නිසීදි උත්තමො

10. විහංග මානං ගරුළොව මජ්ඣෙ
මිගාන මජ්ඣෙ පරමොව සීහො
මහා යසො මාර බලස්ස මජ්ඣෙ
වියාරදො වීත භයො නිසීදි

11. සබ්බන්තමද මොහෙන නාලාගිරිං මහාගජං
වෙරස්සාරො දෙවදත්ත මෙකලා ගිරිනූපසංහජං

12. චිරන්න මද වෙගෙන නාලාගිරි කරිස්සරං
මෙත්තා සද්ධානුභාවෙන සම්බුද්ධොනිම්මදං අකා

1. **අමනුෂ්‍ය උපද්‍රවවලට** - 108 වරක් මතුරා තෙල් ගාන්න. 108 වරක් මතුරා නූල් බඳින්න.

2. **ගෘහ ආරක්ෂාවට** - මේ පිරිතෙන් වැලි-ගල් පයිලෝ, නූල්, වතුර මතුරා පිරිත් කොට ගෙයි සතර කොනේත්, වත්තේ අට කොනේත් සතුන් බඳින්නට පෙරාතුව වල දමන්න. සම්පූර්ණ ආරක්ෂාව ලැබේ.

3. **උණට** - නොබසින උණට 108 බැගින් තුන් වරක් තෙල් මතුරන්න, නූල් මතුරා බඳින්න.

4. **සුව නොවන බඩේ අජීර්ණයට** - දෙහි ඉඟුරු - සුදුළූණු 108 වර බැගින් මතුරා තුන්වරක් කෑමට දෙන්න.

## 39 උණ රෝගයෙන් පෙළෙන්නවුන්ට කියන ජ්වර පිරිත

1. තණ්හංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්තං උපාගමී
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

2. මෙධංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්තං උපාගමී
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

3. සරණංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්තං උපාගමී
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

4. දීපංකරො නාමජිනො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

5. කොණ්ඩඤ්ඤො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

6. මංගලො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

7. සුමනො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

8. රෙවතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

9. සොභිතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

10. අනොමදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

11. පදුමො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

12. නාරදො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

13. පදුමුත්තරො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

14. සුමෙධො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
15. සුජාතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
16. පියදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
17. අත්ථදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
18. ධම්මදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
19. සිද්ධත්ථො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
20. තිස්සො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
21. ඵුස්සො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
22. විපස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
23. සිඛී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
24. වෙස්සභූ නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
25. කකුසන්ධො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
26. කොණාගමනො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
27. කස්සපො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
28. ගොතමො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

මේ පිරිතෙන් උණ රෝගීනට නූල් බැඳීමට, කසාය මැතිරීම හා ගුණ ලැබීම සඳහා දිනකට තුන් වරක් පිරිත් කීමට ද යොග්‍යයයි.

## 40. අමනුෂ්‍ය උපද්‍රව වළකා දේවාශීර්වාදය ලැබීමට දිනපතා භාවිතා කළ යුතු ආටානාටිය පිරිත

1. අප්පසන්නෙහි නාථස්ස - සාසනෙ සාධු සම්මතෙ
අමනුස්සෙහි චණ්ඩෙහි - සදා කිබ්බිස කාරිභි

2. විපස්සිස්ස ච නමත්ථු - චක්ඛුමන්තස්ස සිරීමතො
සිඛිස්ස පි ච නමත්ථු - සබ්බ භූතානුකම්පිනො

3. වෙස්සභුස්ස නමත්ථු - නහාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස - මාරසෙනා පමද්දිනො

4. කොණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධි

5. අංගීරසස්ස නමත්ථු - සක්‍යපුත්තස්ස සිරීමතො
යො ඉමං ධම්මං අදෙසෙසි - සබ්බදුක්ඛාපනූදනං

6. යෙ චාපි නිබ්බුතා ලොකෙ - යථාභූතං විපස්සිසුං
තෙ ජනා අපිසුණා - මහන්තා වීතසාරදා

7. හිතං දෙව මනුස්සානං - යං නමස්සන්ති ගොතමං
විජ්ජාචරණ සම්පන්නං - මහන්තං වීතසාරදං

8. එතෙ චඤ්ඤෙ ච සම්බුද්ධා - අනෙකසත කොටියො
සබ්බෙ බුද්ධා සමාසමා - සබ්බෙ බුද්ධා මහිද්ධිකා

9. සබ්බෙ දසබලූපෙතා - වෙසාරජ්ජෙහුපාගතා
සබ්බෙ තෙ පටිජානන්ති - ආසභං ඨාන මුත්තමං

10. සීහනාදං නදන්තෙ තෙ - පරිසාසු විසාරදා
බ්‍රහ්මචක්කං පවත්තෙන්ති - ලොකෙ අප්පටිවත්තියං

11. උපෙතා බුද්ධධම්මෙහි - අට්ඨාරසහි නායකා
බාත්තිංස ලක්ඛණූපෙතා එතෙ - සබ්බෙ ඛීණාසවාජිනා

12. ව්‍යාමප්පභාය සුප්පභා - සබ්බෙ තෙ මුනිකුඤ්ජරා
බුද්ධා සබ්බඤ්ඤුනො එතෙ - සබ්බෙ ඛීණාසවාජිනා

13. මහාපභා මහා තෙජා - මහා පඤ්ඤා මහබ්බලා
මහා කාරුණිකා ධීරා - සබ්බෙසානං සුඛාවහා

14. දීපා නාථා පතිට්ඨා ච - තාණා ලෙණා ච පාණිනං
ගතිබන්ධූ මහෙස්සාසා - සරණා ච හිතෙසිනො

15. සදෙවකස්ස ලොකස්ස - සබ්බෙ එතෙ පරායණා
තෙසාහං සිරසා පාදෙ - වන්දාමි පුරිසුත්තමෙ

16. වචසා මනසා චෙව - වන්දාමෙතෙ තථාගතෙ
සයනෙ ආසනෙ ඨානෙ - ගමනෙචාපි සබ්බදා

17. සදා සුඛෙන රක්ඛන්තු - බුද්ධා සන්තිකරා (මමං)
තෙහි (අහං) රක්ඛිතො සන්තො - මුත්තො සබ්බභයෙහි ච

18. සබ්බරොගො විනිමුත්තො - සබ්බසන්තාප වජ්ජිතො
සබ්බ වෙර මතික්කන්තො - නිබ්බුතො ච (භවාමහං)

19. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

20. පුරත්ථිමස්මිං දිසාභාගෙ - සන්ති භූතා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

21. දක්ඛිණස්මිං දිසාභාගෙ - සන්ති දෙවා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

22. පච්ඡිමස්මිං දිසාභාගෙ - සන්ති නාගා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු ආරොග්‍යෙන සුඛෙන ච

23. උත්තරස්මිං දිසාභාගෙ - සන්ති යක්ඛා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

24. පුරත්ථිමෙන ධතරට්ඨො - දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො - කුවෙරො උත්තරං දිසං

25. චත්තාරො තෙ මහාරාජා - ලොකපාලා යසස්සිනො
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු ආරොග්‍යෙන සුඛෙන ච

26. ආකාසට්ඨා ච භූම්මට්ඨා දෙවා නාගා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු ආරොග්‍යෙන සුඛෙන ච

27. ඉද්ධිමන්තො ච යෙ දෙවා - වසන්තා ඉධ සාසනෙ
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

28. සබ්බීතියො විවජ්ජන්තු - සොකො රොගො විනස්සතු
මා (මෙ) භවත්වන්තරායො - සුඛී දීඝායුකො (භව)

29. අභිවාදන සීලිස්ස - නිච්චං වුද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං

මේ පිරිතෙන් ගත හැකි ප්‍රයෝජන මෙසේ යි.
මේ පිරිත භාවිතා කරන්නාට අමනුෂ්‍යයන්ගෙන් කරදර ඇති නොවේ. දෙවියන්ගේ ආරක්ෂාව ද ලැබේ.

## 41. අමනුෂ්‍ය උපද්‍රව වැලකීම හා දේවාශිර්වාද ලැබීමට උදේ සවස භාවිත කළ යුතු ආරක්ෂක ගාථා

බුද්ධං සුද්ධං ගුණාකරං දය බලං - දෙවාති දෙවං ජිනං
ධම්මං දෙසිත සුදෙසිතං සිවපදං - දුක්ඛා පහං නිම්මලං
සංඝං වාජිතිරංගතං ශුචිභූතං - වන්දා මිහං බුද්ධිනා
බුද්ධයො ධම්ම ගතගුණා තථාගත වරො - පාලෙන්තු තෙ (මං) සදා

පඨවි තල සුන්දරී - සබ්බඤ්ඤු බොධි මණ්ඩලං
අසංඛෙය්‍යං මාර සෙනං - ජයො ජයතු මංගලං

කකුසන්ධො කොණාගමනො - කස්සපො ගොතමො මුනි
මෙත්තෙය්‍යො පඤ්ච බුද්ධා තෙ - සීසෙ (මෙ) සෙන්තු සබ්බදා

එතෙසං ආනුභාවෙන - සබ්බා දෙවා මහිද්ධිකා
තෙ සබ්බෙ සුඛිතා හොන්තු - මම ජීවිතා සහායකා

සම්බුද්ධෙ අට්ඨවීසං ච - ද්වාදසං ච සහස්සකං
පඤ්චසත සහස්සානි - නමාමි සිරසා අහං

එතෙසං ධම්මඤ්ච සංඝඤ්ච - සබ්බෙ පච්චෙක සම්බුද්ධෙ
බොධිරාජෙ ච සබ්බසො - යාදරෙන නමා මිහං

නමක්කාරෙනු භාවෙන - සබ්බෙ භයා උපද්දවා
අනෙකා අන්තරායාපි - විනස්සන්තු අසෙසතො

## (42). සුබ ගමන් පිටත් වීමේදී කියන රත්නමාලා බන්ධන ගාථා

සං සාර සාගරෙය විනිත ණියං
සං තීන සාතං දුවිසාර ධියං
වං ධීරසං ජොතණ්ණ කනු පලායං
වං ලොක දෙසිං පණමෙමි යායං

පං යාතිගං කෙවල මොන නායං
සං නානක මාර රණෙ විජෙසං
සං සේවිතං දායි මුදාර භාසං
සං භාර ධම්මං පණමෙ සදාසං

සං ද්‍රාසගං නාසිත පාප නාසං
සං තාප ධංසිං හත ඝෝර පාසං
සං පාර ගාමිං ධුවසාර වාසං
සං වාර සංඝං පණමේ රසාපං

## 43 ආරක්ෂාව සඳහා කියන ජත්ත මානවක ගාථා

යෝ වදතං පවරෝ මනුජේසු - සක්‍යමුනී භගවා කතකිච්චෝ
පාරගතෝ බලවීරිය සමංගී - තං සුගතං සරණත්ථමුපේමි
රාග විරාග මනේජමසෝකං - ධම්මමසංඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං - ධම්මමිමං සරණත්ථමුපේමි
යත්ථ ච දින්න මහප්ඵලමාහු - චතූසු සුචීසු පුරිසයුගේසු
අට්ඨ ච පුග්ගල ධම්ම දසා තේ - සංඝමිමං සරණත්ථ මුපේමි.

## 44 පිරිත් පැන් දෙන විට, පිරිත් නූල් බඳින විට කියන ගාථාව

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානං ච යං බලං
අරහන්තානං ච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසෝ.

## 45 පිරිත් සජ්ඣායනයට පෙර දේවතාරාධනය කරණ ගාථාව

සග්ගේ කාමේ ච රූපේ ගිරි සිඛරතටේ චන්තලික්ඛේ විමානේ
දීපේ රට්ඨේ ච ගාමේ තරුවන ගහනේ ගේහ වත්ථුම්හි ඛෙත්තේ
භුම්මා චායන්තු දේවා ජලථල විසමේ යක්ඛ ගන්ධබ්බනාගා
තිට්ඨන්තා සන්තිකේ යං මුනිවරවචනං සාධවෝ මේ සුණන්තු

## 46. අභය පරිත්ත

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා - හොන්තු සබ්බෙ පි පාණිනෝ

එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

දානං දදන්තු සද්ධාය - සීලං රක්ඛන්තු සබ්බදා
භාවනාභිරතා හොන්තු - ගච්ඡන්තු දේවතාගතා

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසො

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

දෙවෝ වස්සතු කාලෙන - සස්ස සම්පත්ති හෝතු ච
ඵීතො භවතු ලොකෝ ච - රාජා භවතු ධම්මිකො.

## 47. සෙත් පිරිතේදී සජ්ඣායනා කරණ ජයමංගල ගාථා මහාමංගල සූත්‍රය හා රතන සූත්‍රයේ ගාථාවල අනුපිළිවෙළ නොවරදවා කීමට මතක තබා ගත යුතු පද්‍ය තුනක්

**ජයමංගල ගාථා සඳහා**

බා, මා, නා, උ, ක, ස, න, දු, ඒ, යන ගාථාවල මුල් අකුරු කටපාඩම්කර ගැනීම හෝ පහත සඳහන් පද්‍ය පාඩම් කර ගන්න

බාහුං, මාරා, නාලා, උක්ඛි,
කත්වා, සච්චං, නන්දෝ, දුග්ගා
ඒතා (වත්වා සොත්ථිං කත්වා
සේසා වන්තුං චිත්තේ තබ්බා)

**මංගල සූත්‍රය**

බහූ, අසේ, පති, බාහු, මාතා, දානං ච, ආරති,
ගාර, ඛන්ති, තපෝ, ඵුට්ඨ, ඒතා, (මංගල සුත්තිකා)

**රතන සූත්‍රය**

යානීධ, තස්මා හි, යංකිඤ්චි විත්තං,
ඛයං, (ච) යම්බුද්ධ, යෙ පුග්ගල, යෙසු,
යථින්ද, යෙ අරිය, සහා, (ච) කිඤ්චා,
වනප්ප ගුම්බෙ, (ච) වරෝ.., ඛීණං,

## 48 මහාජිනපඤ්ජරය

ජයාසනා ගතා වීරා - ජෙත්වා මාරං සවාහිනිං
චතු සච්චාමතරසං - යේ පිවිංසු නරාසභා

තණ්හංකරාදයෝ බුද්ධා - අට්ඨවීසති නායකා
සබ්බේ පතිට්ඨිතා මය්හං - මත්ථකෙ තෙ මුනිස්සරා

සිරේ පතිට්ඨිතා බුද්ධා - ධම්මො ච තව ලෝචනේ
සංඝෝ පතිට්ඨිතො මය්හං - උරේ සබ්බ ගුණාකරෝ

හදයේ අනුරුද්ධොච - සාරිපුත්තෝච දක්ඛිණේ
කොණ්ඩඤ්ඤො පිට්ඨි භාගස්මිං - මොග්ගල්ලානෝසි වාමකේ

දක්ඛිණේ සවණේ මය්හං - ආහුං ආනන්ද රාහුලා
කස්සපෝච මහානාමෝ - උභෝසුං වාම සෝතකේ

කේසන්තෙ පිට්ඨි භාගස්මිං - සූරියෝව පභංකරෝ
නිසින්නෝ සිරි සම්පන්නෝ - සෝභිතෝ මුනි පුංගවෝ

කුමාර කස්සපෝ නාම - මහේසී චිත්‍රවාදකෝ
සෝ මය්හං වදනේ නිච්චං - පතිට්ඨාසි ගුණාකරෝ

පුණ්ණෝ අංගුලිමාලෝ ච - උපාලී නන්ද සීවලී
ථෙරා පඤ්ච ඉමේ ජාතා - ලලාටේ තිලකා තව

සෙසාසීති මහා ථෙරා - විජිතා ජින සාවකා
ජලන්තා සීල තේජේන - අංගමංගේසු සණ්ඨිතා

රතනං පුරතෝ ආසි - දක්ඛිණේ මෙත්ත සුත්තකං
ධජග්ගං පච්ඡතෝ ආසි - වාමේ අංගුලිමාලකං

ඛන්ධ මෝර පරිත්තඤ්ච - ආටානාටිය සුත්තකං
ආකාසච්ඡදනං ආසි - සේසා පාකාර සණ්ඨිතා

ජිනාණාබල සංයුත්තේ - ධම්මප්පාකාර ලංකතේ
වසතො මෙ චතු කිච්චේන - සදා සම්බුද්ධ පඤ්ජරේ

වාත පිත්තාදි සඤ්ජාතා - බාහිරජ්ඣත්තුපද්දවා
අසේසා විලයං යන්තු - අනන්ත ගුණ තේජසා

ජින පඤ්ජර මජ්ඣට්ඨං - විහරන්තං මහීතලේ
සදා පාලෙන්තු මං සබ්බේ - තේ මහා පුරිසාසභා

ඉච්චේව මච්චන්ත කතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතූපද්දවෝ
බුද්ධානුභාවේන ජිතාරි සංඝෝ
චරාසි සද්ධම්මානුභාව පාලිතෝ

ධම්මානුභාවේන කියා දෙවන වර ද සංඝානුභාවේන කියා තෙවන වර ද කියන්න.

සද්ධම්මපාකාර පරික්ඛිත්තොසි
අට්ඨාරියා අට්ඨ දිසාසු හොන්ති
එත්ථන්තරේ අට්ඨනාථා භවන්ති
උද්ධං විතානංව ජිනා ඨිතා තේ

භින්දන්තෝ මාර සේනං තව සිරසිඨිතෝ
බෝධිමාරුය්හ සත්ථා
මොග්ගල්ලානෝසි වාමේ වසති භුජතටේ
දක්ඛිණේ සාරිපුත්තෝ
ධම්මෝ මජ්ඣේ උරස්මිං විහරති භවතෝ
මොක්ඛතෝ මෝරයෝනිං
සම්පත්තෝ බෝධිසත්තෝ
චරණ යුග ගතෝ භානුලෝකේන නාථෝ

සබ්බාවමංගල මුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝස මසේස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාව පවරේන පයාතු නාසං

ධම්මානුභාව පවරේන කියා දෙවන වර ද, සංඝානුභාව පවරේන කියා තෙවන වර ද කියන්න, තමන් සඳහා කියා ගන්නා විට තුය්හං වෙනුවට මය්හං යනුවෙන් ද, තව වෙනුවට මම යනුවෙන් ද, තේ වෙනුවට මේ යනුවෙන් ද, ත්වං වෙනුවට මං කියා ද, චරාසි වෙනුවට චරාමි කියා ද පරික්ඛිත්තොසි වෙනුවට පරික්ඛිත්තොස්මි කියා ද යොදා කියයුතුය.



# පුස්කොළ පොත්
# සම්ප්‍රදායානුකූලව මුද්‍රිත
# "පිරුවානා පොත් වහන්සේ"

- සුදු කඩදාසියෙහි පිංගල අකුරින් මුද්‍රිතය.
- අවුරුදු සිය ගණනක් විවිසිඳුව ආරක්ෂාකර තබා ගැනීමට තරම් සිව්වරක්ම වාර්නිෂ්කර ඇත. කම්බාර බණ වර පිටපත් දෙකකි. පිටු 236 කි.
- පොත් කම්බිය (පිටකවරය) රන් හා ඇතදළ පැහැති කැටයම් සහිත ෆයිබර් ග්ලාස් වලින් තනා ඇත.
- පරලොව සැපත් අයට පිං පිණිස පූජාකිරීම සඳහා පුණ්‍යානුමෝදනා පත්‍රයක් ද පොත අගට එක්කර ඇත.
- සෑම විහාරස්ථානයකම තිබිය යුතු අනගි පොතකි.
- බෞද්ධ නිවෙස්වල මල් පුදන තැනහි තැන්පත් කර තැබීමට ද යෝග්‍යය.

පාලි, සිංහල, ඉංග්‍රීසි, ජර්මන් භාෂාවලින් ලෝකයේ සෑම රටකම මුද්‍රිත බුද්ධ ධර්මය, බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය සම්බන්ධ පොත් අප ආයතනයෙන් ලබාගත හැකිය

දිවයින පුරා සංචාරය කරන අප ආයතනික "ධර්ම යාත්‍රා" රථයෙන් ද කැළණිය, බෙල්ලන්විල, කතරගම සහ කොළඹ කොටුව යන විහාරස්ථානයන්හි පිහිටුවා ඇති අප බෞද්ධ පොත්හල් වලින් ද ලබාගත හැකිය.

**බෞද්ධ පොත් හල**

**බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය**

**125, ඇන්ඩර්සන් පාර, නැදිමාල - දෙහිවල.**

ISBN 955 - 9219 - 16 - 2

මුද්‍රණය: සිස්ටමැටික් ප්‍රින්ටර්ස්
නො: 125/1, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහි